# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## වාර්ෂික වාර්තාව

## **2011**

## පටුන

**පිටු අංක**


1. හැඳින්වීම 01-04

1.1 වර්තමාන තත්ත්වය
1.2 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව
1.3 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් පිළිබඳ විස්තර

**2.** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් 04-14

2.1 දැක්ම
2.2 මෙහෙවර
2.3 අභිමතාර්ථ
2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් කාර්යභාරය
2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ව්‍යුහය
2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්පිළිබඳ තොරතුරු වල කෙටි පැතිකඩක්
2.7 2011 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සේවක තනතුරු සංයුතිය
2.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම
2.9 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම
2.10 දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (දි.ආ.ක.ස.ඒ.)
2.11 නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම
2.12 2011 වසරේදී හමු වූ අවස්ථා සහ බාධක පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

3. ජාතික මට්ටමේ ප්‍රධාන වැඩසටහන 15-19

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම
3.2 ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සංග්‍රහය
3.3 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම
3.4 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)
3.5 සංයුක්ත සැලැස්ම
3.6 කමිටු

3.6.1 තාක්ෂණික උපදේශන කමිටුව
3.6.2 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව
3.6.3 ජාතික ආපදා කළමනකාකරණ සම්බන්ධීකරණ කමිටුව (ජා.ආ.ක.ස.ක.)

3.7 "දැයට කිරුළ" ප්‍රදර්ශනය
3.8 ජාතික ආරක්ෂිත දිනය - 2011
3.9 ව්‍යසන අවදානම දුරලීම පිළිබඳ ජාතික සම්මේලනය

4. ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය 20-25

4.1 පසුබිම
4.2 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

4.2.1 ශ්‍රී ලංකාවේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

4.2.2 අම්පාර, මඩකලපුව, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘති
4.2.3 නුවර, මාතලේ, බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුළ නාය යෑම් සහ කඳු කඩා වැටීම් පිළිබඳ අවදානම වැඩි ප්‍රදේශවල බෑවුම් ස්ථායීකරණය

4.3 අවදානම් තත්ව තොරතුරු සංග්‍රහයක් නිර්මාණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

4.3.1 වෙරළ උවදුරු සිතියම් ව්‍යාපෘතිය
4.3.2 නායයෑම් උවදුරු සිතියම් සැකසීම
4.3.3 නියං උවදුරු සිතියම් සකස් කිරීම
4.3.4 සුළිසුළං උවදුරු සිතියම් සකස් කිරීම
4.3.5 ජල ගැලීම් උවදුරු සිතියම් සකස් කිරීම

4.4 ව්‍යසන සිතියම් සකස් කිරීම සඳහා චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගැනීම

5. පෙර සූදානම් සැලසුම් අංශය 25-31

5.1 පෙර සූදානම් සැලසුම් අංශය
5.2 ව්‍යසන වලදී ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම.

5.2.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම්
5.2.2 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පෙර සූදානම් සැලසුම්
5.2.3 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පෙරහුරු වැඩසටහන්
5.2.4 විශාල ජලාශ වේලි හා සම්බන්ධ ව්‍යසන වලදී පෙර සූදානම් කටයුතු
5.2.5 පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන සහ සුනාමි ව්‍යසනයකදී පාසල් ප්‍රජාව ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම පිළිබඳ පෙරහුර වැඩසටහන

5.3 ව්‍යසන ඇතිවීමට නැඹුරුතාවයක් සහිත ප්‍රදේශවල ව්‍යසන ප්‍රතිචාර ශක්‍යතාවය වැඩි දියුණු කිරීම / උපකරණ මිලදී ගැනීම

6. දැනුවත් කිරීමේ අංශය 31-35

6.1 අන්තර්ජාතික සම්මේලන / වැඩමුළු

6.1.1 ව්‍යසන පිටුදැකීම පිළිබඳ ආසියානු සම්මේලනය
6.1.2 සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව (සි.වි.ප.)
6.1.3 ශ්‍රී ලංකාව තුළ නගර ප්‍රත්‍යස්ථතා වැඩසටහන ආරම්භ කිරීම

6.2 ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්

6.2.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයෙහි ශක්‍යතා වර්ධනය

6.2.2 පාර්ශ්වකාර ආයතනවල ශක්‍යතා වර්ධනය
6.2.3 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන

7. හදිසි අවස්ථා මෙහෙයුම් අංශය 35-42

7.1 හැඳින්වීම
7.2 හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය
7.3 හදිසි අවස්ථා මෙහෙයුම් සඳහා සම්පත් ලබා දීම
7.4 හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු

7.4.1 ජල ගැලීම්
7.4.2 නාය යාම්
7.4.3 නාගරික ප්‍රදේශ වල සහ වනාන්තර වල ඇති වන ගිනි
7.4.4 ප්‍රබල සුළං තත්ත්වයන්

7.5 පූර්ව අනතුරු ඇඟවීම් තොරතුරු බෙදා හැරීම සහ සන්නිවේදනය
7.6 ව්‍යසන අවස්ථාවේදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාමේ පෙරහුරු වැඩසටහන්
7.7 ආරක්ෂිත ස්ථාන කරා ජනතාව යොමු කරවීම සහ මුදවා ගැනීමේ සෝදිසි මෙහෙයුම් සඳහා හමුදා සහාය
7.8 ආපදා තොරතුරු දත්ත පදනම (ඩිස්ඉන්වෙන්ටර්)
7.9 ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය (ශ්‍රී.ආ.ස.ජා.)
7.10 වෙබ් අඩවිය

8. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - වාර්ෂික ගිණුම් 43-65

9. විගණකාධිපති වාර්තාව 66-76

10. විගණන වාර්තාව සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කරුණු දැක්වීම 77-83

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## වාර්ෂික වාර්තාව 2011

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය පිළිබඳව ක්‍රියාත්මක වන ප්‍රධානතම නියෝජිත ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. (ආ.ක.ම.) අදාළ සියළුම පාර්ශ්වකරුවන් සහභාගි කර ගනිමින්, ආපදා අවදානම අඩුකරලීම උදෙසා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම ඊට ඇත.

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරවම ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ ක්‍රියාකාරී නියෝජිත ආයතනය ලෙසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදී. ක්‍රමෝපායික මාර්ගෝපදේශණය සහ ජාතික ප්‍රතිපත්තිය සැකසීම ජාතික සභාවේ කාර්යභාරය වන අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් මෙහෙයුම හා පරිපාලනය භාරව සිටින්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයයි.

ශ්‍රී ලංකාවේ ආපදා අවදානම අවම කිරීමේ (ආ.අ.අ.) මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීමේ කාර්ය රාමුව සැකසී ඇත්තේ 2005 අංක 13 දරන පනතින් වන අතර එමගින් මෙරට ව්‍යසන කළමනාකරණය සමස්තයක් ලෙස සළකා, මෙතෙක් පැවති ප්‍රතිචාර පදනම් කරගත් යාන්ත්‍රණයේ සිට ප්‍රගතිගාමී ප්‍රවේශයකට ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා ඉන් මග පෙන්වණි. මෙම පනත මගින් ව්‍යසන විසි එකක් සමාලෝචනයට ලක් කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානතම කාර්යයන් වනුයේ ආපදා හානිය අවම කිරීම, පෙර සූදානම අවදානම් සහගතව, වෙසෙන ජනයාට කල් තියා අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් සිදු කිරීම, අනෙකුත් ප්‍රමුඛතම ආයතන හා එක්ව සහන සේවා සහ පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය යනාදියයි. ප්‍රාදේශීය මට්ටමින් ආපදා අවදානම් අවම කිරීමේ (ආ.අ.අ.) සිදු කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්ක වල ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (ආ.ක.ස.ඒ.) පිහිටුවන ලදී.

### 1.1 වර්තමාන තත්ත්වය

සංස්ථාපනය කිරීමෙන් වසර 6 ½ කට පසුව සියළුම ආපදා සම්බන්ධ කටයුතු වලදී ප්‍රමුඛතම කාර්යභාරය ඉටු කරනා ජාතික මධ්‍යස්ථානය බවට පත් වීමට, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට (ආ.ක.ම.) හැකියාව ලැබී ඇත.

සියළු ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම පහසු කරනු පිණිස, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ප්‍රාදේශීය සභා සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු රට පුරාම පිහිටුවන ලදී.

2011 වසරේදී උතුරු පළාත තුළද ඉහත කී කමිටු පිහිටුවීම සඳහා විශේෂ අවධානය යොමු කොට ඇත.


ගංවතුර, නායයාම්, සුළිසුළං, සුනාමි සහ වෙනත් උවදුරු ඇතිවීමේ අවදානමක් ඇති ප්‍රදේශ තුළ ව්‍යසන සඳහා පෙර සූදානම සහ ප්‍රතිචාර ක්‍රියා ඉහළ නැංවීම පිණිස ප්‍රජා මට්ටමේ ස්වේච්ඡා කණ්ඩායම් රාශියක් 2006 වසරේ සිට ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් නිර්මාණය කරන ලදී.

අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සහයෝගය ද ඇතිව සියළුම ප්‍රාදේශීය මට්ටමේ කටයුතු ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු සභාය දක්වයි.

1.2 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත ප්‍රකාරව ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාව 2005 ජුලි මාසයේදී ස්ථාපිත කරන ලදී. මෙම ජාතික සභාවේ සභාපතිත්වය දරන්නේ අතිගරු ජනාධිපතිතුමා වන අතර ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රමුඛතම ආයතනයද මෙය වේ.

**ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය**



1.3 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සභාපති | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| උප සභාපති | : | ගරු අග්‍රාමාත්‍ය ඩී. එම්. ජයරත්න මැතිතුමා |
| | | විරුද්ධ පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා |

පහත සඳහන් විෂය භාර අමාත්‍යවරු

| | | |
|---|---|---|
| ආරක්ෂක | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| පොලීසිය | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| මුදල් හා ක්‍රම සම්පාදන | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| මහා මාර්ග | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| වෙරළ සංරක්ෂණ | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| නාගරික සංවර්ධන | : | අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| ආපදා කළමනාකරණ | : | ගරු මහින්ද අමරවීර මැතිතුමා |
| සමාජ සේවා | : | ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා |
| පරිසර | : | ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | : | ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා |
| සෞඛ්‍ය | : | ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා |
| තාක්ෂණ හා පර්යේෂණ | : | ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය |
| ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් | : | ගරු විමල් වීරවංශ මැතිතුමා |
| වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ | : | ගරු නිමල් සිරිපාල මැතිතුමා |
| විදුලිබල හා බලශක්ති | : | ගරු චම්පික රණවක මැතිතුමා |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | : | ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | : | ගරු රාජිත සේනාරත්න මැතිතුමා |
| විදේශ කටයුතු | : | ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මැතිතුමා |
| ජල සම්පාදන හා ජලාපවාහන | : | ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා |
| අධ්‍යාපන | : | ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා |
| නැවත පදිංචි කිරීම් | : | ගරු ගුණරත්න වීරකෝන් මැතිතුමා |
| ආර්ථික සංවර්ධන | : | ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා |
| කර්මාන්ත හා වාණිජ | : | ගරු අබ්දුල් රිසාද් බදියුදීන් මැතිතුමා |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | : | ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා |
| කෘෂිකර්ම | : | ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා |

2011 වසරේ තෙවරක් පහත සඳහන් දින වලදී අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් රැස්වූ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව විසින් විශේෂයෙන්ම රටෙහි ඇති වන නායයාම් සහ ගංවතුර තත්ත්වයන්ට අදාළ සංවර්ධන සැලසුම් ඇතුළුව ආපදා අවදානම අවම කිරීමේ කටයුතු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- 2011 මැයි 2 දින
- 2011 අගෝස්තු 2 දින
- 2011 නොවැම්බර් 25 දින

2005 අංක 13 දරන පනත ප්‍රකාරව පහත සඳහන් උවදුරු ආපදා කළමනාකරණය යටතට පැවරේ.

1. නාය යාම්
2. සුළි සුළං
3. ගංවතුර
4. නියග
5. කාර්මික උවදුරු
6. සුනාමි (දළ රළ)
7. භූමිකම්පා
8. සුළං උවදුරු
9. සාගර උවදුරු
10. ගිනි
11. වසංගත
12. පිපිරීම්
13. ගුවන් ප්‍රහාර
14. රටේ අභ්‍යන්තර අර්බුද
15. රසායනික හදිසි අනතුරු
16. විකිරණ හදිසි අනතුරු
17. රට තුළ සාගරය තුළ ඛනිජ තෙල් විසිරීම් ඇතුළු සියලු ඛනිජ තෙල් විසිරීම්
18. න්‍යෂ්ඨික ව්‍යසන
19. නාගරික හා වන ලැව් ගිනි
20. මුහුදු ඛාදනය
21. සුළි කුණාටු, විදුලි කෙටීම් සහ තදබල අකුණු සහිත කුණාටු තත්ත්ව

## 2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වය යටතේ අධ්‍යක්ෂවරුන් මගින් පාලනය වන අංශ 5 කින් සමන්විත වන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත.

මෙම අංශ 5 වනුයේ ආපදා අවම කිරීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, හදිසි මෙහෙයුම් සහ පූර්ව අනතුරු ඇඟවීම්, පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම, පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම්, පරිපාලන හා මූල්‍ය යන අංශ 5 යි. දිස්ත්‍රික්ක මට්ටමින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

(දි.ආ.ක.ඒ) පිහිටුවා ඇත. දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ සහායකයන්ගේ සහයෝගය ඇතිව සහකාර අධ්‍යක්ෂවරුන් විසින් මෙම දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක වල ප්‍රධානත්වය උසුලනු ලැබේ.

2.1 දැක්ම

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත වීම තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම

2.2 මෙහෙවර

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිසා විසින් ඇති කළ ව්‍යසන අවදානම් ක්‍රමානුකූලව කළමනාකරණය කරමින් ප්‍රජාව මෙන්ම මුළු ජාතිය අතර සුරක්ෂිතතාව පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගීම

2.3 අභිමතාර්ථ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා. පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටම යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය

- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරුව
- දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම්
- ව්‍යසන හානිය අවම කිරීම
- පූර්ව අනතුරු ඇඟවීම් සහ තොරතුරු බෙදා හැරීම
- ව්‍යසනයක් සිදු වීමේදී එයට ප්‍රතිචාර දැක්වීමට ඇති පෙර සූදානම ඇති කිරිම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය
- පශ්චාත් ආපදා කටයුතු සම්බන්ධීකරණය කිරීම

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් කාර්යභාරය

ආසන්නතම ගැසට් නිවේදනයට අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යභාරය වනුයේ


1. ස්වාභාවික හා මිනිසා විසින් සිදු කරන ව්‍යසන වලදී සහන සේවා කටයුතු සම්බන්ධීකරණය සහ කළමනාකරණය
2. ව්‍යසන හානිය අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යළි යථා තත්ත්වයට පත්වීම පිළිබඳ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම
3. අදාළ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණු ඇතිව නියමිත මුදල් වෙන් කිරීම් ඇතුළත ජාතික සැලසුම් අධිකාරිත්වය සමග එකඟ වූ කාල පරාසය තළ එකී ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මග පෙන්වීම

4. ජාතික ප්‍රතිපත්තිය පාදක කොට ගෙන ජාතික ව්‍යසන කළමනාකරණ සැලසුම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලසුම සම්පාදනය කිරීම
5. ආපදා හානිය අවම කිරීම, ප්‍රතිචාරය සහ යළි යථා තත්ත්වයට පත්වීම සඳහා වන විදේශ ආධාර ලබන ව්‍යාපෘති ආරම්භ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
6. වගකීම් කාලවේලාවට ඉටු කිරීම සනාථ කරලනු වස්,

   අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, නියෝජිතායතන, පෞද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් අදාළ ආයතන සමග සම්බන්ධිකරණය වී කටයුතු කිරීම
7. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
8. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසන අවස්ථාවලදී ජනතාව මුදවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
9. පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති
10. නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිරිම.

2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ව්‍යූහය

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධාන ව්‍යූහය**



## 2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු වල කෙටි පැතිකඩක්

ව්‍යසන අවදානම් අවම කිරීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු හදිසි අවස්ථා මෙහෙයුම් සහ පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු සන්නිවේදනය, පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම්, පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම, මානව සම්පත් හා මූල්‍යා වැනි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන කාර්ය විභේදනයන් සැලකිල්ලට ගනිමින් කාර්යමණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීම සිදු කෙරේ.

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | මේජර් ජනරාල් ගාමිණී හෙට්ටිආරච්චි (විශ්‍රාමික)<br>ඉංග්‍රීසි හා පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (සබරගමුව)<br>මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| අධ්‍යක්ෂ (ව්‍යසන අවදානම අවම කිරීමේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු) | එම්. යූ. එල්. චන්ද්‍රදාස මහතා (2011.08.08 දින සේවය අවසන් කරන ලදී.)<br>සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>ජල සම්පාදනය සහ අප ජලය ශෝධනය පිළිබඳ ඩිප්ලෝමාව<br>මිඩ්ල්සෙන්ස් පොලිටෙක්නික් (ම. බ්‍රි) |
| අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම් සහ පූර්ව අනතුරු ඇඟවීම් සන්නිවේදනය) | බ්‍රිගේඩියර් එන්. බී. වේරගම (විශ්‍රාමික)<br>(2011.08.08 දින සේවය අවසන් කරන ලදී.)<br>විද්‍යාවේදී උපාධිය (පේරාදෙනිය විශ්ව විද්‍යාලය)<br>ආරක්ෂණ කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කළමනාකරණය (කො.ආ.වි.වි.) |
| අධ්‍යක්ෂ (පෙර සූදානම සැලසුම් කිරීම) | ජේ. එම්. සුනිල් ජයවීර මහතා<br>(2011.12.19 දින සිට පත් කරන ලදී.)<br>මුදල් කළමනාකරණය හා තක්සේරු පිළිබඳ විද්‍යාවේදී උපාධිය<br>නගර හා ග්‍රාම සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය<br>වරලත් නගර සැලසුම්කරු (එම්.පී.ඒ.එස්.එල්)<br>(අයි.ඕ.පී.එස්.එල්) |
| අධ්‍යක්ෂ (පුහුණු කිරීම් සහ මහජන දැනුවත් කිරීම) | ඩී. එම්. සුගතදාස මහතා (11.09.01 දින සිට පත් කරන ලදී.)<br>සමාජවිද්‍යාව සහ අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදි උපාධිය (විශේෂ)<br>ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>අපරාධ විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය<br>සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය |

නියෝජ්‍ය අධ්‍යක්ෂ
(හදිසි අවස්ථා මෙහෙයුම්) කේ. පී. ඒ. ධර්මරත්න මහතා
(2011.05.05 දින සිට සේවය අවසන් කරන ලදී.)
වාණිජවේදී (විශේෂ) පේරාදෙනිය
ප්‍රජා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්ව විද්‍යාලය)

නියෝජ්‍ය අධ්‍යක්ෂ (මාධ්‍ය) ඩබ්.ඒ.සරත් ලාල් කුමාර
ජන සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) මංජුල සමන්ත රණසිංහ මහතා
(2011.10.03 දින සිට පත් කරන ලදී.)
වාණිජවේදී (විශේෂ)
එල්.අයි.සී.ඒ. , සි.අයි.එම්.ඒ. - අන්තර් එම්. ඒ. ඒ. ටී.

සහකාර අධ්‍යක්ෂ
(ව්‍යසන හානි අවම කිරීම) අනෝජා සෙනෙවිරත්න මෙනවිය
භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ)
සිවිල් ඉංජිනේරු විද්‍යාව (පළමු හා දෙවන කොටස්)
ජල සම්පත්, පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය - නෙදර්ලන්තය
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාව

සහකාර අධ්‍යක්ෂ
(පර්යේෂණ හා සංවර්ධන) ශ්‍රීමල් සමන්සිරි මහතා,
විද්‍යාවේදී උපාධිය
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ආර්. එස් / ජී. අයි. එස්)
ඕස්ට්‍රේලියානු පරිගණක සංගමයේ සාමාජික

සහකාර අධ්‍යක්ෂ පාලිත බණ්ඩාර මහතා
(පුහුණු කිරීම් සහ දැනුවත්කිරීම) කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී දර්ශනපති උපාධිය

සහකාර අධ්‍යක්ෂ
(පූර්ව අනතුරු ඇඟවීම) ප්‍රදීප් කොඩිප්පිලි මහතා
කෘෂිවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ (ගෞරව ) උපාධිය

සහකාර අධ්‍යක්ෂ
(පූර්ව අනතුරු ඇඟවීම) රවී ජයරත්න මහතා
කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී, විද්‍යාපති උපාධි

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ<br>(හදිසි මෙහෙයුම්) | මේජර් ඩබ්. ජේ. එම්. නවරත්න (විශ්‍රාමික)<br>ශාස්ත්‍රවේදී උපාධිය, අපරාධ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව |
| සහකාර අධ්‍යක්ෂ<br>(හදිසි මෙහෙයුම්) | එච්. අයි. තිලකරත්න මහතා<br>කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී, විද්‍යාපති උපාධිය |
| සහකාර අධ්‍යක්ෂ<br>(හදිසි මෙහෙයුම්) | ටී. ඩබ්. කේ. ඉන්දික පුෂ්ප කුමාර මහතා<br>(2011.12.01 දින සිට පත් කරන ලදී)<br>කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ගෞරව)<br>විද්‍යාපති - එන්. ආර්. එම් |
| සහකාර අධ්‍යක්ෂ<br>(පෙර සූදානම සැලසුම්කිරීම්) | චතුර ලියනආරච්චි මහතා<br>(2011.11.01 දින සිට පත් කරන ලදී.)<br>විද්‍යාවේදී උපාධිය (පේරාදෙනිය විශ්ව විද්‍යාලය) |
| සහකාර අධ්‍යක්ෂ<br>(පෙර සූදානම සැලසුම්කිරීම්) | එන්. පී. මදවන්ආරච්චි මහතා<br>(2011.10.19 දින සිට පත් කරන ලදී.)<br>ආපදා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය<br>කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ)<br>පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව |
| සහකාර අධ්‍යක්ෂක<br>(මානව සම්පත්) | ඒ. ආර්. එම්. පී. රත්නායක මහතා<br>(2011.09.19 දින සිට පත් කරන ලදි.)<br>වාණිජවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය |
| හදිසි මෙහෙයුම් - අනුයුක්ත | ලුතිනන් කර්නල් කේ. අයි. එස්. එන්. පෙරේරා මහතා - යුධ හමුදා සම්බන්ධීකාරක (2011.11.18 දින සිට පත් කරන ලදී.)<br>කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව |
| පරිපාලන නිලධාරී | වී. එස්. හෙට්ටිආරච්චි මහතා<br>(2011.08.08 දින සිට සේවය අවසන් කරන ලදී.)<br>එස්. එන්. හේවගේ මහතා (2011.10.18 දින සිට පත් කරන ලදී)<br>දර්ශනපති (කැළණිය විශ්ව විද්‍යාලය)<br>ශාස්ත්‍රවේදී (විශේෂ) – (බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය)<br>ශාස්ත්‍රවේදී (විශේෂ) – (කැළණිය විශ්ව විද්‍යාලය) |

2.7 2011.දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සේවක තනතුරු සංයුතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | වත්මන් සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ | 5 | 2 | 3 |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 7 | 0 | 7 |
| සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) | 1 | 1 | 0 |
| සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) | 1 | 1 | 0 |
| සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 1 | 1 | 0 |
| සහකාර අධ්‍යක්ෂ | 12 | 10 | 2 |
| සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) | 25 | 17 | 8 |
| මූල්‍ය නිලධාරී | 1 | 1 | 0 |
| පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| සංවර්ධන සහකාර | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | 1 | 0 | 1 |
| තොරතුරු තාක්ෂණ සහායක | 2 | 2 | 0 |
| පෞද්ගලික සහකාර | 1 | 0 | 1 |
| වීඩියෝ සහ නිශ්චල ඡායාරූප කැමරාශිල්පී | 1 | 0 | 1 |
| සන්නිවේදන කාර්මික ශිල්පී | 3 | 0 | 3 |
| ගුවන්විදුලි ක්‍රියාකරු | 1 | 0 | 1 |
| කළමනාකරණ සහකාර | 25 | 12 | 13 |
| ආපදා කළමනාකරණ සහකාර | 100 | 70 | 30 |
| රියදුරු (අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරන රියදුරන් 1) | 30 | 27 | 3 |
| කාර්යාල කාර්ය සහායක | 5 | 5 | 0 |
| **මුලු අගය** | **228** | **153** | **75** |

## 2.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු වඩාත් පුළුල් කිරීමත්, ශක්තිමත් කිරීමත් සමග ප්‍රතිව්‍යුහගතකිරීමේ අවශ්‍යතාව ප්‍රබලව දැනුණි. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වනු ලැබීමෙන් අනතුරුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ස්ථිර පදනමින් සේවකයන් බඳවා ගැනීම සඳහා 2011.05.05 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතියලබා දෙන ලදී. පුද්ගලයන් 57 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දුන් අතර අවුරුදු 5 ක කාලයක් තුළ අවශ්‍ය සුදුසුකම් සපුරාලීමේ කොන්දේසිය මත පුද්ගලයින් 74 දෙනෙකුට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දෙන ලදී.

2.9 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

මෙය සිදු කරන ලද්දේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත බඳවාගැනීම් පටිපාටියට අනුකූලවය. ප්‍රධාන කාර්යාලයේ සහ වෙනත් දිස්ත්‍රික්ක තුළ පැවති පුරප්පාඩු වලින් 70%කට වැඩි ප්‍රමාණයක් වසර අවසාන වන විට පුරවා සම්පූර්ණ කර තිබේ.

අදාළ සියළුම දිස්ත්‍රික්ක තුළ සහකාර අධ්‍යක්ෂවරුන්, ආපදා කළමනාකරණ සහකාර යන තනතුරු පිළිබඳ හදිසි අවශ්‍යතාවය ඇති හෙයින් ප්‍රධාන කාර්යාලයට හා සෙසු දිස්ත්‍රික්ක සඳහා කළමනාකරණ සහායකයින් බඳවා ගැනීමෙ අවශ්‍යතාව ඇත. 2012 මැයි මාසය වන විට බඳවා ගැනීම් සම්පූර්ණ කළ හැකි වනු ඇත.

2.10 දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (දි.ආ.ක.ස.ඒ.)


මෙම ඒකක වල කාර්ය මණ්ඩලය සහකාර අධ්‍යක්ෂක (දිස්ත්‍රික්) සහ සහකාර සම්බන්ධීකාරක යන නිලධාරීන්ගෙන් සමන්විත වේ. අදාළ දිස්ත්රික්කය ආපදාවන්ට ලක් වීමට ඇති නැඹුරුතාවය මත යම් දිස්ත්‍රික්කයට අවශ්‍ය වන සම්බන්ධීකාරක නිලධාරීන් සංඛ්‍යාවකොපමණද යන්න රඳා පවතී.

සියළුම දිස්ත්‍රික්ක 25 තුළ ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක වල ඇති කාර්ය මණ්ඩලයන්හි සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) වරුන් 25 ක් සහ දිස්ත්‍රික් කළමනාකරණ සහායක නිලධාරීන් 82 ක් සේවයේ යොදවා ඇත.

යුධ හමුදා සහ ගුවන් හමුදා නිලධාරීන් 97 දෙනෙකු කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තම සහ රත්නපුරය යන දිස්ත්‍රික්ක තුළ ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට අනුයුක්ත කර ඇත.

කළුතර හා කෑගල්ල හැරුණු කොට සෙසු සියලු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික ලේකම් කාර්යාල තුළ සංස්ථාපනය කර ඇත.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ක්‍රමවේදය



2.11 නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ස්ථානගත කළ හැකි මහල් 5 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කරනු ලබමින් පවතින අතර මෙහි වැඩකටයුතු 2012 මාර්තු මාසය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

දැනට පවතින පරිශ්‍රයෙහි ඇති ඉඩකඩ හා පහසුකම් සීමා සහිත වීම නිසා කාර්ය මණ්ඩලය දැඩි අපහසුතාවයකට ලක් ව ඇත. 2012 මාර්තු මාසයේදී නව ගොඩනැගිල්ල තුළ ස්ථාන ගත වූ පසු මෙම තත්ත්වය යහපත් අතට හැරෙනු ඇත.

2.12 2011 වසරේදි හමු වූ අවස්ථා සහ බාධක පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

1. 2011 ජනවාරි සහ පෙබරවාරි මස තුළදී නැගෙනහිර, උතුරු සහ උතුරු මැද පළාත් විශාල වශයෙන් ගංවතුර උවදුරට ලක් විය. එලෙසම එම කාලපරිච්ඡේදය තුළදීම කඳුකර ප්‍රදේශවල බෑවුම් නාය යාමට ලක් විය. 2011 ජනවාරි සහ පෙබරවාරි මස තුළදී මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක තුළ පමණක් තද වැසි හේතුකොට ගෙන ඇති වූ ව්‍යසන මගින් පීඩාවට පත් වූ මිනිසුන් සංඛ්‍යාව පිළිවෙලින් මිලියන 1.1 සහ 1.2 විය. මෙම කාල පරිච්ඡේදය තුළ මඩකලපුව, අම්පාර, සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලට ලැබුණු සම්පූර්ණ වර්ෂාපතනය සාමාන්‍ය වාර්ෂික පතනයද ඉක්මවූ බව වාර්තා වී ඇත.

   දේශගුණික වෙනස්කම් හේතු කොට ගෙන මෙවැනි ආකාරයේ අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන් අනාගතයේදීද නිරන්තරවම අපේක්ෂා කළ හැකිය. කෘෂිකාර්මික කාර්යයන් සඳහා ඉදි කරන ලද කුඩා, මධ්‍යම හා විශාල පරිමාණයේ ජලාශ විශාල සංඛ්‍යාවක් දක්නට ලැබෙන අතර ගංවතුර ජලය ගබඩා කිරීමට මෙම ජලාශ උපකාරී වේ. කෙසේ වුවද, මෙම ජලාශ නඩත්තු කිරීම ප්‍රමාණවත් තරම් මට්ටමකින් සිදු නොවන නිසා මෙම ජලාශ තුළ ඒවායේ උපරිම ධාරිතාවයට ජලය ගබඩා කළ නොහැකිය. එහෙයින් උතුරු නැගෙනහිර සහ උතුර මැද පළාත් වලට ජල ගැලීම් මගින් ඇති වන බලපෑම් අවම කිරීම සඳහා ජලාශ ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට ලක් කිරීම, නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, ජලාශ පහසුකම් අළුතින් ඇති කිරීම සහ ගංගා ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරීම මගින් ඇල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය ඥාණාන්විත ක්‍රියාවක් වේ. ජලාශ ද්වාරයන් නියමිත වේලාවට පාලනය කිරීම පිණිස ජලාශ වෙත ජලය ලැබීම් පිළිබඳ අනවැකි අවශ්‍ය වනු ඇත. වර්ෂාපතන සහ ජල මට්ටම් මාපක සවි කිරීම මගින් නිසි කලට දත්ත ලබා ගත හැකි වන අතර එමගින් ජලාශ තුළට ඇතුළු විය හැකි ජල ප්‍රමාණ පිළිබඳව පුරෝකථනය කිරීම සඳහා මෙම දත්ත විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීම මගින් ජලාශ පිටාර ගැලීම නිසා ඇති විය හැකි අවදානම් තත්ව අවම කළ හැකි වනු ඇත.

(2) ව්‍යසන අඩු කිරීම සඳහා ව්‍යසන අවම කිරීමේ ක්‍රියාමාර්ග අප විසින් ක්‍රියාත්මක කළද දැනට පවතින නැඹුරුතාවය මත ව්‍යසන සිදුවීම නොවැළැක්විය හැකිය. එහෙයින් හදිසි අවස්ථා වලදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය සියළුම මට්ටම් වලදී ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(3) විශේෂ වශයෙන්ම පුහුණු කිරීම සහ මහජන දැනුවත් කිරීම, පෙර සූදානම සහ සැලසුම් සකස් කිරීම යන අංශවල අධ්‍යක්ෂවරුන් සහ යම් යම් අංශයන්හි සහකාර අධ්‍යක්ෂවරුන්ද ඇතුළු ප්‍රධාන කාර්යාලය තුළ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයන්හි හිඟකම හේතු කොටගෙන ආපදා කළමනාකරණ කටයුතු කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට බාධා ඇති විය. මෙම තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබුයේ පසුගිය මාස තුන තුළදීය.

(4) 2011 වසරේදී ඉතාම දිගු කාලයක් තිස්සේ පුරප්පාඩු වී පැවති උතුරු හා නැගෙනහිර පළාත් වල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අපට හැකි විය.

(5) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ වැඩසටහන් අධීක්ෂණය, ව්‍යාපෘති ඇගයීම සහ තොරතුරු තාක්ෂණය යන අංශ මග හැරී තිබුණි. ඊට අමතරව මානව සම්පත් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් පත් කර තිබුණේ එක් අධ්‍යක්ෂවරයෙකු පමණි. මීට අමතරව පූර්ව අනතුරු ඇඟවීම් අංශය හදිසි අවස්ථා මෙහෙයුම් අංශය සමග ඒකාබද්ධ කර ඇත.

ඉහත කී සාධක හේතු කොට ගෙන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය මානව සම්පත් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දුෂ්කරතාවයනට මුහුණ පා තිබිණ. තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තුවද අඩාල වී ඇත. පූර්ව අනතුරු ඇඟවීම් කටයුතු ද සිදු කිරීමට සිදුව ඇති හෙයින් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ කාර්යභාරයද ප්‍රමාණය ඉක්මවා ඇත.

6. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මගින් සුදුසුකම් ලත් පුද්ගලයින් 57 දෙනෙකුට බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව ස්ථිර පත්වීම් ලබා දී ඇති අතර බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව අවුරුදු 5ක කාලයක් තුළ සුදුසුකම් සපුරාලීමේ කොන්දේසිය මත සෙසු අයට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දෙන ලදී.

7. බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව, මානව සම්පත් සහ මූල්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් කිහිප වතාවක් උත්සාහ කළද එය සාර්ථක නොවූ අතර ඒ හේතු කොට ගෙන මානව සම්පත් හ මූල්‍ය අංශයෙහි කාර්ය සාධනය කෙරෙහි විශාල බලපෑමක් ඇති විය. මානව සම්පත් හා මූල්‍ය යන අංශයන් ඒකාබද්ධ කිරීම පිළිබඳ තීරණය නැවත සලකා බලන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත.

තවද, අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට කිහිප වතාවක් උත්සාහ කළද හදිසි අවස්ථා මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීම් සහ ව්‍යසන අවම කිරීම හා පර්යේෂණ සහ සංවර්ධන යන අංශයන්හි අධ්‍යක්ෂ තනතුරු ද පුරප්පාඩු වී පවතී.

8. භාණ්ඩාගාරය විසින් අවශ්‍ය ප්‍රාග්ධන අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද කිරීම හේතු කොට ගෙන සැලසුම්ගත කරන ලද කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහිද බලපෑමක් ඇති වී ඇත.

9. ජාතික සුරක්ෂිතතා දිනය සඳහා පාසල් සහභාගි කරවීම දැනට හඳුනාගත් දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් සීමා වී ඇත. ස්වාභාවික විපත් පිළිබඳ පාසල් ළමුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ සහ සුරක්ෂිත සංස්කෘතියක් බිහි කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන රටේ සියළුම පාසල් ළමයින් අතර නැතහොත් අවම වශයෙන් අදාළ පළාතේ පාසල් ළමයින් අතර චිත්‍ර සහ රචනා තරඟ පැවැත්වීමට නිර්දේශ කෙරේ.

10. සංවර්ධන වැඩසටහන තිරසාරව පවත්වා ගෙන යාම සඳහා ආපදා කළමනාකරණය තුළ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරී සහසහාගිත්වයද ඉතාම වැදගත් වේ. පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් සභා වලද ක්‍රියාකාරී සහභාගිත්වය ඇතිව, 2011 වසරේදී ආරම්භ කරන ලද නගර ප්‍රත්‍යස්ථතා වැඩසටහනද වඩාත් ශක්තිමත් කිරීම කළ යුතුය. මේ සඳහා ඔවුනගේ සහභාගිත්වය සහතික කරලනු වස් ක්‍රමෝපායන් නිර්මාණය කළ යුතුය.

11. ව්‍යසන පිටුදැකීම සඳහා එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ක්‍රමෝපාය මගින් නිර්මාණය කරන ලද හයෝගෝ කාර්යරාමුවට (හ.කා.රා.) ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. සියළුම රාජ්‍ය ආයතන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිකයන්, මාධ්‍යවේදීන්, සාමාජිකත්වය දරන ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු පිහිටුවන ලද්දේ ඉහත කී හයොගෝ කාර්යරාමුව ප්‍රකාරවය. විවිධ සාමාජික ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද ආපදා අවදානම් තත්ව දුරලීමේ වැඩසටහන් සහ ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කිරීමට කමිටුව නව වතාවක් රැස් වෙන ලදී.

12. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ මධ්‍යම පරිසර අධිකාරිය එක්ව සිදු කරන ලද ඒකාබද්ධ ක්‍රමෝපායික පාරිසරික තක්සේරුව මගින් උතුරු පළාත තුළ රජය විසින් ආරම්භ කරන ලද සීඝ්‍ර සංවර්ධන වැඩසටහනට මහත් සහායක් ලැබී ඇත. ගම්පහ දිස්ත්‍රික්කය සහ ඌව හා මධ්‍යම පළාත් සඳහාද මෙවැනි අධ්‍යයනයක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබමින් පවතී.

13. 2005 වසරේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කරන ලද අවදියේ සිටම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් (එ.ජා.සං.වැ.) එම ආයතනය වෙත අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය ආධාර ආපදා අවදානම් තත්ව දුරලීමේ වැඩසටහන (ආ.අ.දු.වැ.) හරහා ලබා දෙමින් සිටියි. 2011 වසර සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය ඇ.ඩො. 630,000 ක් විය.

2011 වසර සඳහා වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආධාර ලබා දෙන ලද ආපදා අවදානම් තත්ව දුරලීමේ වැඩසටහන මගින් මූලික අවධානය යොමු කරන ලද්දේ ප්‍රධාන ස්වාභාවික ව්‍යසනවල අවදානම පිළිබඳ තොරතුරු සංග්‍රහයක් පිළියෙල කිරීම, ඒකාබද්ධ ක්‍රමෝපායික පරිසර තක්සේරුව (ඒ.ක්‍ර.ප.ත.) ව්‍යසන වලට ඔරොත්තු දෙන ඉදිකිරීම් නිර්මාණය කිරීම සඳහා මාර්ගෝපදේශ හා සැලසුම් නිර්මාණය කිරීම යන කාර්යය සහ රාජ්‍ය ආයතන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශයේ ආයතන සමග සහයෝගිතාවය ගොඩනගා ගැනීම සහ ආපදා තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම යන විෂය ක්ෂේත්‍ර වෙතය. තවද එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේද සහයෝගය ඇතිව පාසල් ළමුන් සහ අවදානමට ලක්ව සිටින ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපනික පොත්පත්ද නිර්මාණය කරනල දී.

3. ජාතික මට්ටමේ ප්‍රධාන වැඩසටහන

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමග ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත සංශෝධනය කරමින් සිටී.

මෙම ප්‍රතිශෝධිත පනත 2012 වසරේදී ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව වෙත පිරිනැමීමට නියමිත වේ.

3.2 ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සංග්‍රහය

ආපදා අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවිත සහ දේපල ආරක්ෂා කිරීම පරම අරමුණ ලෙස සලකමින් සාධාරණත්වය, වින්දිතයන්ගේ අයිතිවාසිකම් වැනි මාර්ගෝපදේශ මූලධර්ම සහ ආපදා කළමනාකරණය යන දර්ශනය මත පදනම්ව ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති කෙටුම්පත පිළියෙල කර ඇත. අනුමැතිය සඳහා ජාතික සභාව වෙත පිරිනැමීමට පෙර මෙම ප්‍රතිපත්ති සංග්‍රහය අදාළ පාර්ශ්වකාර ආයතන වෙත ලබා දෙනු ලැබේ.

3.3 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම

ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම ආරම්භ කරන ලද්දේ 2006 වසරේදීය. සැලසුමෙහි කෙටුම්පත පිළිබඳව සියළු පාර්ශ්වකාර ආයතන සමග පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී. 2010 සහ 2011 වසර වලදී ඇති වූ තදබල ගංවතුර තත්ත්වයනට පසුව මෙම සැලැස්ම සංශෝධනය කිරීමට තීරණය කරනු ලැබ ඇත. පසුගිය අවුරුදු 2 තුළදී අත්දැකීමට සිදුවූ දේශගුණික වෙනස්කම් සහ අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම් සැලකිල්ලට ගනිමින් දැනට මෙම සැලැස්ම සංශෝධනය කරනු ලබමින් පවතී.

3.4 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය 2005 ආපදා කළමනාකරණ පනත මගින් අවධාරණයකර ඇත. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ඇතුව ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භකරන ලදී. (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකාව) ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණ නිර්මාණය කිරීම තුළින් සියළුම ආකාරයේ ව්‍යසන ප්‍රතිචාර සඳහා පුළුල් යාන්ත්‍රණයක් මෙම ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම මගින් සංස්ථාපනය කරනු ලැබේ. මනා ලෙස සම්බන්ධීකරණය වූ ඵලදායී හදිසි අවස්ථා ප්‍රතිචාර පද්ධතියක් බිහි කිරීම අරමුණු කරගත් ව්‍යසන කළමනාකරණ සැලසුම් ක්‍රියාවලියෙහි අනිවාර්ය අංගයක් ලෙස මෙය සැලකිය හැකිය. ව්‍යසන ප්‍රතිචාර පිළිබඳ වගකීම දරන ආයතන විසින් පහසුවෙන් පරිශීලනය කිරීමට හැකි වනු පිණිස ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලසුම, එය නිර්මාණය කරනු ලැබූ පසුව, ආකෘති දෙකකින් ලබා ගත හැකි වනු ඇත.

3.5 සංයුක්ත සැලැස්ම

2010 වසර සඳහා වූ සංයුක්ත සැලැස්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිළියෙල කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සැලැස්ම ප්‍රකාරව මුදල් ප්‍රතිපාදන ඉල්ලා සිටින ලදී. කෙසේ වුවද, මූල්‍යමය දුෂ්කරතා හේතු කොටගෙන සැලසුම ප්‍රකාරව සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් අඩු කිරීමට සිදු විය. ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ ආයතනික සැලසුම් නිර්දේශ ඇතුළත් කළ නොහැකි විය. ආයතනික සැලැස්ම ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කර ඇති අතර එම කටයුතු 2012 වසරේදී සම්පූර්ණ කරනු ඇත.

3.6 කමිටු

3.6.1 තාක්ෂණික උපදේශන කමිටුව

"ආපදා අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදි කිරීම සඳහා මාර්ගෝපදේශ නිර්මාණය" සඳහා වූ තාක්ෂණික උපදේශන කමිටුව 2006 වසරේදී සංස්ථාපනය කරන ලදී. විවිධ වෘත්තිය ආයතන සහ විශ්ව විද්‍යාල, රජයේ දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් මෙහි සාමාජිකයන් තෝරා ගනු ලැබූ අතර එම සාමාජිකයන් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 1. | මහාචාර්ය ප්‍රියාන් ඩයස් | සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මොරටුව විශ්ව විද්‍යාලය |
| 2. | යූ. ඩබ්. එල්. චන්ද්‍රදාස මහතා | උපදේශක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 3. | එම්. එස්. වීරසිංහ මහත්මිය | සහකාර සාමාන්‍යාධිකාරී, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 4. | පී. ඩී. ඩබ්ලිව්. අලහකෝන්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, සෙත්සිරිපාය, බත්තරමුල්ල.; |
| 5. | මහාචාර්ය එම්.ටී.ආර්.ජයසිංහ | සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මොරටුව විශ්වවිද්‍යාලය |
| 6. | මහාචාර්ය කේ.ඩී.ඩබ්.නන්දලාල් | පේරාදෙනිය විශ්ව විද්‍යාලය |
| 7. | ශිරෝමාල් ප්‍රනාන්දු මහතා | කමිටු සාමාජික, ව්‍යුහ ඉංජිනේරු සංගමය |
| 8. | කේ.එල්.එස්.සහබන්දු මහතා | සහකාර සාමාන්‍යාධිකාරී, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය |
| 9. | මහාචාර්ය ලාල් බාලසූරිය | මොරටුව විශ්වව විද්‍යාලය |
| 10. | කුමාරි වීරසිංහ මිය | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය |
| 11. | එස්. ඒ. ගුණසේකර මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 12. | චූලා ද සිල්වා මහතා | සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය |
| 13. | පී. ශිවප්‍රකාශපිල්ලෙයි මහත්මිය | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| 14. | මහාචාර්ය රංජිත් දිසානායක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පේරාදෙනිය විශ්ව විද්‍යාලය |
| 15. | වසන්ට් පුල්ලෙනායගම් මහතා | ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය |
| 16. | අනෝජා සෙනෙවිරත්න මෙනවිය | සහකාර අධ්‍යක්ෂක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 17. | දමිත් චන්ද්‍රසේකර මහතා | එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල |

ප්‍රියාන් ඩයස් මහතාගේ සහභාගිත්වයෙන් යුතුව කමිටුව 2011 වසරේදී 15 වතාවක් රැස් වූ අතර ආපදා අවදානමට ලක් වූ ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම් කරුවන් සඳහා වූ අත්පොත නිර්මාණය කිරීම සහ ඒ හා සම්බන්ධ මාර්ගෝපදේශ සැකසීම මෙහි අරමුණ විය. ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනයේ සහයෝගය ඇතුව, ආපදා අවදානම් තත්ව දුරලීම පිළිබඳ වෘත්තාන්ත නිරූපනය කරන අත්පොත නිර්මාණය කරනු ලබමින් පවතී. ව්‍යසන වලට ඔරොත්තු දෙන මාර්ග ඉදිකිරීම සඳහා වූ මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික කමිටුව විසින් අනු කමිටුවක්ද නිර්මාණය කරන ලදී.

ව්‍යසන වලට ඔරොත්තු දෙන මාර්ග ඉදිකිරීම සඳහා වූ මාර්ගෝපදේශ නිර්මාණය කිරිමේ තාක්ෂණික උප කමිටුව

| | | |
|---|---|---|
| 1. | සරත් වීරසේකර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂක, ජල විද්‍යා |
| 2. | කුමාරි වීරසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| 3. | ජේ. ජයමාන්න මහතා | අධ්‍යක්ෂ පර්යේෂක සහ සංවර්ධන මාර්ග සවර්ධන අධිකාරිය |
| 4. | මහාචාර්ය අයි. ආර්. ඒ. වීරසේකර | සභාපති, ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය |
| 5. | එන්. පී. දූල්වල මෙනවිය | ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරු මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් කාර්යාංශය |
| 6. | ඩබ්.ඒ.ඩී.ඩී. නන්ද කුමාර මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මාර්ග) මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් කාර්යාංශය |
| 7. | ටී. වසන්ත කුමාර් මහතා | ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරු / මාර්ග සංවර්ධන අධිකාරිය |
| 8. | පී. විජේරත්න මෙනවිය | සහකාර සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සංස්ථාව |
| 9. | ආර්. විමලසූරිය මෙනවිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 10. | එස්. එච්. යූ. ද සිල්වා මහතා | අධ්‍යක්ෂ / මාර්ග සංවර්ධන අධිකාරිය |
| 11. | අනෝජා සෙනෙවිරත්න මෙනවිය | සහකාර අධ්‍යක්ෂ (ආපදා දුරලීම) ආපදා කළමනාකරන මධ්‍යස්ථානය |
| 12. | කලන කුරේ මහතා | වැඩසටහන් සංවර්ධන සහායක / එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල |
| 13. | දමිත් චන්ද්‍රසේකර මහතා | වැඩසටහන් නිලධාරී / එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල |

අනු කමිටුව වාර 5 ක් රැස්වූ අතර මාර්ග සැලසුම් මාර්ගෝපදේශ තුළට අන්තර්ගත කළ යුතු ආපදා අවදානම් දුරලීමේ නිර්ණායක පිළිබඳව එහිදී සාකච්ඡා කරන ලදී.

### 3.6.2 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

අදාළ ආයතන සමග සම්බන්ධ වී මිනිසා විසින් ඇති කරන ලද හෝ ස්වාභාවික ව්‍යසනයකදී සම්පත් යෙදවිය හැකි හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතුවලට සෘජුවම සම්බන්ධ පාර්ශ්වකාර ආයතන සහ අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනවල ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගෙන් හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව සමන්විත වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් කමිටුව අඛණ්ඩව රැස් වේ. ව්‍යසනවලදී හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ඕනෑම ව්‍යසනයකට මුහුණදීම සඳහා තම තමන් සූදානම් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය දැක්වීම මෙම කමිටුවේ පුළුල් යොමුකිරීම් අනුදේශ වේ. 2011 වසරේදී හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුවේ රැස්වීම් වාර 4 ක් පවත්වන ලදී.

### 3.6.3 ජාතික ආපදා කළමනකාකරණ සම්බන්ධීකරණ කමිටුව (ජා.ආ.ක.ස.ක.)

ආපදා දුරලීම සඳහා අන්තර් ජාතික ක්‍රමෝපාය මගින් නිර්දේශිත පරිදි හයොගෝ කාර්ය රාමුව ක්‍රියාත්මක කිරිම සඳහා පහසුකම් සැපයීම හා එම කටයුතු අධීක්ෂණය කිරීම අරමුණු කරගෙන රාජ්‍ය ආයතන, ආධාර ලබා දෙන්නන්, එක්සත් ජාතීන්ගේ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය, වෘත්තිකයන්, අධ්‍යාපන ආයතන සහ පුද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විතව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් යුතුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ජාතික ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව සංස්ථාපනය කරන ලදී. මෙම ජාතික ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවෙහි අරමුණ වනුයේ ව්‍යසන අවදානම දුරලීම සඳහා දරන්නා වූ ජාතිකමය ප්‍රයත්නයන්ට දායකවීම සහ ව්‍යසන වලට ඔරොත්තු දෙන සුළු ප්‍රජාවන් බිහි කිරීමයි. 2007 වසරේදී විවිධ සංවිධාන 6 ක් නියෝජනය කළ සාමාජිකයන් 14 දෙනෙකුගෙන් ආරම්භ කළ මෙම කමිටුව 2011 වසර අවසානය වන විට ආයතන 73 ක් නියෝජනය කරනා සාමාජිකයන් 127 දෙනෙකුගෙන් සමන්විත විය.

## 3.7 “දැයට කිරුළ” ප්‍රදර්ශනය

2011 වර්ෂයේ බුත්තල පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහභාගී විය. මෙහිදී ප්‍රදර්ශනයට පෙරාතුව පාසල් ළමුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර මොණරාගල දිස්ත්‍රික්කයේ නියඟ ආපදා අවදානම අවම කිරීම සඳහා වැව් 02ක් ප්‍රතිසංස්කරණය කිරීම හා පතස් 40ක් ඉදිකර භූජල පුනර්ජනනය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රතිපාදන යොදවන ලදී. මෙම ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කොට ශ්‍රව්‍ය දෘශ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රජා දැනුවක් කිරීම සඳහා දායක විය.

3.8 ජාතික ආරක්ෂිත දිනය - 2011

2011 වසරේ ජාතික සුරක්ෂිතතා දිනය මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ කත්තන්කුඩි නගර සභාවේ සහයෝගය ඇතිව මඩකලපුව නගරයේදී එම වසරේ දෙසැම්බර් මස 26 වන දින පවත්වන ලදී. මෙම ජාතික සුරක්ෂිතතා දිනය සංවිධානය කිරීමේ අරමණ වූයේ ව්‍යසන හේතුවෙන් සිය ජීවිත අහිමි වූ අය සිහි කිරීම, සුරක්ෂිතතාවය අගයන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ සාමාන්‍ය ජනතාව අතර විශේෂයෙන්ම පාසල් දරුවනට ව්‍යසන අවදානම පිළිබඳ දැනවත්භාවයක් ලබා දීමයි. ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මහතා ප්‍රධාන අමුත්තා විය. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවේ පාර්ශවකරුවන් විසින් මුදල් හා ත්‍යාග ලබා දෙමින් මේ සඳහා තම සම්පූර්ණ සහයෝගය දක්වන ලදී. සුරක්ෂිතතා දින වැඩසටහන සම්පූර්ණයෙන්ම ස්වාධීන රූපවාහිනිය විසින් සජීවීව ප්‍රචාරය කරන ලදී.




2011 ජාතික ආරක්ෂිත දින වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ආරක්ෂිත දින සැමරීමේදී

3.9 ව්‍යසන අවදානම දුරලීම පිළිබඳ ජාතික සම්මේලනය

ව්‍යසන අවදානම දුරලීම (ව්‍ය.අ.දු.) සහ දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය (දේ.වෙ.අ.) පිළිබඳ සම්මේලනය 2011 දෙසැම්බර් මස 25 සහ 26 යන දිනවලදී කොළඹ ගෝල්පේස් හෝටලයේදී පවත්වන ලදී. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ඒකාබද්ධව පිළිවෙලින් ආ තුන්වන වසරටත් මෙම අවස්ථාව සංවිධානය කරන ලදී. ව්‍යසන අවදානම දුරලීම සහ දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීම පිළිබඳ මෙම සම්මේලනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ව්‍යසන අවදානම දුරලීම සහ වෙනස්කම් සඳහා අනුවර්තනය වීම හා සම්බන්ධ වන ගැටළු සාකච්ඡා කිරීම සහ ඒ සඳහා අනාගතයේදී ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික බැඳුම් හඳුනා ගැනීමත්ය.

වත්මන් සංවර්ධන ව්‍යායාමයන් තුළ ආපදා අවදානම දුරලීම සඳහා ලබාගත හැකි ප්‍රවේශයන්, ආපදා අවදානම දුරලීමේදී පුද්ගලික අංශයේ සහභාගිත්වය, ආපදා අවදානම දුරලීම උදෙසා උපකරණ භාවිතය හා දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය පිළිබඳ සියළු තොරතුරු ලබා ගත හැකි වෙබ් ද්වාරයක් ආරම්භ කිරීම වැනි ව්‍යසන කළමනාකරණය යන තේමාවට අදාළ ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා මණ්ඩප තුනක් ද මෙම සම්මේලනයට අන්තර්ගත විය.

4. ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය

4.1 පසුබිම

පසුගිය වසර 5 ට අදළව ව්‍යසන දුරලීමේ පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් විශ්ලේෂණය කරන ලද ව්‍යසන පිළිබඳ තොරතුරු සහ දත්ත වලට අනුව ජල ගැලීම්, නායයෑම්, නියං, සුළිසුළං, වෙරළ උවදුරු සහ සතුන් විසින් පහරදීම් වැනි ව්‍යසන නිරන්තරවම සිදුවන බව අනාවරණය කරගෙන ඇත. ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම්, සහනාධාර සැපයීම, ප්‍රතිසංස්කරණ හා නැවත ඉදිකිරීම් කටයුතු සඳහා විශාල මුදලක් වැය කිරීමට රජයට සිදුව ඇති හෙයින් මෙම ව්‍යසන මගින් ජාතික ආර්ථිකය මත සුවිශාල බලපෑමක් ඇති කරයි. තවද මෙම ව්‍යසන මගින් සමාජ ජීවිතයට අහිතකර බලපෑමක් ඇති කරන හෙයින් ප්‍රදේශයේ ප්‍රජාවන්ගේ දෛනික ආදායම් මාර්ග වෙතද එමගින් සුවිශාල බලපෑමක් ඇති කරයි. එහෙයින් රට තුළ ආපදා දුරලීමේ වැදගත්කම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හඳුනා ගෙන ඇත. ව්‍යසන සහ ඒවා මගින් ඇති කරන ලද බලපෑම පිළිබඳ අතීත වාර්තා විශ්ලේෂණයන් මත පදනම්ව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ව්‍යසන ඇති වීමට නැඹුරුතාවක් ඇති දිස්ත්‍රික්ක ප්‍රමුඛතාව අනුව ලැයිස්තුගත කර ඇත.

4.2 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

ව්‍යාපෘතිය විසින් ව්‍යසන දුරලීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා වලට ප්‍රතිචාරයක් ලෙස 2011 අයවැය මගින් පහත සඳහන් මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

වගුව 1 : 2011 වසරට අදාළ ආපදා දුරලීමේ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීම.

| ව්‍යාපෘතිය | වෙන් කරන ලද මුදල රු. මිලියන |
|---|---|
| ව්‍යසන දුරලීමේ ව්‍යාපෘති | 120.00 |
| අම්පාර, මඩකලපුව, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්ක වල ගංවතුර දුරලීමේ ව්‍යාපෘති | 30.00 |
| නුවර, මාතලේ, බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල නාය යෑමේ සහ පාෂාණ පර්වත ගැලවී යාමේ අවදානම, ඉහළ ප්‍රදේශ බෑවුම් ස්ථායීකරණය සහ බෑවුම් අඩු කිරීම | 36.00 |


4.2.1 ශ්‍රී ලංකාවේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

සම්පූර්ණ දිවයිනම ආවරණය කරමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යසන දුරලීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 120 ක් වෙන් කරන ලද අතර එම ව්‍යසන දුරලීමේ ව්‍යාපෘති මගින් ආවරණය කරන ලද දිස්ත්‍රික්ක දෙවන වගුවේ දැක්වේ. ව්‍යාපෘතීන් ව්‍යසන බලපෑම් දුරලීම සඳහා දායකවීමේ ප්‍රමුඛතාවය මත මෙම ව්‍යාපෘති තෝරා ගන්නා ලදී. දෙවන වගුවේ දක්වා ඇති ආකාරය සම්පූර්ණ මුදල බෙදා දී ඇත්තේ ගංවතුර, නියං, නාය යෑම්, සතුන් විසින් සිදු කළ පහරදීම් වැනි විශාල පරිමාණයේ ව්‍යසනයන් දුරලීම සඳහා ය.

වගුව 02 :   ව්‍යසන සඳහා අයවැය ප්‍රතිපාදන

| ව්‍යසනය | ආවරණය කරන ලද දිස්ත්‍රික්ක | වෙන් කරන ලද මුදල රු. මිලියන |
|---|---|---|
| සතුන් විසින් සිදු කරන ප්‍රහාර | මාතර | 4.6 |
| නියං | මොනරාගල, කුරුණෑගල, නුවර, අනුරාධපුරය, මන්නාරම, වවුනියාව, බදුල්ල, හම්බන්තොට | 45.1 |
| ජල ගැලීම් | නුවරඑළිය, ගාල්ල, මාතලේ, යාපනය, රත්නපුරය, ගම්පහ, හම්බන්තොට | 50.2 |
| නාය යෑම් සහ ගල්වැටි ස්ථාපිත කිරීම | ගාල්ල, මාතර, මාතලේ, කෑගල්ල | 20.1 |
| මුළු එකතුව | | 120 |

ආපදා දුරලීම සඳහා අයවැය මගින් මුදල් වෙන් කිරීම




රූප සටහන 1 :  2011 අයවැය මගින් මුදල් වෙන් කිරීම

අයවැය මගින් වෙන් කරන ලද මුදලින් කරන ලද සම්පූර්ණ වියදම රු. මිලියන 110 (92%) වූ අතර මෙම ව්‍යාපෘති වලින් බොහොමයක් මුලා වර්ෂය අවසාන වීමට පෙර නිම කරන ලද හෙයින් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 95% ඉක්මවා ගියේය. අදාළ වර්ෂය තුළ අනපේක්ෂිත ලෙස ඇතිවූ අහිතකර කාලගුණික තත්වයන් නිසා පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, මන්නාරම, සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ව්‍යාපෘති සම්පූර්ණ කිරීම ප්‍රමාද විය. 2012 වර්ෂයේ පළමු කාර්තුව තුළදී මෙම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නියමිත වේ.


4.2.2 අම්පාර, මඩකලපුව, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘති

2009 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර අවුරුදු 3 ක් පුරා ක්‍රියාත්මක වේ. ආරම්භයේදී ඇස්තමේන්තුගත කරන ලද සම්පූර්ණ පිරිවැය රු. මිලියන 350 ක් වූ අතර 2009 සහ 2010 න වර්ෂයන් තුළදී පිලිවෙලින් රු. මිලියන 35 ක සහ රු. මිලියන 30 ක ඒකාබද්ධ මුදල් ප්‍රමාණයක් වැය කරන ලදී. එලෙසම අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක තුළ ජලගැලීම් දුරලීම පිළිබඳ සවිස්තර අධ්‍යයනයක් 2010 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. දළ පිරිවැය ඇස්තමේන්තුවක් ද සහිතව දිගුකාලීන සහ කෙටිකාලීන වශයෙන් ජල ගැලීම් දුරලීමට ගත යුතු පියවර මෙම අධ්‍යයනය මගින් යෝජනා කරන ලදී. මෙම අධ්‍යයනය මගින් සිදු කරන ලද නිර්දේශ මත පදනම්ව සවිස්තර යෝජනාවක් පිළියෙල කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා බාහිර ආයතන වෙතින් මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදී. බත්තල් දෙකක් මිලට ගැනීමෙන් අනතුරුව අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක තුළ ඇලමාර්ග එළි පෙහෙලි කිරීමේ කෙටි කාලීන වැඩසටහන ආරම්භ කරන ලදී. ඉන්ධන සහ කම්කරු ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලදී.

අම්පාර දිස්ත්‍රික්කයේ ජලය බැස යාම අවහිරව තිබූ බෝක්කු දෙකක් නැවත ඉදි කරන ලදී. අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක තුළ ඇළ මාර්ග එළිපෙහෙලි කිරීමේ කටයුතු ඉදිරියටත් සිදු කරනු ලබමින් පවතී.

මීට අමතරව 'පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාල ඔය ජල ගැලීම් ආරක්ෂණ වේල්ල ශක්තිමත් කිරීම,' පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත සහ මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජල ගැලීම් දුරලීමේ කුඩා පරිමාණ ව්‍යාපෘති 2011 වර්ෂය තුළදී දිගටම සිදු කරන ලදී.

**අම්පාර මඩකලපුව පුත්තලම සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක වල ජල ගැලීම් දුරලීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම**




වෙන් කරන ලද සම්පූර්ණ මුදල රු. මිලියන 30 ක් වූ අතර පුත්තලම සහ අම්පාර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලින් බොහොමයක් මූල්‍ය වර්ෂය අවසාන වීමට පෙර නිම කරන ලද හෙයින් ඉහත කී ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය 85% ඉක්මවා ගියේය.

4.2.3 නුවර, මාතලේ, බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුළ නාය යෑම් සහ කඳු කඩා වැටීම් පිළිබඳ අවදානම වැඩි ප්‍රදේශවල බෑවුම් ස්ථායීකරණය සහ

මෙම ව්‍යාපෘතිය 2009 වසරේදී ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති කාලය වසර තුනකි. මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට නියමිත විය.

| විෂයය | විස්තරය | මුදල (රු. මිලියන) |
|---|---|---|
| 01 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ සහ හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ තෝරාගත් ස්ථාන නාය යාම් ප්‍රදේශ වල නායයාම් දුරලීම සඳහා ක්‍රමෝපායන් හඳුන්වා දීම | 75.0 |
| 02 | පදියපැලැල්ල නගරය නාය යෑම් වලින් ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායයන් හඳුන්වා දීම | 30.0 |
| 03 | සුදුසු පියවර ගැනීම තුළින් පේරාදෙනිය නගරය තුළ නාය යෑම් අවදානම අඩු කිරීම | 40.0 |
| 04 | ව්‍යසන අවදානම දුරලීම සඳහා ක්‍රමෝපායන් ද සහිත නිසි ඉඩම් පරිහරණ ක්‍රමවේදයන් ඇති කිරීම සහ මාතලේ දිස්ත්‍රික්කය තුළ ව්‍යසන සිදුවීම් ඇති විය හැකි ආකාරයේ මිනිස් ක්‍රියාකාරකම් දුරලීම | 2.43 |
| 05 | බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඇති අස්ථාවර බෑවුම් සහ නායයෑම් ප්‍රදේශ හඳුනා ගැනීම සහ නායයෑම් අවදානම අඩු කළ හැකි ආකාරයේ ඉඩම් පරිහරණ ක්‍රම හඳුන්වා දීම | 3.50 |
| | මුළු එකතුව | 150.93 |

විෂය අංක 02 සහ 03 සඳහා නැවත ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර 2011 දෙසැම්බර් මාසයේදී නව ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. ව්‍යාපෘතිය දැනට සිදු කරගෙන යමින් පවතී.

4.3 අවදානම් තත්ව තොරතුරු සංග්‍රහයක් නිර්මාණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ව්‍යසන අවදානම් දුරලීමේ වැඩසටහන මගින් අවදානම් තත්ත්ව තොරතුරු සංග්‍රහයක් නිර්මාණය කිරීමේ කාර්යය 2009 වසරේදී ආරම්භ කරන ලදී. ආරම්භ පියවරක් ලෙස නාය යෑම්, ජල ගැලීම්, නියං, භූමිකම්පා, සහ වෙරළ උවදුරු ඇති විය හැකි ප්‍රදේශ පිළිබඳ "උවදුරු සිතියම්" පිළියෙල කිරීමේ කාර්ය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලදී. මෙම උවදුරු සිතියම් නිර්මාණය සම්පූර්ණ කළ පසු සමස්ත රටම අදාළ වන පරිදි අවදානම් තත්ව සිතියම් නිර්මාණය කිරීම සිදු කිරීමට යෝජනා කර ඇත. අවදානම් සිතියම් නිර්මාණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය අදාළ සියළු පාර්ශ්වකාර ආයතන වල එකඟතාවය ඇතිව සිදු කළ යුතුය. මෙවැනි ක්‍රමවේදයක් පිළිබඳ එකඟතාවයකට පැමිණීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන වැඩමුළුවට සියළුම අදාළ පාර්ශ්වකාර ආයතන වෙත ආරාධනා කරනු ලැබේ.

4.3.1 වෙරළ උවදුරු සිතියම් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කරනු ලබන උවදුරු සිතියම් සංරචක 4 ක් ඇත. සුනාමි තත්ත්වයන්, වෙරළ ඛාදනය, මුහුදු මට්ටම ඉහළ යාම සහ මුහුදේ ප්‍රචණ්ඩ රළ ඇතිවීම එම සංරචක 4 වේ. වෙරළ ඛාදනය හැරණු විට සෙසු සංරචක සඳහා වන උවදුරු සිතියම් 2011 දෙසැම්බර් 30 දින වන විට සම්පූර්ණ කරන ලදී. ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා වන වෙරළ ඛාදන සිතියම් සම්පූර්ණ කරනු ලැබ ඇත. ඉතිරිය 2012 මාර්තු වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. අදාළ සිතියම් පරිහරණය කිරීමට අවශ්‍ය සියළුම දෙනා හට එම සිතියම් හඳුන්වා දීම සඳහා වූ වැඩමුළුවක් ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේදී පවත්වන ලදී.

4.3.2 නායයෑම් උවදුරු සිතියම් සැකසීම

නුවරඑළිය සහ ගාල්ල දිස්ත්‍රික්ක සඳහා 1 : 10,000 පරිමාණයේ නාය යෑම් උවදුරු සිතියම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පිළියෙල කර ඇත. වලපනේ සහ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ මෙම නායයාම් උවදුරු සිතියම් පරිහරණය කිරීමට අවශ්‍ය පුද්ගලයන් හට එම සිතියම් හඳුන්වා දීම සඳහා වූ වැඩමුළුවක් අදාළ දිස්ත්‍රික් කාර්යාලවලදී පවත්වන ලදී.

4.3.3 නියං උවදුරු සිතියම් සකස් කිරීම

නියං උවදුරු සිතියම් සකස් කිරීමේ කාර්යය පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ තාක්ෂණික සහයෝගයද ඇතුව සිදු කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලදී. සිතියම් සැකසීමේ කාර්යය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර විවිධ පාර්ශ්වකාර ආයතන වලින් උවදුරු සිතියම් හා ක්‍රමවේදය පිළිබඳ ප්‍රතිපෝෂණයන් ලබාගැනීම සඳහා ජාතික මට්ටමේ වැඩමුළුවක් 2011 ජුලි මාසයේදී පවත්වන ලදී. අදාළ පාර්ශ්වකරුවන් විසින් සිදු කරන ලද නිර්දේශ අන්තර්ගත කර ඇත.

4.3.4 සුළිසුළං උවදුරු සිතියම් සකස් කිරීම

සුළිසුළං උවදුරු සිතියම් සකස් කිරීමේ කාර්යය භාරව සිටින්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවයි. දත්ත ලබාගැනීම සහ ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මූලික රැස්වීමක් 2011 අගෝස්තු මාසයේදී පවත්වන ලදී. අවශ්‍ය දත්ත බාගත කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙහි සහාය ලැබුණි. අදාළ ක්‍රමවේදයෙහි අඩුපාඩු සකස් කොට සිතියම් කෙටුම්පත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට සහාය දක්වයි.

4.3.5 ජල ගැලීම් උවදුරු සිතියම් සකස් කිරීම

කැළණි, කළු, ගිං, හා නිල්වලා යන ප්‍රධාන ගංගා ද්‍රෝණි සඳහා ගංවතුර උවදුරු සිතියම් සකස් කිරීමේ කාර්යය භාරව සිටිනා තාක්ෂණික ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. ඒ සඳහා වන ක්‍රමවේදය සකස් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

4.4 ව්‍යසන සිතියම් සකස් කිරීම සඳහා චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගැනීම

ජපන් අභ්‍යවකාශ ගවේෂණ ආයතනයේ සහයෝගය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ව්‍යසන අවස්ථාවකදී චන්ද්‍රිකා ඡායාරූප බාගත කළ හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කරන ලදී. 2011 වසරේදී මඩකලපුව, අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක තළ ඇති වූ ජල ගැලීම් තත්ත්වයන්ට අදාළ චන්ද්‍රිකා ඡායාරූප පිළියෙල කොට ඒවා ප්‍රයෝජනවත් වන ආයතන වෙත ලබා දෙන ලදී.

5. පෙර සූදානම් සැලසුම් අංශය

5.1 පෙර සූදානම් සැලසුම් අංශය

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ව්‍යසන ප්‍රතිචාර සඳහා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක වෙත අවශ්‍ය මාර්ගෝපදේශ සහ සහයෝගය ලබා දෙමින් ජාතික මට්ටමේ ව්‍යසන කළමනාකරණ සැලැස්මක් නිර්මාණය කිරීමේ කාර්යය සම්බන්ධීකරණය කිරීම පෙර සූදානම් සැලසුම් අංශයේ වගකීම වේ. රාජ්‍ය අංශයේ සියළු ආයතන සඳහා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා සහාය දැක්වීමද මෙම අංශයට අයත් කාර්යයකි.

5.2 ව්‍යසන වලදී ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම.

දිස්ත්‍රික් කමිටු සහ අනු කමිටු සාමාජිකයන්ගේ නම්, ඔවුනගේ වගකීම් සහ කාර්යභාරයන්, දිස්ත්‍රික්කය පිළිබඳ තොරතුරු පැතිකඩක්, දිස්ත්‍රික්කයේ යම් යම් ප්‍රදේශ වල පවතින ව්‍යසන පිළිබඳ මූලික දත්ත, ප්‍රදේශය තුළ පවතින සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර කටයුතු වල නිරත විවිධ පාර්ශ්වකරුවන්ගේ වගකීම් යනාදිය ව්‍යසන පෙර සූදානම් සැලසුම තුළ අන්තර්ගත වේ.

2010 අවසානය වන විට දිස්ත්‍රික් ව්‍යසන පෙර සූදානම් සැලසුම් 16 ක් පිළියෙල කොට තිබුණි. 2011 වර්ෂය තුළදී අම්පාර දිස්ත්‍රික්කය සඳහා වූ ව්‍යසන පෙර සූදානම් සැලසුම් කෙටුම්පත සකස් කොට තිබුණි. වවුනියාව සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ව්‍යසන පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩමුළුව පවත්වන ලද අතර ඒ සඳහා දත්ත හා තොරතුරු එකතු කිරීම දැනට සිදු කරනු ලබමින් පවතී. ඉතිරි දිස්ත්‍රික්ක 9 වන වවුනියාව, කිලිනොච්චිය, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, මුලතිවු, මොනරාගල සහ මන්නාරම සඳහා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම 2012 වර්ෂය අවසානය වන විට නිම කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සැලසුම් කරයි.

5.2.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් 2011 වසර තුළදී, ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ව්‍යසන පෙර සූදානම් සැලසුම් සහ දත්ත එක් රැස් කිරීමේ අවශ්‍යතාවයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වූ මූලික වැඩමුළු දිස්ත්‍රික්ක 9 ක් ආවරණය කරමින් කොට්ඨාශ 26 ක් තුළ පවත්වන ලදී.

කෙටුම්පත් කරන ලද සැලසුම් ඉදිරිපත් කිරීම සහ ඒවායේ අන්තර්ගත කරුණු පිළිබඳ එකඟත්වයකට එළඹීම සඳහා වූ අවසාන වැඩමුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 ක්

ආවරණය කරමින් දිස්ත්‍රික්ක 14 ක් තුළ පවත්වන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පෙර සූදානම් සැලසුම් 5 ක් මුද්‍රණය කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ආරම්භක වැඩමුළු | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ අවසන් වැඩමුළු |
|---|---|---|
| අම්පාර | | 1 |
| අනුරාධපුරය | | 1 |
| බදුල්ල | 2 | |
| මඩකලපුව | | 1 |
| කොළඹ | | 1 |
| ගාල්ල | 2 | |
| ගම්පහ | 3 | 2 |
| කළුතර | | 2 |
| නුවර | 3 | 1 |
| කෑගල්ල | 1 | 1 |
| කුරුණෑගල | 4 | |
| මාතලේ | | 1 |
| මාතර | 4 | |
| මොනරාගල | | 2 |
| පොළොන්නරුව | 2 | 1 |
| පුත්තලම | 3 | 1 |
| රත්නපුරය | 2 | 2 |
| මුළු එකතුව | 26 | 17 |

5.2.2 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පෙර සූදානම් සැලසුම්

දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවල සහකාර අධ්‍යක්ෂකවරුන් සහ ඔවුනගේ කාර්ය මණ්ඩල විසින් ගම්මාන මට්ටමේ කමිටු නිර්මාණ කොට ප්‍රජා පාදක ව්‍යසන කළමනාකරණය සම්බන්ධයෙන් එම කමිටු සාමාජිකයන් දැනුවත් කිරීමේ කාර්යය භාරගෙන ඇත. තවද ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම් නිර්මාණය කිරීම, ව්‍යසනයකදී ආරක්ෂිත ස්ථාන කරා යා හැකි ආරක්ෂිත මාර්ග හා ආරක්ෂිත ස්ථාන හඳුනාගැනීම, ප්‍රථමාධාර, අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාව සඳහා කඳවුරු පිහිටුවීම විට සහ ඒවා පාලනය කිරීම යන කාර්යයන් පිළිබඳව ඔවුනට පුහුණුව ලබා දෙන ලදී. මෙගාෆෝන්, මහජනතාව ඇමතිය හැකි සන්නිවේදන ක්‍රම, සයිරන්, වර්ෂා මාපක වැනි පූර්ව අනතුරු ඇඟවීම් සිදු කිරීමට අවශ්‍ය මූලික උපකරණ ද ඔවුනට සපයන ලදී.

2011 වර්ෂය අවසන් වන විට, ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 293 ක් සහ සමාරම්භක වැඩසටහන් 16 ක් , ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ව්‍යසන පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම උදෙසා පවත්වන ලදී.

### 5.2.3 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පෙරහුරු වැඩසටහන්

අදාළ සමාලෝචිත වර්ෂය තුළදී පහත විස්තර කර ඇති ආකාරයට විශේෂයෙන්ම නාය යෑම්, ජලාශ වේලි කැඩී බිඳී යාම, ජල ගැලීම්, සුනාමි වැනි ව්‍යසන වලින් බලපෑමට ලක් වීමට නැඹුරුතාවයක් ඇති ප්‍රදේශවල පෙරහුරු වැඩසටහන් 141 ක් පවත්වන ලදී.

| දිස්ත්‍රික්කය | සුනාමි | නාය යෑම් | ජලගැලීම් | ජලාශ වේලිවල ආරක්ෂාව |
|---|---|---|---|---|
| අම්පාර | 10 | | | |
| කොළඹ | 5 | | | |
| ගාල්ල | 19 | | | |
| ගම්පහ | 5 | | | |
| හම්බන්තොට | 11 | | | 5 |
| කළුතර | 3 | | 6 | |
| නුවර | | 1 | | |
| මාතලේ | | 3 | | |
| නුවරඑළිය | | 11 | | |
| ත්‍රිකුණාමලය | 5 | | | |
| මාතර | 10 | | | |
| පුත්තලම | 9 | | | |
| යාපනය | 3 | | | |
| කිලිනොච්චිය | 4 | | | |
| මඩකලපුව | 9 | | | |
| මන්නාරම | 13 | | | |
| මුලතිවු | 9 | | | |
| මුළු එකතුව | 115 | 15 | 6 | 5 |

කෑගල්ල දිස්ත්‍රිකකේය් අඹගල්ල ග්‍රාම නිළධාරි වසමේ පැවති ආපදා සිතියම් ගත කරණය හා දැනුවත් කිරීමේ වැඩසටහන

2011.12.29
දින මුල්ලියන් කොඩ්ඩයිකඩු ගම්මානයේදී පවත්වන ලද ව්‍යසනවලදී
ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන

### 5.2.4 විශාල ජලාශ වේලි හා සම්බන්ධ ව්‍යසන වලදී පෙර සූදානම් කටයුතු

සුළිසුළං තත්වයකදී හෝ භූ චලනයක් හේතු කොට ගෙන ජලාශ වේලි සම්බන්ධ ව්‍යසන තත්ත්වයන් ඇති වීමේ හැකියාව සැලකිල්ලට ගෙන වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාශය මගින් දැනට ක්‍රියාත්මක කරමින් තිබෙන ජලාශ වේලි ආරක්ෂාව හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියේද (ජ.වේ.ආ.ජ.ස.ව්‍යා.) සහයෝගය ඇතිව තෝරාගත් ජලාශ වේලි කිහිපයක් පාමුල වෙසෙන ප්‍රජාවන්ගේ පෙර සූදානම් ශක්‍යතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව වැඩසටහනක් ආරම්භ කරන ලදී.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විශාල ජලාශ වෙලි 10 ක් තෝරා ගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් සංවිධානය කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ජලාශය පාමුල ජීවත් වන ජනතාව සඳහා ව්‍යසන අවස්ථාවකදී ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම පිළිබඳ පෙරහුරු වැඩසටහන් 5 ක් පවත්වන ලදී.

5.2.5 පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන සහ සුනාමි ව්‍යසනයකදී පාසල් ප්‍රජාව ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම පිළිබඳ පෙරහුර වැඩසටහන

නිර්මාණය කරන ලද මාර්ගෝපදේශ යොදාගෙන, ව්‍යසන තත්වයනට මුහුණපෑමේ නැඹුරුතාවයක් සහිත තෝරාගත් පාසල් කිහිපයක් සඳහා ආරක්ෂිත සැලසුම් පිළියෙල කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට සහ ජර්මන් අන්තර්ජාතික සංවිධානයට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සහයෝගය ලබා දෙන ලද අතර පාසල් දරුවන්ගේ සහභාගිත්වය ඇතුව ව්‍යසන අවස්ථාවකදී ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම පිළිබඳ පෙරහුරු වැඩසටහන්ද සිදු කරන ලදී. ජර්මන් අන්තර්ජාතික සංවිධානය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන විසින් අවශ්‍ය මුදල් සපයන ලදී.

පහත සඳහන් දිස්ත්‍රික්ක තුළ පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් 65 ක් සහ සුනාමි අවස්ථාවකදි ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම පිළිබඳ පෙරහුරු වැඩසටහන් 12 ක් පැවැත්වීම සඳහා පෙර සූදානම් සැලසුම් අංශය විසින් මුදල් සපයන ලදී.

| දිස්ත්‍රික්කය | පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන | සුනාමි අවස්ථාවකදී පාසල් ප්‍රජාව ආරක්ෂිත ස්ථාන කරා ගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහනක් |
|---|---|---|
| අම්පාර | 8 | |
| ගාල්ල | 14 | 12 |
| හම්බන්තොට | 1 | |
| කළුතර | 2 | |
| කෑගල්ල | 2 | |
| කුරුණෑගල | 5 | |
| මන්නාරම | 10 | |
| මාතලේ | 2 | |
| මාතර | 1 | |
| පුත්තලම | 3 | |
| රත්නපුර | 5 | |
| බදුල්ල | 12 | |
| මුළු එකතුව | 65 | 12 |




පාසල් ආශ්‍රිත ව්‍යසන ආරක්ෂණය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය

5.3 ව්‍යසන ඇතිවීමට නැඹුරුතාවයක් සහිත ප්‍රදේශවල ව්‍යසන ප්‍රතිචාර ශක්‍යතාවය වැඩි දියුණු කිරීම / උපකරණ මිලදී ගැනීම

හදිසි තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් තරම් උපකරණ පළාත් පාලන ආයතන සතුව නොමැති බව පසුගිය ව්‍යසන තත්ත්වයන්හිදී නිරීක්ෂණය කිරීමට ලැබුණි. පරිපාලනමය සීමා ඉක්මවා සම්පත් බෙදා හදා ගැනීමේදී ඇති වන පරිපාලනමය ගැටළු හේතු කොට ගෙන අනෙකුත් පළාත් පාලන ආයතන සමග පවත්නා සීමිත සම්පත් ප්‍රමාණය බෙදා හදා ගැනීමද සිදු කළ නොහැකි විය. මේ පසුබිම යටතේ ව්‍යසන ඇතිවීමට නැඹුරුතාවයක් සහිත ප්‍රදේශවල පළාත් පාලන ආයතන වෙත ජල බවුසර්, බැකෝ යන්ත්‍ර වැනි උපකරණ සැපයීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කටයුතු කළේය.

තවද ව්‍යසන ප්‍රතිචාර ශක්‍යතාවය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය මට්ටමේ කමිටු සහ දිස්ත්‍රික් මට්ටමේ සංවිධාන වෙත උපකරණ ලබාදීමද සිදු කරන ලදී. පෙර සූදානම් සැලසුම් සඳහා රු. මිලියන 29 ක් ද උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 14.6 ක් ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වැය කරන ලදී.



ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කමිටු සාමාජිකයෙකු වෙත මුළුතැන්ගෙයි උපකරණ බෙදා දීමේ අවස්ථාව

2011 වර්ෂය තුළ පවත්වන ලද වෙනත් වැඩසටහන්

රාජ්‍ය නොවන සංවිධාන සහ රජයේ ආයතනවල සහයෝගය ඇතිව දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව විසින් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. අම්පාර, මොනරාගල සහ කෑගල්ල දිස්ත්‍රික්ක තුළ ව්‍යසන කළමනාකරණ සැලසුම් පිළියෙල කරන ලදී. රත්නපුර දිස්තික්කය තුළ ස්ථාන 6 දී ගිනි උවදුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්ද ස්ථාන 19 කදී නායයාම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

**අන්තර්ජාතික සහයෝගිතාවය පිළිබඳ ජපන් නියෝජිතායතනය (ජයිකා) ආධාර යටතේ ව්‍යසන කළමනාකරණ ශක්‍යතා වර්ධන ව්‍යාපෘතිය (ව්‍ය.ක.ශ.ව.ව්‍යා.) ක්‍රියාත්මක කිරීම**

දිස්ත්‍රික් පෙර සූදානම් සැලසුම්කරණ ක්‍රියාවලිය ඇගයීමට හා ප්‍රතිශෝධනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමට ව්‍යසන කළමනාකරණ ශක්‍යතා වර්ධන ව්‍යාපෘතිය එකඟත්වය පළ කර ඇත. 2011 වසරේදී පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

(1) මාතලේ සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් පෙර සූදානම් සැලසුම් ඇගයීමට ලක් කිරීම (මාතලේ සහ මඩකලපුව)

(2) දිස්ත්‍රික් පෙර සූදානම් සැලසුම් ප්‍රතිශෝධනය කිරීම සහ නැවත සැකසීම (මාතලේ සහ මඩකලපුව)

6. දැනුවත් කිරීමේ අංශය

හැඳින්වීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ අංශය විසින් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය, අවදානමට ලක් වියහැකි ප්‍රජාවන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශ්වකාර සංවිධාන සඳහා පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම උසුලයි. මෙම වැඩසටහන් වලින් බොහොමයක් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කර පවත්වන ලදී.

6.1 අන්තර්ජාතික සම්මේලන / වැඩමුළු

6.1.1 ව්‍යසන පිටුදැකීම පිළිබඳ ආසියානු සම්මේලනය

ව්‍යසන පිටුදැකීම පිළිබඳ ආසියානු සම්මේලනය ආසියානු පැසිපික් කලාපයේ රටවල් 28 කින් සපැමිණි නියෝජිතයන් 100 දෙනෙකුගේ සහ අන්තර්ජාතික සංවිධාන 17 ක සහභාගිත්වයෙන් 2011 වර්ෂයේ ජුනි මස 13 සිට 15 දක්වා කාලය තුළ කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ව්‍යසන පිටුදැකීම සඳහා වන එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ක්‍රමෝපාය සහ ජපන් රජයෙහි සහයෝගය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ව්‍යසන පිටුදැකීම සඳහා ආසියානු මධ්‍යස්ථානය ඒකාබද්ධව මෙම සම්මේලනය සංවිධානය කරන ලදී.

ජපානයේ ආපදා කළමනාකරණ ගරු ජොෂ්ඨ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා වූ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ ගරු අමාත්‍යතුමා විසින් මෙම සම්මේලනය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. ජල ගැලීම්, සුනාමි, වනාන්තර වල ඇති වන ගිනි සහ නාය යෑම් වැනි ව්‍යසන අවදානම් තත්ත්ව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ කලාපීය අත්දැකීම් පිළිබඳව මෙම සම්මේලනයේදී සාකච්ඡා කරන ලදී. ව්‍යසන කළමනාකරණය සම්බන්ධයෙන් වූ විවිධ ප්‍රවේශයන් පිළිබඳ කලාපයේ රටවල් සතු අත්දැකීම් බෙදා හදා ගැනීමට මෙම සම්මේලනය මගින් අවස්ථාවන් නිර්මාණය විය.

6.1.2 සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව (සි.වි.ප.)

ව්‍යසන සඳහා පෙර සූදානම්වීම පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ එක්සත් ජනපදයේ වන සංරක්ෂණ සේවය යන ආයතන වල සහයෝගය ඇතිව සිද්ධි විධාන පද්ධතිය සම්බන්ධයෙන් වූ සිව් දින කලාපීය පුහුණු වැඩසටහනක් කොළඹදී පවත්වන ලදී. සිද්ධි විධාන පද්ධතිය සහ ව්‍යසන තත්ත්වයන්හදී එය භාවිතා කිරීම පිළිබඳව සාර්ක් සාමාජික රටවලින් සහභාගිවූ නියෝජිතයන් 20 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් කලින් පුහුණු කරන ලද කළමනාකරුවන් කිහිප දෙනෙකු මෙම පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා සම්පත් පුද්ගලයන් ලෙස දායක විය. කලාපය තුළ සිද්ධි විධාන පද්ධතිය මෙහෙයවීම සම්බන්ධයෙන් සාර්ක් සාමාජික රටවලින් පැමිණි නියෝජිතයන් විසින් ශ්‍රී ලංකාවට සිය ස්තුතිය පිරිනමන ලදී.

6.1.3 ශ්‍රී ලංකාව තුළ නගර ප්‍රත්‍යස්ථතා වැඩසටහන ආරම්භ කිරීම.

සුරක්ෂිත නගරයක් බිහි කිරීම අරමුණු කරගත් නගර ප්‍රත්‍යස්ථතා වැඩසටහන ආරම්භ කිරීමේ ජාතික උත්සවය 2011 වසරේ ජූලි මස 5 වන දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී.

මහ නගර සභා 3 ක සහ නගර සභා 20 ක නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයන් මෙම සමාරම්භක උත්සවයට සහභාගී විය. පළාත් පාලන බල ප්‍රදේශ 3 ක් ආදර්ශ නගර ලෙස ද 12 ක් සහභාගීත්ව නගර ලෙස ද තෝරා ගන්නා ලදී. ආදර්ශ නගරයක් ලෙස 'සසකාවා' සම්මානය දිනා ගෙන ඇති පිලිපීනයේ සැන් ප්‍රැන්සිස්කෝ නගරයේ නගරාධිපතිවරයා තම අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා මෙම උත්සව අවස්ථාවට සහභාගී විය. නගර තුළ ඇති වන ව්‍යසන පිටුදැකීම සඳහා ගත හැකි පියවර ප්‍රවර්ධනය කිරීම උදෙසා වූ නව සබඳතාවයන් ගොඩනගා ගැනීම සහ පවතින සබඳතා ශක්තිමත් කරගැනීම මෙන්ම ඒ සම්බන්ධයෙන් වූ අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම අවස්ථාව වේදිකාවක් විය. ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා ප්‍රධාන අමුත්තා ලෙස වර්ණවත් කළ මෙම අවස්ථාවට ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍ය ගරු දුලිප් විජේසේකර මහතා ද සහභාගී විය. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය ඒකාබද්ධව මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. ව්‍යසන පිටුදැකීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ක්‍රමෝපාය ( UNISDR ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ව්‍යසන පිටුදැකීම සඳහා වූ ආසියානු මධ්‍යස්ථානය (ADPC ), ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය, කොළඹ මහ නගර සභාව සහ ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සම්මේලනය, කොළඹ මහ නගර

සභාව සහ ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සම්මේලනය (FSLGA) විසින් මෙම අවස්ථාව සංවිධානය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය දක්වන ලදී.

## 6.2 ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්

### 6.2.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයෙහි ශක්‍යතා වර්ධනය

ව්‍යසන අවස්ථාවලදී කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් සතු ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කොට ඇත. මෙම පුහුණු වැඩසටහන් වල මූලික අරමුණ වූයේ තම තමන්ට අදාළ දිස්ත්‍රික්ක වල ඇතිවන ව්‍යසන අවස්ථාවකට පෙර, පසු සහ එවැනි ව්‍යසන අවස්ථාවන් තුළදී ගත යුතු පියවර පිළිබඳව සාකච්ඡා කිරීමයි. අදාළ වසර තුළදී පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- දිස්ත්‍රික් කළමනාකාර සහායකයන්ගේ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දෙදින ආධුනික වැඩසටහන් දෙකක් පවත්වන ලදී. පළමු වැඩසටහන 2011 සැප්තැම්බර් මස 22 සඳහ 23 දිනවලදී ද දෙවන වැඩසටහන 2011 ඔක්තෝබර් මස 6 වන සහ 7 වන දින වලදීද පවත්වන ලදී.

- හදිසි අවස්ථා තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා බොහෝ රටවල් විසින් භාවිතා කරනු ලබන කළමනාකරණ උපකරණයක් වූ සිද්ධි විධාන පද්ධතිය පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂකවරුන් සඳහා විසි දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. හදිසි අවස්ථා කළමනාකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සතු ශක්‍යතාවය සිද්ධි විධාන පද්ධතිය මගින් ප්‍රවර්ධනය කෙරේ. මෙම පුහුණු වැඩසටහන 2011 අගෝස්තු මස 2 සිට 6 දක්වා කොළඹ හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

- අළුතින් බඳවා ගත් සහකාර අධ්‍යක්ෂවරුන් 14 දෙනෙකුගේ ශක්‍යතා වර්ධනය ඇති කිරීම සහ ඔවුන් ව්‍යසන කළමනාකරණ ක්‍රමවේදයට අනුගත කිරීම සඳහා වූ දෙදින පූර්ව සේවා පුහුණු වැඩසටහනක් 2011 නොවැම්බර් වමස 22 සහ 23 යන දින වලදී පවත්වන ලදී.

- ජල ගැලීම්, නාය යාම් දුරලීම සහ ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා වූ තාක්ෂණික අංශය පිළිබඳ තම ශක්‍යතාවය ප්‍රවර්ධනය කරලීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වැඩසටහනක් 2011 නොවැම්බර් මස 27 සිට 30 දක්වා ජයිකා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යසන කළමනාකරණ සහ ශක්‍යතා වර්ධන ව්‍යාපෘතිය (ව්‍ය.ක.ශ.ව.ව්‍යා.) මගින් පවත්වන ලදී.

### 6.2.2 පාර්ශ්වකාර ආයතනවල ශක්‍යතා වර්ධනය

ආපදා කළමනාකරණය යනු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ව්‍යසන සඳහා ප්‍රතිචාර දක්වන ආයතන, තාක්ෂණික ආයතන සහ ප්‍රජාවන් වැනි සියළුම පාර්ශ්වකාර ආයතන සම්බන්ධ වන සමාජයේ සියළුම දෙනාට බලපාන විෂයයකි.

එහෙයින් අදාළ පාර්ශ්වකාර ආයතන සතු ව්‍යසන කළමනාකරණ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් වැඩසටහන් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන් තුළින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අපේක්ෂා කරනුයේ ඕනෑම ආකාරයක ව්‍යසන අවස්ථාවකට මුහුණදිය හැකි ප්‍රබල ශක්තිමත් ව්‍යසන කළමනාකරණ ජාලයක් බිහි කිරීමයි.

- ජල ගැලීම්, නියං සහ වෙනත් ව්‍යසන වලට රටේ උතුරු ප්‍රදේශය නිරන්තරවම ගොදුරු වේ. එහෙයින් නිවාස අංශයට විශේෂ අවධානයක් යොමු කරමින් රජය විසින් උතුරු පළාත තුළ ආරම්භ කර ඇති සීඝ්‍ර සංවර්ධන වැඩපිළිවෙල සැලකිල්ලට ගෙන, ව්‍යසන ඇති වීමේ නැඹුරුතාවයක් ඇති ප්‍රදේශවල ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් නිර්මාණය කර ඇති මාර්ගෝපදේශ යොදා ගැනීම සහ ව්‍යසන කළමනාකරණය සම්බන්ධයෙන් උතුරුපළාත තුළ සේවය කරන තාක්ෂණ මට්ටමේ නිලධාරීන් 122 දෙනෙකු (ඉංජිනේරුවන් සහ තාක්ෂණ නිලධාරීන්) සඳහා දෙදින පුහුණු වැඩසටහනක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙහි සහයෝගය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පවත්වන ලදී.
- මීට අමතරව උතුරු පළාත තුළ සේවය කරනා සැලසුම් නිලධාරීන් 41 දෙනෙකු සඳහා භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය (GIS ) සහ ඒකාබද්ධ ක්‍රමෝපායික පරිසර තක්සේරු වැඩසටහන ( ISEA ) යටතේ නිර්මාණය කරන ලද සිතියම් භාවිතය පිළිබඳ හය දින පුහුණු වැඩසටහනක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ( UNDP ) ආධාර ඇතිව පවත්වන ලදී.

  විශේෂයෙන්ම හදිසි අවස්ථා තත්ත්වයන්හිදී පූර්ව අනතුරු ඇඟවීම් නිවේදන සන්නිවේදනය සහ ඒ සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම යන කටයුතු වලදී පොලිස් නිලධාරීන් විසින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එහෙයින් ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් සහ පොලිස් පරීක්ෂකවරුන් 50 දෙනෙකු සඳහා හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම සඳහා ඔවුන් සතු ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා සිව් දින පුහුණු වැඩසටහනක් කළුතර පොලිස් පුහුණු මධ්‍යස්ථානයේදී 2011 අගෝස්තු මස 08 සිට 12 දක්වා කාලය තුළ පවත්වන ලදී.

### 6.2.3 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන

දිස්ත්‍රික් මට්ටමේ පාර්ශ්වකරුවන්ගේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු කිරීමේ අංශය විසින් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරන ලදී. දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ ඒකක විසින් තමනට අදාළ දිස්ත්‍රික්ක තුළ ප්‍රජා පෙර සූදානම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

- රත්නපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල ව්‍යසන අවස්ථා ප්‍රතිචාර කටයුතු වල නිරතව සිටිනා පොලිස්, නාවික හමුදා ගුවන් හමුදා සහ යුධ හමුදා නිලධාරීන් 150 දෙනෙකු හට තම ශක්‍යතාවය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

➢ මාතලේ, පොළොන්නරුව, නුවර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක තුළ ව්‍යසන කළමනාකරණ සැලසුම් සකස් කිරීම, අවදානමට ලක්ව ඇති ප්‍රජාවන්ගේ ශක්‍යතාවය ඉහළ නැංවීම, හදිසි අවස්ථාවන්හිදී ප්‍රජාවන්ට සහාය දැක්වීම සහ සහනාධාර බෙදා දීම යන කටයුතු වලට සහාය දැක්වීම යන කාර්යයන්හි නිරත රජයේ නිලධාරීන්ගෙන් තෝරාගත් පිරිසක් සඳහා ශක්‍යතා වර්ධන වැඩසටහනක් පැවැත්වීම.

➢ කෑගල්ල, පුත්තලම, කුරුණෑගල, ගාල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුළ අවදානමට ලක්ව ඇති පාසල්වලින් තෝරා ගත් ගුරුවරුන් සඳහා, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජර්මන් අන්තර්ජාතික සංවිධානයේ සහයෝගය ඇතිව නිර්මාණය කරන ලද ආරක්ෂණ මාර්ගෝපදේශ මත පදනම්ව පාසල් ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව ලබා දීමට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 7. හදිසි අවස්ථා මෙහෙයුම් අංශය

### 7.1 හැඳින්වීම

සන්නද්ධ හමුදා සහ පොලිසිය ඇතුළු සියළු පාර්ශ්වකාර ආයතනවල සහයෝගය ඇතිව තාක්ෂණ ආයතනවලින් පූර්ව අනතුරු ඇඟවීම් පණිවිඩ ලබාගැනීම, උවදුරු තොරතුරු ලබාගැනීම, තත්ත්ව වාර්තා පිළියෙල කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා රට තුළ මිනිසා විසින් ඇති කරන සහ ස්වාභාවිකව ඇතිවන ව්‍යසන අධීක්ෂණය කිරීම යනාදී හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය පිළිබඳව වගකීම උසුලනු ලබන්නේ හදිසි අවස්ථා මෙහෙයුම් අංශය විසිනි. 2011 වසරේදී සිදු කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළදී හදිසි අවස්ථා මෙහෙයුම් අංශය පූර්ව අනතුරු ඇඟවීම් අංශය සමග ඒකාබද්ධ කරන ලදී.

### 7.2 හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය

හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය 2006 වසරේදී ආරම්භ කරන ලද අතර එය සතියේ දින 7 ම පැය 24 පුරාවටම ක්‍රියාත්මක වේ. සාමාන්‍ය අවස්ථාවලදී හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය පැය 8 හි සේවා මුර පදනම යටතේ කාර්ය නියුතු නිලධාරියා ලෙස ක්‍රියා කරනා සහකාර අධ්‍යක්ෂකවරයෙකු සහ කළමනාකාර සහායක නිලධාරීන් දෙදෙනෙකු මගින් ක්‍රියාත්මක වේ. ව්‍යසන තත්ත්වයකදී මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් සේවයේ යොදවනු ලැබේ. හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා ස්ථාවර මෙහෙයුම් ක්‍රියාපටිපාටියක් නිර්මාණය කොට ව්‍යසන අවස්ථාවකදී තමන් විසින් සිදු කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් එහි කාර්ය මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.

රට පුරා මිනිසා විසින් ඇති කරන සහ ස්වාභාවිකව සිදුවන සියළුම ව්‍යසන අවස්ථා පිළිබඳ තොරතුරු එකතු කිරීම හා පවත්වා ගෙන යාම සහ තත්ව වාර්තා පිළියෙල කොට ඒවා ගරු ජනාධිපති ලේකම්තුමා, අමාත්‍යතුමා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ සියළු මාධ්‍ය ආයතන වෙත ලබාදීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබේ. ව්‍යසන අවස්ථාවකදී ව්‍යසනයේ බරපතල ස්වභාවය මත පදනම්ව දිනකට දෙවතාවක් හෝ තෙවතාවක් තත්ත්ව වාර්තා නිකුත් කිරීමසිදු කරනු ලැබේ.

ස්වාභාවිකව ඇති වූ හෝ මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසන අවස්ථාවකදී, හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, ඉක්මනින්

විපතට පත් ජනතාවට ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම සහ , ඔවුනට අවශ්‍ය සහනාධාර බෙදා දීම සඳහා සන්නද්ධ හමුදා, පොලීසිය, රතු කුරුස සංවිධානය, එක්සත් ජාතීන්ගේ ආයතන සහ වෙනත් පාර්ශ්වකාර ආයතන වල සහයෝගය ඇතිව සම්පත් සහ හදිසි අවස්ථා සහනාධාර සැපයුම් බෙදා දීම සඳහා කටයුතු කරනු ලැබේ.

හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය දැනට ඉතා සුළු කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාවක් මගින් ක්‍රියාත්මක වන අතර අතිරේක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසු මෙහි කාර්යයන් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.



එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ( UNICEF), සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා ( UNHCR), ලෝක ආහාර වැඩසටහන (WFP ), මානුෂීය කටයුතු සම්බන්ධීකරණය සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNOCHA ), රතු කුරුස සංවිධානය, අයි. ඕ. එම්. ( IOM) හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය ක්‍රියාතමක වෙමින් සහනාධාර සඳහා වන එක්සත් මෙහෙයුම් නියෝජිත කමිටුව (UMC ) සහ වර්ල්ඩ් විෂන් යන ආයතන විසින් ව්‍යසන අවස්ථාවලදී ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සහ සහනාධාර බෙදා දීම යන කටයුතු සඳහා නිරන්තරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සහාය දක්වනු ලැබේ.

## 7.3 හදිසි අවස්ථා මෙහෙයුම් සඳහා සම්පත් ලබා දීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගංවතුරෙන් පීඩාවට පත් ප්‍රදේශ වෙත මෝටර් බෝට්ටු 10 ක් සහ දම්වැල් කියත් 11 ක් බෙදා දුන් අතර ජල පොම්ප සහ ජලය පිරිසිදු කිරීමේ උපකරණ ද වෙනත් දිස්ත්‍රික්ක වලින් මෙම දිස්ත්‍රික්ක වලට යවන ලදී. ආරම්භක පියවරක් ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජල ගැලීම් ඇතිවීමේ අවදානම ඇති දිස්ත්‍රික්ක අතර ඔරු 39 ක් බෙදා දී ඇති අතර 2011 වසර තුළදී මෝටර් බෝට්ටු 5 ක්, ට්‍රේලර් මත නංවන ලද බෝට්ටු 12 ක්, දම්වැල් කියත් 20 ක්, ජල පොම්ප 5 ක්, සහ ට්‍රැක්ටර් 04 ක් මිලදී ගැනීමට කටයුතු සැලසුම් කර ඇත.

## 7.4 හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු

### 7.4.1 ජල ගැලීම්

2011 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස තුළදී ප්‍රධාන ජල ගැලීම් 2 ක් වාර්තා විය. ජනවාරි මාසයේදී ඇති වූ ජල ගැලීම් වලින් ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, නුවරඑළිය, අම්පාර, පුත්තලම, මන්නාරම, මොනරාගල, මඩකලපුව සහ මුලතිවු යන දිස්ත්‍රික්කවල පවුල් 294,092 ක් පීඩාවට පත් වූහ. නිවාස 5432 ක් සම්පූර්ණයෙන්ම විනාශයට පත් වූ අතර එම ජල ගැල්ම පැවති කාලය තුළ මරණ 44 ක් වාර්තා විය. මෙම මරණ 44 න් ජල ගැල්ම හේතු කොට ගෙන සිදු වූයේ මරණ 18 ක් පමණක් වන අතර මරණයට පත් වූ සෙසු අය ජල ගැල්මෙන් විපතට පත් ප්‍රදේශ නැරඹීමට පැමිණි පුද්ගලයන් වේ.







මඩකලපුව මහ නගර සහා ප්‍රදේශය ජලයෙන් යට වී

සම්පූර්ණයෙන්ම විනාශ වූ නිවාස




ශ්‍රී ලංකා යුධ හමුදාව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මුදවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරමින්

2011 පෙබරවාරි මාසයේදී ඇතිවූ ජල ගැලීම් වලින්, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, අම්පාර, පුත්තලම, මන්නාරම, මොනරාගල, මඩකලපුව, මුලතිවු, කුරුණෑගල සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල පවුල් 372,576 ක් විපතට පත් වූහ. නිවාස 2492 ක් සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර මරණ 18 ක් වාර්තා විය. සිදුවූ මරණ 18 න් 11 ක් පමණක් ජල ගැල්ම නිසා සිදු වූ අතර සෙසු පුද්ගලයන් මරණයට පත් වූයේ ජල ගැල්මෙන් විපතට පත් වූ ප්‍රදේශ නැරඹීමට යාමේදීය.



මනුෂ්‍ය ජීවිත ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් ජල ගැල්මෙන් විපතට පත් ප්‍රදේශ වලට ඇතුළු නොවන ලෙස නිරන්තරවම මාධ්‍ය හරහා ජනතාවට උපදෙස් ලබා දෙන ලදී.

ප්‍රධාන වේලි බිඳී යාමෙන් වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පැය 24 පුරාම සෝදිසි මෙහෙයුම් සිදු කරන ලද අතර පවතින තත්ත්වය පිළිබඳව හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය දැනුවත්ව තබන ලදී. සියළුම ප්‍රධාන ජලාශ පිටාර ගලමින් පැවතුණ අතර අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි පිහිටි ප්‍රධාන ජලාශවල වේලි බිඳීයාම වැළැක්වීම සඳහා සොරොව් දොරටු විවෘත කිරීමට සිදු විය. මේ නිසා අනුරාධපුර නගරයේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්ෂණික ජලගැලීම් තත්ත්වයක් ඇති විය.

මැදිරිගිරිය නගරය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක් දින කිහිපයක්ම ජලයෙන් යට වී තිබුණි. නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසින් තුවාල ලැබූ ජනතාව ප්‍රදේශයෙන් ඉවත් කළ අතර අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ආහාර අඛණ්ඩව සැපයූ අතර ජනතාව වෙත ප්‍රමාණවත් තරම් ආහාර සපයන බවට නිරන්තරවම වග බලා ගන්නා ලදී.

මුදවා ගැනීමේ මෙහෙයුම් සිදු කිරීම සඳහා හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය අමාත්‍යාංශය සමග සම්බන්ධ වී කටයුතු කළේය. ගුවන් හමුදාව, නාවික හමුදාව සහ යුධ හමුදාව විසින් ගංවතුරට කොටු වී සහ ගංවතුරෙන් බේරීමට ගස් මත සහ වහලවල් මත සිටි පුද්ගලයන් 700 ක් පමණ මුදවා ගන්නා ලදී. නාවික හමුදාව මුදවා ගැනීම් කණ්ඩායම් 19 ක් බෝට්ටු සමග මුදවා ගැනීමේ මෙහෙයුම් සඳහා යොදවන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මාතර, ගාල්ල, කළුතර, රත්නපුරය, ගම්පහ සහ කොළඹ සිට කණ්ඩායම් හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය වැනි කටයුතු සඳහා දිස්ත්‍රික් පරිපාලනයට සහාය වීම සඳහා විපතට පත් ප්‍රදේශ වෙත යන ලදී.

### 7.4.2 නාය යාම්

තද වැසි හේතුවෙන් මාතලේ, නුවර, බදුල්ල, කෑගල්ල සහ රත්නපුරය යන දිස්ත්‍රික්ක තුළ නාය යාම් සිදු වූ අතර මේ හේතු කොට පුද්ගලයන් අවතැන් වූ අතර නිවාස විනාශ විය. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක වලට පොලිසිය සහ රජයේ නිලධාරීන්ගේ සහාය ඇතිව ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාමටත්, ඔවුනට අවශ්‍ය පිසූ ආහාර සහ වෙනත් සහනාධාර සැපයීමටත් හැකි විය.

මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රදේශයේ නාය යෑම නිසා සම්පූර්ණයෙන්ම විනාශ වූ නිවසක්



### 7.4.3 නාගරික ප්‍රදේශ වල සහ වනාන්තර වල ඇති වන ගිනි

සමාලෝචන කාලය තුළ නගර ගිනි ගැනීමේසිද්ධි 8 ක් ද, වනාන්තර වල ගිනි ගැනීමේ සිද්ධි 11 ක්ද, වාර්තා වූ අතර හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් ගුවන් හමුදාවේ සහ යුධ හමුදාවේ සහාය ඇතිව මෙම ගිනි නිවා දමන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඇති වූ ගිනි නිවීම සඳහා දෙවතාවක්ද මාතලේ දිස්ත්‍රික්කයේ ඇති වූ ගිනි නිවීම සඳහා එක් වතාවක්ද ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා යොදාගන්නා ලදී. හන්තානේ ඇති වූ ගින්න නිවා දැමීම සඳහා හමුදා සෙබළුන් 350 ක් පමණ යොදා ගන්නා ලදී. මීට අමතරව පෙර සූදානම් පියවරක් ලෙස දිස්ත්‍රික්ක 6 ක කම්ටු 5 කට සහ පාසල් 2 කට ගිනි නිවීමේ උපකරණ 200 ක් බෙදා දෙන ලදී. වනාන්තරවල ගින්නක් හට ගත් විට එම ගින්න හට ගත් ස්ථානයට අදාළ නිවැරදි ගෝලීය ස්ථාන පද්ධති ඛණ්ඩාංක ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා වෙත සැපයීමට හැකියාව ලබා දෙනු පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ඒකක වෙත ගෝලීයස්ථාන පද්ධති උපකරණ සපයනු ලබනවා ඇත.

### 7.4.4 ප්‍රබල සුළං තත්ත්වයන්

2011 වර්ෂය තුළදී ප්‍රබල සුළං තත්ත්වයන් පිළිබඳ සිද්ධි 14 ක් වාර්තා විය. 2011 නොවැම්බර් මස 25 වන දින ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල දැඩි සුළං තත්ත්වයක් ඇති වූ අතර මේ හේතු කොට ගෙන පුද්ගලයන් 23 දෙනෙකු මරණයට පත් විය. පුද්ගලයන් 11 දෙනෙකු අතුරුදහන් ව ඇති බවට වාර්තා විය. වැලිගම සහ මාතර දිස්ත්‍රික්ක වල ධීවර ප්‍රජාවට දැඩි අලාභ හානි සිදු විය. හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය අදාළ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සමග සම්බන්ධීකරණය වී විපතට පත් පුද්ගලයින් මුදවා ගෙන අවශ්‍ය සහනාධාර සැපයුවේය.

## 7.5 පූර්ව අනතුරු ඇඟවීම් තොරතුරු බෙදා හැරීම සහ සන්නිවේදනය

සිදුවීමට ඉඩ තිබෙන ස්වාභාවික ව්‍යසන සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීම් පණිවුඩ නිකුත් කිරීමට බලය පවරන ලද තාක්ෂණික අයාතන වෙතින් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු ලැබේ. හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් මෙම තොරතුරු අවදානමට ලක්ව ඇති ජනතාවට ලබා දෙනුලැබේ. හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් අදාළ තාක්ෂණික ආයතන, පාර්ශ්වකරුවන්, පළාත් පාලන ආයතන, මාධ්‍ය දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කම්ටු සාමාජිකයන් සමග එක්ව එම තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබනු අතර හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ සහනාධාර බෙදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සන්නිවේදන පද්ධති නිරන්තරවම වැඩි දියුණු කරමින් පවතින අතර පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිවල ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාවය අඛණ්ඩව පරික්ෂා කිරීම සිදු කරනු ලැබේ.

උතුරු පළාත තුළ පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු බෙදා හැරීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිණිස අතේ ගෙන යා හැකි වී. එච්. එෆ්. ගුවන් විදුලි යන්ත්‍ර 10 ක්ද එක් පාදක මධ්‍යස්ථානයක්ද යාපනය දිස්ත්‍රික්කය වෙත ලබා දෙන ලදී.








චන්ද්‍රිකා දුරකථන සහ වී.එච්.එෆ්. රේඩියෝ මධ්‍යස්ථානය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානය

“ආපදා කළමනාකරණ සන්නිවේදන සහ ප්‍රතිචාර ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියෙහි” දෙවන අදියර යටතේ සැලසුම් කරන ලද නව පූර්ව අනතුරු ඇඟවීම් කුළුණු 25 න් 9 ක් 2011 වසරේදී ජනතා සේවයට පවරා පූර්ව අනතුරු ඇඟවීම් තොරතුරු බෙදාහැරීමේ ජාලයට එක් කරන ලදී. සුනාමි, සුළි සුළං සහ වෙනත් ව්‍යසන පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සිදු කිරීම සඳහා වෙරළබඩ ප්‍රදේශ වල කුළුණු 74 ක් මේ වන විට ඉදි කර ඇත.

පූර්ව අනතුරු ඇඟවීම් කුළුණු 50 කට රේඩියෝ සන්නිවේදනය හරහා ශබ්ද සන්නිවේදන පහසුකම සපයන ලද අතර 2011 සැප්තැම්බර් මස 06 වන දින මෙය සාර්ථකව අත් හදා බලන ලදී.

තවද, 2011 වසරේදී සයිරන් සහිත මෙගාෆෝන් 400 ක් විදුලි සයිරන් 30 ක් සහ අතින් ක්‍රියාකරවන සයිරන් 45 ක් අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් වෙත අවසන් සැතපුම දක්වා හොඳින් තොරතුරු බෙදා හැරීම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව මිලදී ගන්නා ලදී. ග්‍රාමීය මට්ටමේ පණිවුඩ බෙදා හැරීම සඳහා මෙගාෆෝන ඉතාම ප්‍රයෝජනවත් බව පෙනී ගොස් ඇත.



අතින් ක්‍රියා කරවන සයිරන



මෙගාෆෝන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නායයෑම් ඇති විය හැකි වර්ෂාපතන මට්ටම ලකුණු කරන ලද වර්ෂාමාපක අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් වෙත ලබා දෙන ලදී. නායයාම් සිදුවීමට නැඹුරුතාවයක ඇති ප්‍රදේශවල සිට ආරක්ෂිත ප්‍රදේශ කරා ගමන් කිරීම සඳහා තීරණය කිරීමට මෙම වර්ෂාමාපක මෙම ප්‍රජාවන්ට ඉතා ප්‍රයෝජනවත් විය. මාතලේ, නුවරඑළිය, බදුල්ල, රත්නපුරය, කෑගල්ල සහ නුවර යන දිස්ත්‍රික්ක තුළ නායයෑම් ඇතිවීමට නැඹුරුතාවයක් ඇති ප්‍රදේශවල ජීවත් වන ජනතාව අතර බෙදා දීම සඳහා 2011 වර්ෂයේදී වර්ෂා මාපක 1000 ක් මිලදී ගන්නා ලදී.

## 7.6 ව්‍යසන අවස්ථාවේදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාමේ පෙරහුරු වැඩසටහන්

සුනාමි අවස්ථාවකදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා යොමුකරවීම පිළිබඳ ජාතික මට්ටමේ පෙරහුරු වැඩසටහන් 2 ක් පිළිවෙලින් 2011 මාර්තු මස 31 වන දින හා දෙසැම්බර් මස 20 වැනි දින පවත්වන ලදී. සුනාමි අවදානම ඇති දිස්ත්‍රික්ක අතරින් එක් දිස්ත්‍රික්කයකට එක් ගම්මානයක් බැගින් මෙම පෙරහුරු වැඩසටහනේදී ආරක්ෂිත ස්ථාන කරා යොමු කරවන ලදී. සුනාමි ව්‍යසනය ඇති විය හැකි දිස්ත්‍රික්කවල පෙරහුරු වැඩසටහන් කොටස් වෙළඳපොලෙහි මූල්‍ය සහාය ඇතිව සිදු කරන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මෙම ජාතික පෙරහුරු වැඩසටහන් පවත්වනු ලබන්නේ මෙම අනතුරු ඇඟවීම් පද්ධතිය තවදුරටත් වැඩි දියුණු කිරීමේදී සිදු කළ යුතු කාර්යයන් හඳුනාගැනීම සඳහාය. දිස්ත්‍රික්ක මට්ටමෙන් තව තවත් පෙරහුරු වැඩසටහන් පවත්වන ලද අතර ඒ සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරය විසින් වෙන් කර දෙන ලදී.





සුනාමි ඉවත්කිරීමේ පෙරහුරුව - යාපනය දිස්ත්‍රික්කය

නායයාම් අවස්ථාවකදී ජනතාව ආකර්ෂිත ස්ථාන කරා යොමු කරවීම පිළිබඳ ජාතික මට්ටමේ වැඩසටහනක් ආපදා කළමනාකරණ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ ජයිකා (JICA) ආධාර ඇතිව නුවරඑළිය, බදුල්ල සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක වලදී පවත්වන ලදී. ආරක්ෂිත මාර්ග සහ ආරක්ෂිත ස්ථාන ගම්වැසියන් විසින් හඳුනා ගනු ලැබූ අතර 400 කට වැඩි ජනතාවක් මෙම පෙරහුරු වැඩසටහන් වලට සහභාගි වූහ.

## 7.7 ආරක්ෂිත ස්ථාන කරා ජනතාව යොමු කරවීම සහ මුදවා ගැනීමේ සෝදිසි මෙහෙයුම් සඳහා හමුදා සහාය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉල්ලීම මත, හමුදා කඳවුරු අවට ජීවත් වන ජනතාවට සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් පණිවුඩ ලබාදීමට සහ සුනාමි අවදානමට ලක්ව ඇති ප්‍රදේශවලින් එවැනි අවස්ථාවකදී ජනතාව ආරක්ෂක ස්ථාන කරා යොමු කරවීමට ශ්‍රී ලංකා යුධ හමුදාව එකඟතාව පළ කර ඇත. යුධ හමුදාව ඉතා පුළුල් වූ සුනාමි පිළිබඳ අනතුරු ඇඟවීම සහ ආරක්ෂිත ස්ථාන කරා ජනතාව යොමු කරවීම පිළිබඳ සැලසුමක් නිර්මාණය කර ඇත.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව විසින් ගන්නා ලද තීරණයක් මත ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝගයක් මත රටේ දිස්ත්‍රික්ක 25 සඳහාම සෝදිසි සහ මුදවා ගැනීම් කණ්ඩායම් පත් කර ඇත.

සෝදිසි සහ මුදවා ගැනීම් කණ්ඩායම් සඳහා යුධ හමුදාව විසින් ඉල්ලා සිටින ලද උපකරණ වලින් කොටසක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය මුදල් සපයා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අමාත්‍යාංශයේද සහාය ඇතිව සෝදිසි සහ මුදවා ගැනීමේ කණ්ඩායම් පුහුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරමින් සිටියි.

## 7.8 ආපදා තොරතුරු දත්ත පදනම (ඩිස්ඉන්වෙන්ටර්)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් "ඩිස්ඉන්වෙන්ටර්" යන නමින් වෙබ් අඩවි පාදක ව්‍යසන තොරතුරු දත්ත පදනමක් සංස්ථාපනය කර ඇත. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙහි සහාය ලැබුණි.

1973 සිට සිදු වූ ව්‍යසන සිදුවීම් පිළිබඳ තොරතුරු වාර්තා මෙම දත්ත පදනම සතුව ඇත. මෙම දත්ත පදනම යාවත්කාලීන කිරීමේ කාර්යය 2010 වසරේ සිට හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් භාර ගෙන ඇත. 2011 දෙසැම්බර් 31 දින දක්වා සිදුවී ඇති සියළුම ව්‍යසන සම්බන්ධ තොරතුරු මෙම දත්ත පදනම වෙත සපයා ඇත.

## 7.9 ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය (ශ්‍රී.ආ.ස.ජා.)

දිස්ත්‍රික් මට්ටමින් ඇති සම්පත් පිළිබඳ තොරතුරු එක්රැස් කොට ශ්‍රී.ආ.ස.ජා. වෙත ලබා දී ඇත. ජාලය ආරම්භ කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙහි සහාය ඇතිවය. දත්ත පදනම තුළ විෂය ගණනාවක් යටතේ තොරතුරු ඇති අතර දත්ත පදනමට සපයා ඇති තොරතුරු වල වලංගුභාවය පරීක්ෂා කිරීම ඉතා අපහසු කරුණක් බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පෙනී ගොස් ඇත. දිස්ත්‍රික් මට්ටමින් පැවතිය යුතු අවම විෂයයන් සංඛ්‍යාව හඳුනා ගැනීමට සහ ඒවා යාවත්කාලීන කිරීමට සුදුසු යාන්ත්‍රණයක් හඳුනා ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අදාළ වගකිව යුතු ආයතන සමග සාකච්ඡා ආරම්භ කර ඇත.

## 7.10. වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කරනු ලැබ ඇති අතර දැන් www.dmc.gov.lk ඔස්සේ සිංහල, දෙමළ හා ඉංග්‍රිසි යන භාෂා තුනෙන්ම එම වෙබ් අඩවිය තුළින් තොරතුරු ලබා ගත හැකිය. මෙහි අන්තර්ගත තොරතුරු යාවත්කාලීන කිරීමේ සහ එයට නව තොරතුරු ලබා දීමේ හැකියාව නිසා මෙම වෙබ් අඩවිය වඩාත් ප්‍රායෝගික වී ඇත. එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා මූල්‍ය සහාය දැක්වීය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | 2011 රු. ශත. | 2010 රු. ශත. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | **05** | **432,018,709.78** | 389,105,005.71 |
| **ජංගම වත්කම්** | | | |
| ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | **06** | **1,153,375,534.22** | 1,153,375,534.22 |
| තොගයේ ඇති ව්‍යසන ප්‍රතිචාර උපකරණ | **07** | **28,507,482.40** | 11,230,122.00 |
| භාණ්ඩ ලේඛන - ලිපිද්‍රව්‍ය | **08** | **405,816.04** | 947,343.37 |
| පූර්ව ගෙවීම් සහ අත්තිකාරම් | **09** | **3,183,875.82** | 2,701,347.63 |
| වෙළඳ සහ වෙනත් අයවීමට ඇති | **10** | **1,698,323.61** | 1,426,205.25 |
| මුදල් හා මුදල් තුල්‍යයන් | **11** | **292,951.68** | 16,104,906.88 |
| | | **1,187,463,983.77** | 1,185,785,459.35 |
| **මුළු වත්කම්** | | **1,619,482,693.55** | **1,574,890,465.06** |
| **මුදල්, සංචිත සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය** | | - | - |
| සමුච්චිත අතිරික්තය/හිගය | | **(64,595,641.52)** | (51,595,758.99) |
| **සංචිත** | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රධාන | | **234,357,772.00** | 252,907,962.91 |
| ප්‍රාග්ධන ප්‍රධාන මත ආයෝජන | **12** | **(159,918,655.00)** | (189,587,190.91) |
| | | **9,843,475.48** | 11,725,013.01 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙනත් සංවිධාන වලින් ප්‍රදානයන් | **13** | **12,524,989.78** | 14,965,956.71 |
| කළමනාකරණ සන්නිවේදන ව්‍යාපෘති | **14** | **1,269,737,854.45** | 1,221,454,149.09 |
| WIP ව්‍යාපෘතිවල ආයෝජන | **15** | **323,852,262.31** | 323,852,262.31 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීමට ඇති | **16** | **69,300.00** | 1,612,082.59 |
| පාරිතෝෂික ලබාදීම | | - | - |
| වෙනත් ප්‍රතිපාදන | **17** | **206,011.56** | 206,011.56 |
| උපචිත වියදම් | **18** | **3,248,799.96** | 1,074,989.79 |
| | | **1,609,639,218.06** | 1,563,165,452.05 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **1,619,482,693.55** | **1,574,890,465.06** |
| | | - | - |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.
ඉහත ශේෂපත්‍රය මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් සමග සම්බන්ධ කොට කියවිය යුතුයි.

2011 දෙසැම්බර් මස 31 දින වන විට ආයතනයේ කටයුතු සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අතිරික්තය/(හිගය) පිළිබඳ පැහැදිලි සහ සත්‍ය අදහසක් මෙම මූල්‍ය ප්‍රකාශ වලින් ලබා දෙන බව මම සහතික කරමි. මෙම මූල්‍ය ප්‍රකාශනයන් රජයේ නීති හා රෙගුලාසි සමග අනුගත වේ.

මංජුල එස් රණසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරී/සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

එස්.එම්. මොහමඩ්
ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යංශය
දිනය

මේජර් ජෙනරල් ගාමිණී හෙට්ටිආරච්චි (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජෙනරල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

**2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2011 රු. ශත. | 2010 රු. ශත. |
|---|---|---|---|
| **ආදායම** | **01** | **73,900,000.00** | 83,070,000.00 |
| වෙනත් ආදායම් | **02** | **89,352,325.91** | 14,676,257.97 |
| | | **163,252,325.91** | 97,746,257.97 |
| පරිපාලන වියදම් | **03** | **(152,108,258.49)** | (135,221,301.38) |
| වෙනත් වියදම් | **04** | **(24,143,884.95)** | (14,973,529.90) |
| **මෙහෙයුම් වලින් අතිරික්තය/ හිගය** | | **(12,999,817.53)** | (52,448,573.31) |
| මූල්‍ය වියදම් | | **(65.00)** | (1,924.35) |
| **බදු ගෙවීමට පෙර අතිරික්තය / හිගය** | | **(12,999,882.53)** | (52,450,497.66) |
| බදු අය කිරීම් | | - | - |
| **වර්ෂය සඳහා අතිරික්තය / හිගය** | | **(12,999,882.53)** | (52,450,497.66) |

ගිණුම් කරණ ප්‍රතිපත්තීන් සහ ගිණුම් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම අනුකලන කොටසක් වේ.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය**

| | සටහන | භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රධාන | සමුච්චිත අරමුදල | එකතුව |
|---|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. | රු. ශත. |
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | | 164,267,971.75 | (17,260,568.31) | **147,007,403.44** |
| පෙර වර්ෂයේ ගැලපීම් | | - | (10,475,620.48) | **(10,475,620.48)** |
| 2010 පෙර කාලවරිච්ඡේදය සඳහා ක්‍රමක්ෂය අනුද | **A** | | 3,265,616.01 | **3,265,616.01** |
| 2010 වර්ෂය සඳහා අත්රික්තය / (හිගය) | | - | (52,450,497.66) | **(52,450,497.66)** |
| 2010 වර්ෂය සඳහා ගලපන ලද අතිරික්තය / (හිගය) | | - | (59,660,502.14) | **(59,660,502.14)** |
| 2010 වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | | 88,639,991.16 | | **88,639,991.16** |
| 2010 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන | | (189,587,190.91) | | **(189,587,190.91)** |
| 2010 වර්ෂය සඳහා ක්‍රමක්ෂය | **B** | | 29,119,827.47 | **29,119,827.47** |
| 2010 වර්ෂය සඳහා ක්ෂයවීම් ගැලපීම් | **5-3** | | (3,794,516.01) | **(3,794,516.01)** |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 63,320,772.00 | (51,595,758.99) | **15,519,529.02** |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | | 63,320,772.00 | (51,595,758.99) | **11,725,013.01** |
| | | | | **-** |
| 2011 වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | | 171,037,000.00 | - | **171,037,000.00** |
| 2011 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන | | (159,918,655.00) | - | **(159,918,655.00)** |
| 201 වර්ෂය සඳහා අතිරික්තය / (හිගය) | | - | (12,999,882.53) | **(12,999,882.53)** |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 74,439,117.00 | (64,595,641.52) | **9,843,475.48** |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ ගිණුම් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අඛණ්ඩ කොටසක් වේ.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

| 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 2011 | 2010 |
|---|---|---|
| | **Rs. Cts.** | **Rs. Cts.** |
| බදු අය කිරීමට පෙර අතිරික්තය / (හිගය) | **(12,999,882.53)** | (52,450,497.66) |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | **70,921,776.28** | 48,213,022.16 |
| පොලී ආදායම | **-** | - |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිගය)** | **57,921,893.75** | (4,237,475.50) |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්කම්** | | |
| වෙනත් අයවිය යුතු මුදල් (වර්ධනය)/අඩුවීම | **(272,118.36)** | - |
| තොග ලේඛනවල (වර්ධනය)/අඩුවීම | **541,527.33** | (31,335.66) |
| තොගයේ ඇති ආපදා ප්‍රතිචාර උපකරණ (වර්ධනය)/අඩුවීම | **(17,277,360.40)** | 138,071.00 |
| කාර්ය ප්‍රගතිය (වර්ධනය)/අඩුවීම | **-** | (48,341,908.00) |
| අත්තිකාරම් (වර්ධනය)/අඩුවීම | **(482,528.19)** | - |
| ආපසු ගෙවිය හැකි තැන්පත් සහ අත්තිකරම් (වර්ධනය)/අඩුවීම | **(1,542,782.59)** | (1,636,420.75) |
| උපචිත වියදම් වර්ධනය/(අඩුවීම) | **2,173,810.17** | 1,497,866.79 |
| | **41,062,441.71** | (52,611,202.12) |
| ආදායම් බදු ගෙවීම් | **-** | - |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **41,062,441.71** | (52,611,202.12) |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ලබා ගැනීම | **(113,835,480.36)** | (381,752,529.00) |
| පොලී ආදායම | **-** | - |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **(113,835,480.36)** | (381,752,529.00) |
| මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ලබාගැනීම් ශුද්ධ වර්ධනය | **11,118,345.00** | 99,484,670.00 |
| පරිත්‍යාග ශුද්ධ වර්ධනය | **(2,440,966.93)** | 9,653,597.00 |
| භාණ්ඩාගාර තැන්පත් ගිණුමේ ශුද්ධ වර්ධනය | **-** | 91,460,521.00 |
| ණය ගිවිසුම් - ආ.ක.ම ව්‍යාපෘති | **48,283,705.37** | 154,520,743.00 |
| ණය ගිවිසුම් - ආ.ක.ම WIP ව්‍යාපෘති | **-** | 87,816,223.00 |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **56,961,083.44** | 442,935,754.00 |
| මුදල් සහ මුදල් තුල්‍යයන් ශුද්ධ හුවමාරුවීම් | **(15,811,955.20)** | 8,572,022.88 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් තුල්‍යයන් | **16,104,906.88** | 7,532,884.00 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් තුල්‍යයන් (සටහන (අ)) | **292,951.68** | 16,104,906.88 |

**සටහන (අ) - මුදල් සහ මුදල් තුල්‍යයන්**

| | | |
|---|---|---|
| | **රු. ශත.** | **රු. ශත.** |
| බැංකුවේ ඇති මුදල් | **237,951.43** | 16,094,906.63 |
| අත් මුදල් | **55,000.25** | 10,000.25 |
| | **292,951.68** | 16,104,906.88 |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ ගිණුම් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අඛණ්ඩ කොටසක් වේ.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

**වැදගත් කළමනාකරණ ප්‍රතිපත්ති**

**1. ආයතනික තොරතුරු**

**1.1 පිහිටි ස්ථානය හා නීතිමය තත්ත්වය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු ආපදා හානි කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට සහාය දැක්වීම පිණිස 2005 අංක 13 දරණ පනත යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද සංස්ථාවකි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කොළඹ 03 ආර්.ඒ. ද මැල් මාවතේ අංක 498 දරණ ස්ථානයේ පිහිටා ඇත.

**1.2 සංස්ථාගත කිරීමේ රට**

2005 අංක 13 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

**1.3 රාජකාරි කටයුතු සිදුකරනු ලබන ප්‍රධාන ස්ථානය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය කොළඹ 03 ආර්.ඒ. ද මැල් මාවතේ අංක 498 දරණ ස්ථානයේ පිහිටා ඇත. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25 ක් පිහිටුවා තිබේ.

**1.4 ප්‍රධාන කටයුතු**

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිසා විසින් සිදු කරන ලද ව්‍යසන අවදානම ක්‍රමවත්ව කළමනාකරණය කිරීම තුළින් ප්‍රජාව තුළත් සමස්ථ ජාතිය තුළත් සුරක්ෂිතතාව පිළිබඳ සංස්කෘතියක් ගොඩ නැගීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙවර වේ.

ප්‍රජාව පෙර සූදානම ඇතිව සහ ආරක්ෂිතව සිටින බවට තහවුරු කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම වේ.

**2. ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**සාමාන්‍ය**

**2.1 අනුකූලතා ප්‍රකාශනය**
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව ආදායම් ප්‍රකාශනය, ශේෂ පත්‍රය, අරමුදල් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, සහ මූල්‍ය ප්‍රකාශනයේ සටහන් සකස් කර තිබේ.

**2.2 සූදානම් කිරීමේ පදනම**
ශ්‍රී ලංකා රුපියල්වලින් සකස් කර ඇති මෙම ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කර තිබේ. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනීය සාධක සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නැත. අවශ්‍ය ස්ථානවලදී භාවිතා කරන ලද විශේෂ ප්‍රතිපත්ති ඒවාට පහතින් දී ඇති සටහන්වල පැහැදිලි කර ඇත.

**2.3 අනුෂංගික තොරතුරු**
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිත්‍ය වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත.

**2.4 මූල්‍ය වර්ෂය**
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වර්ෂය වන්නේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂයයි.

**2.5** දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ

දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම අඩුකළ වටිනාකම හෝ තක්සේරු කළ වටිනාකමට සඳහන් කර ඇත. සින්නක්කර ඉඩම් හැර සියළුම දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවල වටිනාකම හෝ තක්සේරු කළ වටිනාකම මත, ඇස්තමේන්තුකළ ප්‍රයෝජනයට ගත හැකි කාලය අනුව වටිනාකම පහත සඳහන් පරිදි සමාන කොටස් වලින් කපා හරින ලෙසට ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන ගණන් බලා ඇත:

| | අනුපාතය (%) |
|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 2.5 |
| සුනාමි සහ කල්තබා අනතුරු ඇඟවීමේ කුළුණු | 5 |
| කාර්යාලීය උපකරණ | 10 |
| ලීබඩු සහ උපාංග | 10 |
| පරිගණක | 10 |
| වාහන | 20 |

මිලදී ගත් හෝ ඉදිකරන ලද වත්කම භාවිතයට ගත් වර්ෂයේ සිට ක්ෂයවීම සඳහා සපයා ඇත.

**2.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

1983 අංක 13 දරණ පනත අනුව එක් අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කරන සියළුම සේවකයින් සඳහා පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත.

ශේෂපත්‍ර දිනය වන විට එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් කිසිවෙක් මධ්‍යස්ථානයේ නොමැත.

**2.7 අය වීමට ඇති මුදල්**

අය වීමට ඇති මුදල් අපේක්ෂිත ප්‍රත්‍යක්ෂ කර ගත හැකි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ. වර්ෂය අවසන් වන විට හිග සියළුම මුදල් පිළිබඳ කරනු ලබන සමාලෝචනයක් පදනම් කරගෙන ලැබීමට ඇති සැක සහිත මුදල් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබේ. බොල් ණය ඒවා හඳුනාගත් වර්ෂයේදී කපා හරිනු ලැබේ.

**2.8 මුදල් හා මුදල් සමාන දේ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරණයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෙයට අත් මුදල්, බැංකුවල ඇති තැන්පතු, සහ ශුද්ධ බැංකු අයිරා ප්‍රමාණයන් අයත් වේ. ශේෂ පත්‍රයේ බැංකු අයිරාවන් ජංගම වගකීම් ලෙස ණය ගැනීම් යටතේ දක්වා ඇත.

**2.9** වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවන සිදුවීම්

ශේෂපත්‍ර දිනයෙන් පසු ඇති වන සියළුම වැදගත් සිදුවීම් සළකණු ලබන අතර අවශ්‍ය අවස්ථාවල මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

**2.10 වගකීම් සහ ප්‍රතිපාදන**

ශේෂ පත්‍ර දිනය වන විට දන්නා සියළුම වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලබන අතර පවතින බවට දන්නා, එහෙත් ප්‍රමාණය නිවැරදිව තීරණය කිරීමට නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ලබා දී ඇත.

**2.11 සේ.අ.අ. සහ සේ.නි.භා.අ සඳහා ප්‍රතිපාදන**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල යන දෙකටම දායකවීමට සේවකයින්ට හිමිකම තිබේ. ආයතනය විසින් පිළිවෙළින් 12% සහ 3% බැගින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායක වේ.

2.12 **ආදායම**

2.12.1 **පුනරාවර්තන ස්වභාවයේ ප්‍රදානයන්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 හි 19,30 සහ 31 වගන්තිවලට අනුව රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම්කරණ සහ රජයේ ආධාරය අනාවරණය කර ගැනීම, පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ආයතනය වෙත ලැබෙන මුදල් ද ආදායම් ලෙස හඳුනාගෙන ඇති අතර ආයතනය විසින් උපයා ගන්නා ලද මුදල් සෘජුවම ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

2.12.2 **ප්‍රාග්ධන ස්වභාවයේ ප්‍රදානයන්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 හි 29 සහ 31 වගන්තිවලට අනුව රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම්කරණ සහ රජයේ ආධාරය අනාවරණය කර ගැනීම, ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ආයතනය වෙත ලැබෙන මුදල් අදාළ වියදම් වාර්තා කිරීමේදී අඩු කර තිබේ.

2.13 **වියදම්**

වියදම් අතහැර ආදායම් ගණන් බැලීමේදී ආයතනය පවත්වාගෙන යාම සඳහා දරණ ලද පුනරාවර්තන ස්වභාවයේ සියළු වියදම් ආදයම් වලින් අයකරගෙන ඇත.

2.14 **භාණ්ඩ තොග**

භාණ්ඩ තොග පිරිවැයට තක්සේරු කර ඇති අතර මුලින් ලැබෙන භාණ්ඩ මුලින් නිකුත් කරන පදනමින් නිකුත් කර ඇත. භාණ්ඩ තොග අවසාන ශේෂය අවසන් වරට මිලදී ගත් මිලට ගණන් බලා ඇත.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

| මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011 | | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 01 - ආදායම** | | **රු. ශත** | රු. ශත |
| පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන | | **73,900,000.00** | 83,070,000.00 |
| | | **73,900,000.00** | 83,070,000.00 |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 වූ රජයේ ප්‍රදාන සඳහා ගිණුම් සකස් කිරීම සහ රජයේ ආධාර හෙළි කිරීම කළ යුතුය යන නියමයට අනුව මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු ප්‍රදාන හඳුනාගෙන ඇත. ප්‍රධාන ලැබුණු බවට සාධාරණ තහවුරු කිරීමක් සිදු කරන තුරු රජයේ ප්‍රදාන හඳුනා නොගත යුතු ගිණුම්කරණ ප්‍රමිතියේ නියමයයි. එමනිසා පුනරාවර්තන ප්‍රදාන ලැබීම් 2011 දෙසැම්බර් මස 31 වැනි දිනට තම ආදායම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හඳුනාගත්තේය. එනමුදු ආදායම මත සිදුවූ වියදම එය සිදුවූ පදනම මත සැළකිල්ලට ගෙන ඇත.

| **සටහන 02 - වෙනත් ආදායම්** | | **රු. ශත** | රු. ශත |
|---|---|---|---|
| UNESCAP වෙතින් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **1,184,053.36** | 303,444.50 |
| ඔක්ස්ෆෑම් වෙතින් ලැබුණු ආධාර Oxfam (පාවිච්චි කරන ලද) | | **-** | 151,220.50 |
| ලැබුණු ආධාර Chinese Govt (පාවිච්චි කරන ලද) | | **11,500.00** | 616,485.80 |
| UNDP ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **1,002,297.73** | 91,692.00 |
| ADPC ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **728,260.50** | 823,335.65 |
| ADRC ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **342,050.00** | - |
| ආසියා පදනමෙන් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **88,744.00** | 991,086.30 |
| CBSM වෙතින් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **-** | 1,757,672.91 |
| ආරක්ෂක දින පරිත්‍යාග වලින් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **1,616,468.10** | 379,399.40 |
| සාක් වෙතින් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **2,771,265.00** | 190,309.60 |
| CSE ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **8,422,303.90** | 213,210.00 |
| රතු කුරුසයෙන් ලැබුණු ආධාර (පාවිච්චි කරන ලද) | | **4,950.00** | - |
| ආ.ක.ම. (පාවිච්චි කරන ලද) | | **7,093,662.98** | 9,035,543.35 |
| ටෙන්ඩර් තැන්පතු - (ආපසු ගෙවනුලබන) | | **26,000.00** | 10,500.00 |
| වාහන පහසුකම් සඳහා රජයේ ගාස්තු | | **-** | - |
| විමර්ශන ගාස්තු | | **272,128.86** | - |
| විවිධ ආදායම් | | **16,866.50** | 112,357.96 |
| වැඩුපුර ප්‍රතිපාදන | | **220,000.00** | - |
| ප්‍රාග්ධන පුදාන මත ක්‍රමක්ෂය | **02:01** | **65,551,774.98** | - |
| | | **89,352,325.91** | 14,676,257.97 |

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011**

**සටහන 02 - වෙනත් ආදායම්**

**අනු සටහන - 02:01 වත්කම් ප්‍රදානයන් මත ක්‍රමක්ෂය** **සටහන - 02:01 (අ)**

**<u>සුනාමි සහ කල්තබා අනතුරු ඇඟවීමේ කුළුණු</u>**

| | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| **ආරම්භක ශේෂය** | **-** | **1,034,880.05** | **1,034,880.05** | **263,698,519.11** |
| වසර තුළ එකතු කිරීම් | 1,034,880.05 | - | 262,663,639.06 | - |
| **අවසාන ශේෂය** | **1,034,880.05** | **1,034,880.05** | **263,698,519.11** | **263,698,519.11** |
| **සුනාමි කුළුණු සඳහා මුළු ක්‍රමක්ෂය** | **51,744.00** | **51,744.00** | **13,184,925.96** | **13,184,925.96** |

2012 වර්ෂය ආරම්භයේ සිටම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වත්කම් මත ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කර ඇත. මෙම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 - රාජ්‍යයේ ප්‍රදානයන් සහ රජයේ අනුග්‍රහය අනාවරණය කිරීම සඳහා ගිණුම් තැබීම අනුව සිදුකර ඇත.
ඉහත ප්‍රතිපත්ති වෙනස/ දෝෂය ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂතග වෙනස්කිරීම් (2005 සංශෝධිත) යටතේ අතීතයට බලපැවැත්වෙන පරිදි යොදාගෙන ඇත.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011**

**සටහන 02 - වෙනත් ආදායම්**

**අනු සටහන - 02:01 වත්කම් ප්‍රදානයන් මත ක්‍රමක්ෂය** **සටහන - 02:01 (ඇ)**

**<u>වාහන</u>**

| | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| **ආරම්භක ශේෂය** | - | - | 43,242,560.00 | **147,998,764.82** |
| **<u>වර්ෂය තුළ එකතුකිරීම්</u>** | | | | |
| ඩබල් කැබ් | - | 23,242,560.00 | 104,756,204.82 | **73,329,343.36** |
| විධාන රථය WPLF 1101 | - | 20,000,000.00 | - | **-** |
| ලොරි රථය WPLG 8843 | - | - | - | **3,806,137.00** |
| ලෑන්ඩ් කෲසර් KI 4666 | - | - | - | **19,500,000.00** |
| Hiace වෑන් රථය | - | - | - | **17,200,000.00** |
| | - | 43,242,560.00 | 104,756,204.82 | **113,835,480.36** |
| **අවසාන ශේෂය** | - | **43,242,560.00** | **147,998,764.82** | **261,834,245.18** |
| **වාහන මත ක්‍රමක්ෂය** | - | **3,162,128.00** | **15,934,901.51** | **52,366,849.03** |

වර්ෂ 2011 දී හඳුනාගත් පරිදි සියළුම වාහන 2010 වර්ෂයේදී ලැබී තිබුණද ඒවා එම වර්ෂයේදීම ගණන් බලා නොතිබුණි එම භාණ්ඩ පහත සඳහන් පරිදි වේ:
ක්‍රමක්ෂය භාණ්ඩ ලැබුණු දිනයේ සිට ගණන් බලා ඇත

| **<u>ද්‍රව්‍යය</u>** | **<u>ලැබුණු දිනය</u>** | **<u>ප්‍රමාණය</u>** | **<u>ඒකක වටිනාකම</u>** | **<u>මුළු වටිනාකම</u>** |
|---|---|---|---|---|
| ඩබල් කැබ් | 2010.11.03 | 7 | 10,475,620.48 | 73,329,343.36 |
| ලොරි රථය WPLG 8843 | 2010.11.03 | 1 | 3,806,137.00 | 3,806,137.00 |
| ලෑන්ඩ් කෲසර් KI 4666 | 2010.11.03 | 1 | 19,500,000.00 | 19,500,000.00 |
| Hiace වෑන් රථය | 2010.11.03 | 2 | 8,600,000.00 | 17,200,000.00 |
| | | | **42,381,757.48** | **113,835,480.36** |

2012 වර්ෂය ආරම්භයේ සිටම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වත්කම් මත ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කර ඇත. මෙම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 - රාජ්‍යයේ ප්‍රදානයන් සහ රජයේ අනුග්‍රහය අනාවරණය කිරීම සඳහා ගිණුම් තැබීම අනුව සිදුකර ඇත.
ඉහත ප්‍රතිපත්ති වෙනස/ දෝෂය ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂනග වෙනස්කිරීම් (2005 සංශෝධිත) යටතේ අතීතයට බලපැවැත්වෙන පරිදි යොදාගෙන ඇත.

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

| **මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011** | **2011** | 2010 |
|---|---|---|
| **සටහන 03 - පරිපාලන වියදම්** | **රු. ශත** | **රු. ශත** |
| **කාර්ය මණ්ඩල වැටුප්** | | |
| වැටුප් හා වේතන | **35,449,095.82** | 39,808,731.40 |
| සේ.අ.අ. ආයතනයේ දායකත්වය 12% | **3,561,913.37** | - |
| සේ.නි.භා අ. ආයතනයේ දායකත්වය 3% | **887,131.08** | - |
| අතිකාල | **1,245,215.88** | 540,101.82 |
| සංචාර - දේශීය | **1,059,956.32** | 1,057,183.97 |
| සංචාර - විදේශීය | **1,274,762.30** | 1,182,402.55 |
| **සැපයුම්** | | |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ | **3,783,582.49** | 1,702,022.00 |
| ඉන්ධන | **5,438,746.53** | 3,028,340.19 |
| සංග්‍රහ කටයුතු | **137,889.53** | 104,636.21 |
| පුවත්පත් හා වෙනත් | **73,805.00** | 39,015.00 |
| **නඩත්තු වියදම්** | | |
| වාහන | **6,343,765.10** | 3,933,668.90 |
| පිරියත, යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ | **1,648,527.87** | 1,062,242.43 |
| **සේවා** | | |
| ප්‍රවාහන කටයුතු | **508,350.90** | 11,770,646.58 |
| තැපැල් සහ සංනිවේදන | **4,532,549.99** | 3,925,048.08 |
| ජලය සහ විදුලිය | **2,987,276.14** | 373,232.08 |
| බදු කුලී සහ දේශීය බදු | **10,979,229.43** | 17,611,265.52 |
| සනීපාරක්ෂක සේවා | **152,190.96** | - |
| වෙළඳ දැන්වීම් | **980,763.00** | 455,940.00 |
| විමර්ශන ගාස්තු | **375.00** | - |
| පරිවර්තන ගාස්තු | **141,355.50** | 213,802.49 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | **-** | 200,000.00 |
| **ක්ෂයවීම්** | | |
| සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීම් කුළුණ | **13,184,925.96** | 13,184,925.96 |
| කාර්යාලීය උපකරණ | **1,968,892.42** | 5,428,343.24 |
| ලීබඩු සහ උපාංග | **379,996.08** | - |
| වාහන | **52,366,849.04** | 29,599,752.96 |
| පරිගණක | **3,021,112.78** | - |
| | **152,108,258.49** | 135,221,301.38 |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011**

| සටහන 04 - වෙනත් වියදම් | | 2011<br>රු. ශත | 2010<br>රු. ශත |
|---|---|---|---|
| UNESCAP ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **1,184,053.36** | 13,394.50 |
| ඔක්ස්ෆෑම් ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **-** | 151,220.50 |
| චීන රජයේ ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **11,500.00** | 616,485.80 |
| එ.ජා.සං.අ. ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **1,002,297.73** | 91,692.00 |
| ADPC ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **728,260.50** | 823,335.65 |
| ADRC ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **342,050.00** | - |
| ආසියා පදනමේ ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **88,744.00** | 891,668.55 |
| CBSM ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **-** | 1,757,672.91 |
| ජාතික ආරක්ෂක දින ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **1,616,468.10** | 379,399.40 |
| සාක් ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **2,771,265.00** | 190,309.60 |
| CSE ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **8,422,303.90** | 213,210.00 |
| රතු කුරුස ආධාර වලින් සිදු කරන ලද වියදම් | | **4,950.00** | - |
| ආ.ක.ජා.ස. වියදම් | **04:01** | **7,093,662.98** | 9,424,863.35 |
| වෙනත් | | **878,329.38** | 420,277.64 |
| | | **24,143,884.95** | 14,973,529.90 |

**සටහන - 04:01**

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011**

| සටහන 04:01-ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව | 2011<br>රු. ශත | 2010<br>රු. ශත |
|---|---|---|
| **<u>මෙහෙයුම් ආදායම</u>** | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | **7,093,662.98** | 8,989,043.35 |
| **<u>මෙහෙයුම් වියදම්</u>** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | **-** | 404,193.12 |
| සැපයුම් | **-** | 54,829.50 |
| ගිවිසුම්මය සේවා | **-** | 271,974.54 |
| වෙනත් පුනරාවර්තන වියදම් | **408,176.22** | 487,178.00 |
| ආපදා සහන සේවය - දිස්ත්‍රික් ලේකම් කාර්යාල | **6,685,486.76** | 8,206,688.19 |
| | **7,093,662.98** | 9,424,863.35 |

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011

සටහන 05 - දේපළ, යන්ත්‍ර සහ උපකරණ

| **වත්කම්** | | | 2011.01.01 දිනට මුළු වියදම | වසර තුළ එකතුවීම් | පෙර වර්ෂයේ ගැලපීම් | 2011.12.31 දිනට මුළු වියදම | WD Value as at 01.01.2011 |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. |
| සුනාමි සහ කල්තබා අනතුරු ඇඟවීමේ කුළුණු | | 5% | **263,698,519.11** | - | | **263,698,519.11** | 250,513,593.15 |
| කාර්යාලීය උපකරණ | **05:01** | 10% | **49,900,052.02** | (30,211,127.78) | | **19,688,924.24** | 36,051,650.02 |
| ලීබඩු සහ උපාංග | **05:02** | 10% | **3,799,960.84** | - | | **3,799,960.84** | 2,789,185.83 |
| වාහන | **05:03** | 20% | **147,998,764.82** | 113,835,480.36 | | **261,834,245.18** | 99,750,576.71 |
| පරිගණක | **05:04** | 10% | **-** | 30,211,127.78 | | **30,211,127.78** | - |
| | | | **465,397,296.79** | 113,835,480.36 | - | **579,232,777.15** | 389,105,005.71 |

| **ක්ෂයවීම්** | | 2011.01.01 දනට උපචිත තැත්පතු | වර්ෂය සඳහා තැත්පතු | පෙර වර්ෂයේ ගැලපීම් | 2011.12.31 දනට උපචිත තැත්පතු | WD Value as at 31.12.2011 |
|---|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත. | රු. ශත | රු. ශත |
| සුනාමි සහ කල්තබා අනතුරු ඇඟවීමේ කුළුණු | 5% | 13,184,925.96 | 13,184,925.96 | | **26,369,851.92** | 237,328,667.19 |
| කාර්යාලීය උපකරණ | 10% | 13,848,402.00 | 1,968,892.42 | | **15,817,294.42** | 3,871,629.82 |
| ලීබඩු සහ උපාංග | 10% | 1,010,775.01 | 379,996.08 | | **1,390,771.09** | 2,409,189.75 |
| වාහන | 20% | 44,453,672.11 | 52,366,849.04 | 3,794,516.01 | **100,615,037.16** | 161,219,208.02 |
| පරිගණක | 10% | - | 3,021,112.78 | | **3,021,112.78** | 27,190,015.00 |
| | | 72,497,775.08 | 70,921,776.28 | 3,794,516.01 | **147,214,067.37** | 432,018,709.78 |

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011 | අනු සටහන 05:01

සටහන 05 - දේපළ, යන්ත්‍ර සහ උපකරණ

| අනු සටහන - 05:01 කාර්යාලීය උපකරණ භාණ්ඩය | | 2011.12.31 දිනට මුළු පිරිවැය | 2011.12.31 දිනට මුළු පිරිවැය |
|---|---|---|---|
| ප්‍රවේශ ශීර්ෂය | | **16,500.00** | 16,500.00 |
| Paper Shedder | | **9,791.00** | 9,791.00 |
| HPලේසර් ජෙට් පරිගණක මුද්‍රණ යන්ත්‍රය | | **13,500.00** | 13,500.00 |
| ඡායා පිටපත් යන්ත්‍රය | | **189,750.00** | 189,750.00 |
| ප්‍රක්ෂේපණ යන්ත්‍රය | | **5,056,820.20** | 5,056,820.20 |
| ෆැක්ස් යන්ත්‍රය | | **677,512.50** | 677,512.50 |
| ඡායා පිටපත් යන්ත්‍රය | | **1,530,250.00** | 1,530,250.00 |
| ඡායා පිටපත් යන්ත්‍රය | | **135,000.00** | 135,000.00 |
| කැමරා | | **1,121,434.95** | 1,121,434.95 |
| මෙගාෆෝන් | | **3,056,105.00** | 3,056,105.00 |
| රූපවාහිනී යන්ත්‍ර | | **1,776,749.61** | 1,776,749.61 |
| සීඩී පද්ධතිය | | **367,500.00** | 367,500.00 |
| ඩුප්ලෝ පිටපත් යන්ත්‍රය | | **514,050.00** | 514,050.00 |
| ජී.පී.එස්. | | **677,600.00** | 677,600.00 |
| HPලේසර් ජෙට් පරගණක මුද්‍රණ යන්ත්‍රය | | **531,497.75** | 531,497.75 |
| World Space ගුවන් විදුලි යන්ත්‍ර | | **575,120.00** | 575,120.00 |
| HPලේසර් ජෙට් පරිගණක මුද්‍රණ යන්ත්‍රය - වර්ණ | 1 | **347,000.00** | 347,000.00 |
| HP Designet 500+ පරිගණක මුද්‍රණ යන්ත්‍රය | | **285,500.00** | 285,500.00 |
| PA පද්ධතිය | | **1,530,697.13** | 1,530,697.13 |
| ආරක්ෂිත ආධාරකය | | **109,681.75** | 109,681.75 |
| ආරක්ෂිත ආධාරකය | | **17,708.99** | 17,708.99 |
| දුරකථන | | **-** | - |
| - සන්ටෙල් | | **75,000.00** | 75,000.00 |
| - ටෙලිකොම් දුරකථන | | **230,000.00** | 230,000.00 |
| - CDMA දුරකථන | | **147,200.00** | 147,200.00 |
| - CDMA දුරකථන | | **60,000.00** | 60,000.00 |
| - දුරකථන | | **23,466.36** | 23,466.36 |
| විදුලි පංකා | | **5,250.00** | 5,250.00 |
| ප්‍රාංකන පද්ධතිය | 1 | **483,720.00** | 483,720.00 |
| සිංගර් ශීතකරණය | | **44,290.00** | 44,290.00 |
| බොයිලේරුව | | **4,800.00** | 4,800.00 |
| සීලිං විදුලි පංකා | | **3,400.00** | 3,400.00 |
| කාර්යාලීය උපකරණ | | **8,055.00** | 8,055.00 |
| ඇඟලි සළකුණු යන්ත්‍රය | | **61,600.00** | 61,600.00 |
| FR & E Code | 6 | **1,549.00** | 1,549.00 |
| ස්පීකර් | 1 | **825.00** | 825.00 |
| | | **19,688,924.24** | **19,688,924.24** |

-

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011** **අනු සටහන 05:02**

**සටහන 05 - දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ**

**අනු සටහන - 05:02 ලී බඩු සහ උපාංග**

| භාණ්ඩය | ප්‍රමාණය | 2011<br>2011.12.31<br>දිනට මුළු පිරිවැය | 2010<br>2010.12.31<br>දිනට මුළු පිරිවැය |
|---|---|---|---|
| ලියන මේසය | 29 | **319,093.47** | 319,093.47 |
| කෑම මේසය | 4 | **21,907.00** | 21,907.00 |
| ෆයිල් කැබිනට් | 35 | **349,593.02** | 349,593.02 |
| උස ඇන්ද සහිත පුටු - විධායක ශ්‍රේණි සඳහා | 19 | **133,004.47** | 133,004.47 |
| යතුරු ලියන්නන් සඳහා පුටු | 20 | **105,614.98** | 105,614.98 |
| කෑම මේස පුටු | 12 | **36,195.00** | 36,195.00 |
| සම්මන්ත්‍රණ මේස | 2 | **33,871.49** | 33,871.49 |
| ලියන මේස | 20 | **170,293.53** | 170,293.53 |
| පරිගණක මේස | 11 | **85,807.50** | 85,807.50 |
| ඇඩි පුටුව | 24 | **73,041.06** | 73,041.06 |
| පුස්තකාල කැබිනට් | 3 | **50,850.00** | 50,850.00 |
| තට්ටු 3 ක් සහිත කාර්යාලීය කබඩ් | 23 | **242,350.03** | 242,350.03 |
| Half Cupboard file cabinet | 3 | **27,608.00** | 27,608.00 |
| පිටුපස ඇන්ද උස පුටු | 14 | **104,150.04** | 104,150.04 |
| ලියන මේස | 4 | **60,651.00** | 60,651.00 |
| පරිගණක පුටු | 16 | **52,842.00** | 52,842.00 |
| වානේ කැබිනට් | 2 | **19,055.50** | 19,055.50 |
| L.P.Ex:Table 52x76 cm cur.top with p.Draw. | 5 | **50,287.50** | 50,287.50 |
| L.P.Ex.Table 183x91cm cur.top with p.draw | 1 | **11,335.50** | 11,335.50 |
| L.P.site Table 12x61 cm | 1 | **6,030.00** | 6,030.00 |
| බහු කාර්ය ආධාරක මේස | 1 | **345.70** | 345.70 |
| විදුරු තට්ටුව සහිත තේ මේස | 1 | **6,588.00** | 6,588.00 |
| ප්‍රින්ස් සෝෆා සෙට් | 1 | **48,069.00** | 48,069.00 |
| Ex,chairs Mid Back | 5 | **33,750.00** | 33,750.00 |
| Ex, charis cover black | 8 | **44,266.50** | 44,266.50 |
| LP Junior Ex.table | 3 | **23,935.50** | 23,935.50 |
| තට්ටු 3 ක් සහිත එහා මෙහා ගෙන යා හැකි කැබිනට් | 9 | **50,139.00** | 50,139.00 |
| රෙදි ඇඳි පුටුව | 8 | **22,500.00** | 22,500.00 |
| CPU & UPS සඳහා එහා මෙහා ගෙනයාහැකි කැබිනට් | 3 | **10,147.50** | 10,147.50 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය රාක්ක | 1 | **6,826.50** | 6,826.50 |
| ආරක්ෂිත පෙට්ටි | 2 | **2,500.00** | 2,500.00 |
| ස්විච් බෝඩ් | 1 | **10,746.00** | 10,746.00 |
| රාක්ක | 10 | **1,319,050.00** | 1,319,050.00 |
| තට්ටු 2 ක් සහිත ඇඳ | 4 | **29,300.00** | 29,300.00 |
| මෙට්ට | 8 | **16,776.80** | 16,776.80 |
| මිටි ඇන්ද සහිත පුටු | 8 | **32,138.99** | 32,138.99 |
| විධායක මේස | 1 | **94,453.63** | 94,453.63 |
| ප්ලාස්ටික් පුටු | 14 | **5,390.63** | 5,390.63 |
| වානේ කබඩ් | 3 | **26,836.00** | 26,836.00 |
| වානේ මේස | 4 | **25,760.00** | 25,760.00 |
| ලී පුටු | 8 | **15,300.00** | 15,300.00 |
| වයිට් බෝඩ් | 2 | **2,160.00** | 2,160.00 |
| කාර්යාලීය පුටු | 4 | **7,700.00** | 7,700.00 |
| ආධාරකය සහිත විදුලි පංකා | 2 | **11,700.00** | 11,700.00 |
| | | **3,799,960.84** | 3,799,960.84 |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011** **අනු සටහන 05:03**

**සටහන 05 - දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ**

**අනු සටහන - 05:03 මෝටර් වාහන**

| | ප්‍රමාණය | 2011.01.01 දිනට මුළු පිරිවැය රු. ශත | වර්ෂය තුළ එකතු කිරීම් රු. ශත | 2011.01.11 දිනට මුළු පිරිවැය රු. ශත |
|---|---|---|---|---|
| ඩබල් කැබ් රථ | **27** | **127,998,764.82** | 73,329,343.36 | **201,328,108.18** |
| විධාන රථය WPLF 1101 | **01** | **20,000,000.00** | - | **20,000,000.00** |
| ලොරි රථය WPLG 8843 | **01** | **-** | 3,806,137.00 | **3,806,137.00** |
| ලෑන්ඩ් කෲසර් KI 4666 | **01** | **-** | 19,500,000.00 | **19,500,000.00** |
| Hiace වෑන් රථය | **02** | **-** | 17,200,000.00 | **17,200,000.00** |
| | | **147,998,764.82** | 113,835,480.36 | **261,834,245.18** |

වර්ෂය තුළ සියළුම එකතුකිරීම් 2010 නොවැම්බර් 03 දින භෞතිකවම ආ.ක.ම. වෙත ලැබී ඇත. ක්ෂයවීම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ

| <u>වර්ෂය තුළ ක්ෂයවීම්</u> | ලැබුණු දිනය | ක්ෂයවීම් | |
|---|---|---|---|
| **2010 වර්ෂය සඳහා ක්ෂයවීම්** | | | |
| ඩබල් කැබ් | **2010.11.03** | 2,444,311.45 | |
| ලොරි රථය WPLG 8843 | **2010.11.03** | 126,871.23 | |
| ලෑන්ඩ් කෲසර් KI 4666 | **2010.11.03** | 650,000.00 | |
| Hiace වෑන් රථය | **2010.11.03** | 573,333.33 | |
| | | **3,794,516.01** | |
| **2011 වර්ෂය සඳහා ක්ෂයවීම්** | | | |
| ඩබල් කැබ් | | 40,265,621.64 | |
| විධාන රථය WPLF 1101 | | 4,000,000.00 | |
| ලොරි රථය WPLG 8843 | | 761,227.40 | |
| ලෑන්ඩ් කෲසර් KI 4666 | | 3,900,000.00 | |
| Hiace වෑන් රථය | | 3,440,000.00 | **52,366,849.04** |
| **වාහන මත සමස්ථ ක්ෂයවීම්** | | | **52,366,849.04** |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011** **අනු සටහන 05:04**

**සටහන 05 - දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ**

| **අනු සටහන - 05:04 පරගණක භාණ්ඩය** | | **2011.12.31 දිනට මුළු පිරිවැය** | **2010.12.31 දිනට මුළු පිරිවැය** |
|---|---|---|---|
| **<u>පරිගණක සහ උපාංග</u>** | | | |
| මෝටර්සයිකල් | | **59,500.00** | 59,500.00 |
| බයිසිකල් | | **8,185.00** | 8,185.00 |
| HP නෝට්බුක් සහ FDD | | **5,594,241.31** | 5,594,241.31 |
| HP නෝට්බුක් සහ FDD | | **37,300.00** | 37,300.00 |
| ලැප්ටොප් පරිගණක | 20 | | |
| ඩෙස්ක් ටොප් පරිගණක | 39 | **13,467,051.79** | 13,467,051.79 |
| UPS | | **154,070.41** | 154,070.41 |
| IBM A51 පරිගණක | | **72,500.00** | 72,500.00 |
| HP ලේසර් ජෙට් මුද්‍රණ යන්ත්‍ර | | **82,500.00** | 82,500.00 |
| HP ලේසර් ජෙට් මුද්‍රණ යන්ත්‍ර | | **100,600.00** | 100,600.00 |
| UPS | | **85,000.00** | 85,000.00 |
| IBM A51 පරිගණක | | **6,234,752.03** | 6,234,752.03 |
| IBM A51 පරිගණක | | **1,320,000.00** | 1,320,000.00 |
| IBM A51 පරිගණක | | **2,569,333.40** | 2,569,333.40 |
| ස්කෑනර් | | **269,950.00** | 269,950.00 |
| පෙන් ඩ්‍රයිව් | | **61,200.00** | 61,200.00 |
| පරිගණක මොඩෙම් | | **2,850.00** | 2,850.00 |
| UPS බැටරි | | **13,923.84** | 13,923.84 |
| UPS | | **22,400.00** | 22,400.00 |
| ඉන්වෙන්ටරි පාලන පද්ධතිය | | **49,000.00** | 49,000.00 |
| රවුටර් | 1 | **6,770.00** | 6,770.00 |
| | | **30,211,127.78** | **30,211,127.78** |

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011**

**සටහන 06 - වැඩ සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘති**

2011 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක වෙමින් පවතින පහත සඳහන් ව්‍යාපෘති මෙම සටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ලෙස දක්වා ඇත. එක් එක් ව්‍යාපෘතිය පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

**වැය ශීර්ෂ අංකය 106-3-2-05-2201 - දිස්ත්‍රික්කවල ව්‍යසනවල බලපෑම අවම කිරීම සඳහා ආපදා හානි අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

| ව්‍යාපෘතිය | ස්වභාවය | දිස්ත්‍රික්කය | 2011 ප්‍රතිපාදන (රු.) | මුළු ගෙවීම් රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | රු. ශත. | රු. ශත. | |
| අගුනකොලපැලැස්ස ගුරුන්නැහැගේ ආර කුඩා පාලමක් ඉදි කිරීම | ගංවතුර | හම්බන්තොට | 3,994,922.87 | 3,994,922.87 | 80% |
| වීරකැටිය කන්දමඩිත්ත මුරුතවෙල ප්‍රධාන ඇල හරහා කුඩා පාලමක් ඉදි කිරීම | ගංවතුර | හම්බන්තොට | 4,137,599.18 | 4,137,599.18 | 25% |
| හෙලකඩ මගී පාලමක් ඉදි කිරීම | ගංවතුර | හම්බන්තොට | 2,515,647.65 | 2,515,647.65 | 90% |
| දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ වැසි වතුර කළමනාකරණ ව්‍යාපෘතිය | ගංවතුර | මාතර | 6,640,000.00 | 6,640,000.00 | 42% |
| ලුණුගම්වෙහෙර තෙළුම්පොකුණ ඇළ පුනරුත්ථාපනය කිරීම | නිග | හම්බන්තොට | 2,700,000.00 | 2,700,000.00 | 85% |
| රම්මල ක.වි. සඳහා පැති බැම්මක් ඉදි කිරීම | නාය යෑම් | හම්බන්තොට | 1,999,993.36 | 1,999,993.36 | 72% |
| | | | | **21,988,163.06** | |

**වැය ශීර්ෂ අංක 106-3-2-11-2201- අම්පාර, මඩකලපුව, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්ක සඳහා ගංවතුර හානි අවම කිරීමේ ව්‍යාපෘති (ආ.ක.ම)**

| | ස්වභාවය | දිස්ත්‍රික්කය | 2011 ප්‍රතිපාදන (රු.) | මුළු ගෙවීම් රු. | |
|---|---|---|---|---|---|
| | | | රු. ශත. | රු. ශත. | |
| මඩකලපුව සඳහා ගංවතුර හානි අවම කිරීමේ ව්‍යාපෘති | ගංවතුර | මඩකලපුව | 1,000,000.00 | 1,000,000.00 | 45% |
| පොළොන්නරුව සඳහා ගංවතුර හානි අවම කිරීමේ ව්‍යාපෘති | ගංවතුර | පොළොන්නරුෑ | 15,715,010.00 | 15,715,010.00 | 78% |
| අම්පාර සඳහා ගංවතුර හානි අවම කිරීමේ ව්‍යාපෘති | ගංවතුර | අම්පාර | 4,750,000.00 | 4,750,000.00 | 80% |
| | | | | **21,465,010.00** | |

100% ක්ම ගෙවීම් සිදු කර ඇති නිසා ඉහත සඳහන් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා මෙම සටහනේ දක්වා ඇතුවාට වඩා වෙනත් ගිණුම්කරණ ගැලපීම් කිසිවක් සිදු කර නැත.

| | රු. ශත. |
|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,342,962,725.13 |
| ගත වූ වර්ෂය තුළ | (189,587,190.91) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,153,375,534.22** |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

### මූල්‍ය ප්‍රකාශනයේ සටහන් - 2011

**සටහන 07 - තොගයේ ඇති ආපදා ප්‍රතිචාර උපකරණ**

| භාණ්ඩය | 2011 ප්‍රමාණය | 2011 මුළු වටිනාකම රු. ශත. | 2010 ප්‍රමාණය | 2010 ප්‍රමාණය රු. ශත. |
|---|---|---|---|---|
| දම්වැල් කියත | **30** | **991,200.00** | 14 | 951,405.00 |
| එන්ජිම සහිත බෝට්ටු | **0** | **-** | 10 | 4,020,678.50 |
| කොල්ලෑව සහිත ඔරුව | **0** | **-** | 50 | 6,258,038.50 |
| බෝට්ටු ඇන්ජිම | **8** | **2,724,000.00** | | - |
| බෝට්ටු ප්‍රවාහනය කරන ට්‍රේලරය | **2** | **364,800.00** | | - |
| 2" වතුර පොම්ප | **5** | **277,200.00** | | - |
| වතුර බව්සර් | **2** | **9,820,000.00** | | - |
| ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් | **4** | **4,760,000.00** | | - |
| සයිරන් තලා සහිත මෙගා ෆෝන් | **400** | **985,600.00** | | - |
| විදුලි සයිරන් තලා | **30** | **5,644,800.00** | | - |
| අත්න් ක්‍රියා කරන සයිරන් තලා | **45** | **1,054,922.40** | | - |
| වර්ෂාමාන | **1000** | **1,884,960.00** | | - |
| **මුළු වටිනාකම** | | **28,507,482.40** | | **11,230,122.00** |

රු. 11,230,122.00 ක් වූ පසුගිය වසරේ ආපදා ප්‍රතිචාර තොගයේ වටිනාකම, එම භාණ්ඩ වර්ෂය තුළ බෙදාදී තිබූ නිසා වැය ශීර්ෂ 06 ට මාරු කර තිබේ.

- -

## ආපද කළමනාකරණ මධ්‍යස්ථානය

### මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011

| සටහන 08 - තොග ලේඛන ලිපිද්‍රව්‍ය | 2011<br>රු. ශත | 2010<br>රු. ශත |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය | **102,006.45** | 128,959.09 |
| පරිගණක ටෝනර් | **134,400.00** | 490,996.34 |
| අත් පත්‍රිකා | **111,830.04** | 245,440.44 |
| පෝස්ටර් | **57,579.55** | 81,947.50 |
| මුළු එකතුව | **405,816.04** | 947,343.37 |

| සටහන 09 - නැවත ගෙවීම් සහ අත්තිකාරම් | රු. ශත | රු. ශත |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | **120,499.97** | 41,328.25 |
| ප්‍රධාන කාර්යාලය අත්තිකාරම් | **197,600.66** | 3,000.00 |
| දිස්ත්‍රික් අත්තිකාරම් | **51,303.00** | 53,200.00 |
| පෙරසූදානම් සැලසුම්කරණ අත්තිකාරම් | **986,356.30** | 91,680.00 |
| ඉන්ධන අත්තිකාරම්s - දිස්ත්‍රික් | **692,187.52** | 151,849.00 |
| ඉන්ධන අත්තිකාරම්s - වෙනත් | **-** | - |
| CSE අත්තිකාරම් | **340,000.00** | - |
| දැයට කිරුළ අත්තිකාරම් | **-** | - |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අත්තිකාරම් | **652,728.37** | 2,238,090.38 |
| ආසියා පදනම අත්තිකාරම් | **122,200.00** | 122,200.00 |
| ADPC අත්තිකාරම් | **-** | - |
| මුද්දර අත්තිකාරම් | **21,000.00** | - |
| හඳුනා නොගත් වියදම් | **-** | - |
| | **3,183,875.82** | 2,701,347.63 |

| සටහන 10 - වෙළඳ සහ වෙනත් අයවිය යුතු | රු. ශත | රු. ශත |
|---|---|---|
| ඩොන්ගල් සඳහා තැන්පතු | **3,000.00** | 3,000.00 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා තැන්පතු | **1,407,600.00** | 1,407,600.00 |
| අයවිය යුතු වෙනත් | **287,723.61** | 15,605.25 |
| | **1,698,323.61** | 1,426,205.25 |

| සටහන 11 - මුදල් හා මුදල් තුල්‍යය | රු. ශත | රු. ශත |
|---|---|---|
| ලංකා බැංකුව - ජංගම ගිණුම | | |
| ප්‍රාග්ධන ගිණුම - 2744646 | **237,951.43** | 16,094,906.63 |
| පුණරාවර්තන ගිණුම | **-** | - |
| අත් මුදල් | **55,000.25** | 10,000.25 |
| | **292,951.68** | 16,104,906.88 |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

| මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011 | **2011** | 2010 |
|---|---|---|
| **සටහන 12 - ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන** | | |
| **ප්‍රාග්ධන වියදම්** | **රු. ශත** | **රු. ශත** |
| පුහුණු සහ හැකියා වර්ධන | **-** | - |
| දිස්ත්‍රික්කවල ආපදා හානි අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (ආ.ක.ම.) | **120,807,192.64** | 113,605,599.72 |
| පළාත් පාලන ආයතනවල ආපදාවලට ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීම සඳහා උපකරණ | **11,491,012.74** | - |
| හදිසි ගංවතුර තත්ත්වයන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම (අ.ක.ම.) | **81,576.74** | - |
| පෙර සූදානම් සැලසුම් සකස් කිරීමට රාජ්‍ය ආයතනවලට උපකාර කිරීම (ආ.ක.ම.) | **1,924,352.25** | - |
| ආපදා පෙර සූදානම් සහ කල්තබා අනතුරු ඇඟවීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | **1,000,000.00** | - |
| අනුරාධපුර, මඩකලපුව, පොළොන්නරුව, සහ පුත්තලම දිස්ත්‍රික්ක සඳහා ගංවතුර හානි අවම කිරීමේ ව්‍යාපෘති(ආ.ක.ම.) | **17,948,383.31** | 75,981,591.19 |
| වෙනත් ප්‍රධාන ව්‍යාපෘති (ආ.ක.ම.) | **18,450.00** | - |
| ශ්‍රී ලංකා ආපදා අවදානම් කළමනාකරණ හැකියා වර්ධනය - එ.ජා.සං.වැ. (ආ.ක.ම.) | **58,916.34** | - |
| නාය යෑම් සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (ජා.ගො.ප.ආ.) | **6,588,770.98** | - |
| | **159,918,655.00** | **189,587,190.91** |
| **ප්‍රාග්ධන ප්‍රදාන මත ශුද්ධ ආයෝජන** | **(159,918,655.00)** | (189,587,190.91) |

## ආපද කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011**

| **සටහන 13 - වෙනත් ආයතන වලින් ලැබුණු ප්‍රදාන** | **2011** රු. ශත | 2010 රු. ශත |
|---|---|---|
| UNESCAP | **-** | - |
| UNESCAP - Old | **-** | 176,185.24 |
| ඔක්ස්ෆෑම් | **1,105,729.22** | 1,105,729.22 |
| චීන රජය | **-** | 47,252.44 |
| එ.ජා.සං.වැ | **430,382.40** | 1,113,594.60 |
| ඉටැලියන් එක්සර්සයිස් | **-** | 971,780.00 |
| වර්ල්ඩ් විෂන් ලංකා | **-** | 15,000.00 |
| ADPC | **273,696.31** | 801,956.81 |
| ADRC | **339,000.00** | 343,014.95 |
| ආසියා පදනම | **150,334.95** | 239,078.95 |
| CBSM | **-** | 5,455.09 |
| ආරක්ෂක දින පරිත්‍යාග -2011/2010 | **536,000.00** | 446,468.10 |
| සාක් | **-** | 664,356.65 |
| CSE | **8,284,885.90** | 9,021,867.40 |
| රතු කුරුස | **9,267.26** | 14,217.26 |
| සාක් ආ.ක.ම. | **79,259.15** | - |
| තොරතුරු තාක්ෂණය උපකරණ මිලදී ගැනීම A/C | **1,316,434.59** | - |
| | **12,524,989.78** | 14,965,956.71 |

| **සටහන 14 - කළමනාකරණ සංනිවේදන ව්‍යාපෘති** | රු. ශත | රු. ශත |
|---|---|---|
| භාණ්ඩාගාර සංරචකය | **568,359,671.09** | 616,515,611.00 |
| විදේශ සංරචකය | **701,378,183.36** | 637,323,981.55 |
| | **1,269,737,854.45** | 1,253,839,592.55 |

| **සටහන 15 - WIP ව්‍යාපෘති සඳහා ආයෝජන** | රු. ශත | රු. ශත |
|---|---|---|
| භාණ්ඩාගාර සංරචකය | **44,259,006.64** | 44,259,006.64 |
| විදේශ සංරචකය | **279,593,255.67** | 279,593,255.67 |
| | **323,852,262.31** | 323,852,262.31 |

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2011**

| සටහන 16 - වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 2011<br>රු. ශත | 2010<br>රු. ශත |
|---|---|---|
| කේ.කේ.එස්. ආරක්ෂක තැන්පතු | **7,200.00** | 4,680.00 |
| ගෙවීමට ඇති WHT | **-** | 1,498,262.59 |
| මුද්දර බද්ද | **2,100.00** | - |
| උපයන විට ගෙවීම් සහ SRL | **-** | - |
| ටෙන්ඩර් තැන්පතු - ආපසු ගෙවන | **60,000.00** | 109,140.00 |
| | **69,300.00** | 1,612,082.59 |

| සටහන 17 - වෙනත් ප්‍රතිපාදන | රු. ශත | රු. ශත |
|---|---|---|
| තොග හානිවීම් සඳහා ප්‍රතිපාදන | **206,011.56** | 206,011.56 |
| | **206,011.56** | 206,011.56 |

2007 ජූනි 07 වැනි දින වේයන්ගොඩ ආ.ක.ම. ගබඩාවෙන් රු. 206,011.56 ක් වටිනා ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ නැතිවී ඇත. එම නැතිවූ භාණ්ඩ භාරව සිටි නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ. විමර්ශනයෙන් සොයාගත් කරුණු අනුව එම නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව අවසන් කර තිබේ. 2011.12.31 දින විත විට අධිකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

| සටහන 18 - උපචිත වියදම් | රු. ශත | රු. ශත |
|---|---|---|
| සේවක වැටුප් | **-** | 17,250.00 |
| අතිකාල | **71,151.38** | 51,969.96 |
| ගමන් වියදම් - දේශීය | **66,560.50** | 122,706.42 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | **138,476.90** | - |
| දීමනා | **-** | 912.00 |
| ඉන්ධන | **321,320.48** | 75,605.00 |
| නඩත්තු - වාහන | **1,545,793.23** | - |
| නඩත්තු - යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් උපකරණ | **68,024.24** | - |
| කුලී සහ දේශීය බදු | **31,250.00** | 12,250.00 |
| තැපැල් සහ සන්නිවේදන | **244,372.07** | 352,462.26 |
| විදුලිය සහ ජලය | **244,466.66** | 16,178.31 |
| වෙනත් සේවා | **517,384.50** | 25,655.84 |
| විගණන ගාස්තු | **-** | 400,000.00 |
| | **3,248,799.96** | 1,074,989.79 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. ඩීර්/ඒ/ඩීඑම්සී/එෆ්ඒ/2011 | ඔබේ අංකය / உமது இல / No. | දිනය / திகதி / Date 2012 දෙසැම්බර් 11 දින |

අධ්‍යක්ෂ ජනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2012 සැප්තැම්බර් 26 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය


| | | |
|---|---|---|
| අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka |
| දුරකථනය / தொலைபேசி / Telephone. 2887220 | ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221 | ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk |

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ එහි කාර්යයන්

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට බලය ලැබී ඇති අතර, එම මධ්‍යස්ථානයේ කර්තව්‍යයන් පහත දැක්වේ.

(අ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පිළියෙල කිරීමට සහායවීම.

(ආ) අනෙකුත් ආයතනවලින් සිදු කෙරෙන ව්‍යසන කළමනාකරණ සැලසුම් වෙනුවෙන් මූල්‍ය සහාය ලබාදීම සහ නියාමනය කිරීම.

(ඇ) ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් වූ අනෙකුත් ආයතන හා සංවිධාන සමඟ සම්බන්ධීකරණ පැවැත්වීම හා උපදෙස් දීම.

(ඈ) ව්‍යසන කළමනාකරණයට අදාළව පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් පිළිබඳ දත්ත රැස්කර ගැනීම හා පවත්වාගෙන යාම.

(ඉ) මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ වාර්තා වරින් වර සභාවට ඉදිරිපත් කිරීම.

යථෝක්ත කාර්යයන් ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇතත් එම කාර්යයන් ඉටුකර ඇති බැව් සනාථ කෙරෙන තොරතුරු වාර්තා වී නොතිබුණි.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපැම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත නෙදර්ලන්ත ණය ආධාර යටතේ ලබාදී තිබුණු සුනාමි සංඥා කුළුණු සහ කැබ් රථ සඳහා ගණනය කරන ලද ක්ෂයවීම් අදාල ප්‍රදාන ගිණුම සමඟ සමාලෝචිත වර්ෂ තෙක් ගැලපීම් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ගැලපීම ප්‍රදාන ගිණුමේ සටහන් කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සුනාමි සංඥා කුළුණු සඳහා 2008 වර්ෂයේ සිට 2010 දක්වා වූ ක්ෂයවීම් වටිනාකම රු.103,487 ක් වැඩියෙන් ගිණුම්වල ගැලපීම් සිදු කර තිබුණි.

(ii) කැබ් රථ සඳහා 2009 සහ 2010 වර්ෂ 02 ක සඳහා වූ ක්ෂයවීම් වටිනාකම රු.29,151,159 ක් අඩුවෙන් ගිණුම් වල ගැලපීම් කර තිබුණි.

ඉහත තත්ත්වයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ කළමනාකරණ සන්නිවේදන ව්‍යාපාති ගිණුම සහ සමුච්චිත අතිරික්තය රු.29,047,672 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) නෙදර්ලන්ත ණය යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 57.3 ක් වටිනා සුනාමි සංඥා කුළුණු 2011 වර්ෂය තුළදී තෝරාගත් වෙරළබඩ ප්‍රදේශයේ ඉදිකර තිබුණද මෙම වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුම හා ණය ප්‍රදාන ගිණුම යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පරිගණක සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල හා ස්ථාවර වත්කම් ලේඛණයේ වටිනාකම අතරරු.1,366,423 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආපදා කළමනාකරණ සන්නිවේදන හා ප්‍රතිචාර ධාරිතා වර්ධන ව්‍යාපෘතිය(ICET) යටතේ 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ලබාදුන් ණය ආධාර උපකරණ වල වටිනාකම රු. 1,641,746,056 ක් වූ අතර ඒ යටතේ ගිණුම් ගත කර ඇති ස්ථාවර වත්කම්වල වටිනාකම රු.1,675,102,159 ක් විය. මෙම වෙනස වූ රු.33,356,103 හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිලිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| කළමනාකරණ සන්නිවේදන ව්‍යාපෘතිය | | ව්‍යාපෘති ගිවිසුම, ව්‍යාපෘති වටිනාකම |
| i. ණය ආයෝජන | | |
| භාණ්ඩාගාරය | 616,515,611 | |
| විදේශ ආධාර | 701,378,183 | |
| ii. කෙරගෙන යන වැඩ ණය ආයෝජන | | කෙරගෙන යන වැඩ වල එක් එක් කාර්යයන්හි වටිනාකම |
| භාණ්ඩාගාරය | 44,259,006 | භාණ්ඩාගාරය |
| විදේශාධාර | 279,593,255 | විදේශාධාර |

### 2.2.4 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 110 | ආයතනයේ සිදුවන අලාභ හානි සම්බන්ධයෙන් වෙනම ලේඛණයක් පවත්වාගෙන යායුතු වුවත් එවැනි ලේඛණයක් සකස් කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුලදී වාහන 02කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් අලාභ ලේඛණයක සටහන් කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 371(2) | ලබාගන්නා ලද අත්තිකාරම් මුදල් කාර්ය නිමකල විගසම මධ්‍යස්ථානය වෙත පියවිය යුතු වුවත් මධ්‍යස්ථානය විසින් පවත්වා ගෙන ගිය ලේඛණ වලට අනුව අවස්ථා 22 කදී එකතුව රු.598,732 ක් වූ අත්තිකාරම් මුදල් මාස 01 සිට මාස 11 දක්වා වූ කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි. |
| (iii) මු.රෙ. 371(5) | අත්තිකාරම් ලෙස ලබාදුන් සියලු මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද ප්‍රවර්තන වර්ෂය අවසානයට එසේ නිරවුල් නොකළ අත්තිකාරම් මුදල් ශේෂය රු.3,063,376 ක් වී තිබුණි. |
| (iv) මු.රෙ. 395(ආ) සහ (ඇ) | සැම මාසයක් අවසානයේදීම පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර සකස් කර පරීක්ෂා කිරීම සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, මධ්‍යස්ථානය විසින් 2011 වර්ෂයටම අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) මු.රෙ. 1646 | වාහනවල දෛනික ධාවන සටහන්පත් සහ මාසික කාර්ය සාධන සාරාංශ සැම මාසයක් වෙනුවෙන්ම ඊට පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද මධ්‍යස්ථානය සතුව වාහන 29 කින් ධාවන සටහන් පත් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ වාහන 03 කට අදාලව පමණි. |

| | |
|---|---|
| (vi) මු.රෙ. 1647(ආ) | ආයතනය සතුව ඇති වාහන 29 ක් සම්බන්ධයෙන් ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, ආයතනය සතුව ඇති වාහන 29 හිම ඉන්ධන දැවීම සමාලෝචිත වර්ෂයේදී එක්වරක් වත් පරීක්ෂා කර නොතිබුණි. |

## 03. මුල්‍ය සමාලෝචනය

### 3.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවලින් රු.12,999,883 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.52,450,498 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී රු.39,450,615 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මුල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ ආදායම රු.මිලියන 65 කින් වැඩිවී තිබීමයි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### අ. ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීමේ අරමුණින් ආපදා පවතින දිස්ත්‍රික්ක හඳුනාගෙන තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් වන වියදම් දැරීම සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය පහත සඳහන් පරිදි රු.මිලියන 190 ක් වූ අතර ඉන් රු.මිලියන 146.4 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද මුළු වියදම රු.මිලියන 148.3 ක් වී තිබුණු අතර පසුගිය වර්ෂයේ ඉතිරි වූ මුදල්ද මෙම වර්ෂයේ වියදම් සඳහා යොදා ගෙන තිබුණි.

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මිලියන) | ලැබුණු මුදල (රු.මිලියන) | වියදම (රු.මිලියන) |
| --- | --- | --- | --- |
| i. ව්‍යාපෘති 47 සඳහා | 120 | 110 | 111.9 |
| ii. අම්පාර, පුත්තලම, මඩකලපුව හා පොලොන්නරු දිස්ත්‍රික්ක සඳහා | 30 | 30 | 30 |
| iii. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ , | | | |
| (අ) නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා (නුවර, මාතලේ, බදුල්ල සහ නුවරඑළිය) | 30 | - | - |
| (ආ) නායයෑම් පිළිබඳ විශේෂ අධ්‍යයනයන් සඳහා | 10 | 6.74 | 6.4 |
| | 190 | 146.74 | 148.3 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘති 04 ක් සඳහා රු.12,340,985 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර රු.5,839,000 ක් එම ව්‍යාපෘති සඳහා ලබාදී තිබුණි. කෙසේවුවද එම ව්‍යාපෘති වර්ෂය තුලදී ක්‍රියාත්මක නොවීම නිසා එම මුදල් ආපසු මධ්‍යස්ථානය වෙත ලබාදී තිබුණි.

(ආ) මාතර දිස්ත්‍රික්කයේ පික්වැල්ල නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.5,350,000 ක් ප්‍රතිපාදන වලින් රු.1,500,000 ක මුදලක් වර්ෂය තුලදී ලබාදී තිබුණු අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර වෙනත් ව්‍යාපෘති සඳහා එම මුදල් යොදවා තිබුණි.

(ඇ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගංවතුර අවම කිරීම සඳහා වූ ඇස්තමේන්තු වටිනාකම රු.95,909,005 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කරන ලද රු.3,500,000 ක මුදල සම්පූර්ණයෙන්ම වර්ෂය තුල වැය කර තිබුණි. එම වියදම කෙරිගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට එම ව්‍යාපෘතිය නිමවූ ලෙස සලකා ගිණුම් ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

ආ. අවදානම් තත්ත්වයන් පිළිබඳ ව්‍යුහයන් සැකසීමේ ව්‍යාපෘතිය

නායයෑම්, ගංවතුර, සුළි සුළං සහ වෙරළබඩ උවදුරු හා නියඟය යනාදී මූලික උවදුරු සඳහා අවදානම් තත්ත්වයන් පිළිබඳ ව්‍යුහයක් සැකසීමට පහත සඳහන් ආයතන සඳහා මධ්‍යස්ථානය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය හා තාක්ෂණ දායකත්වය ලබාදී තිබුණි.

| | කාර්යභාරය | ආයතනය | මූල්‍ය හා තාක්ෂණ ආධාර වටිනාකම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | ---------------- | ------------ | ----------------- | --------- |
| | | | (රු.) | |
| i. | නායයෑම් උවදුර සිතියම්ගත කිරීම | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 1,565,275 | ගාල්ල සහ නුවරඑළිය සිතියම් 23 ක් අවසන් කර තිබුණි. |
| ii. | ගංවතුර උවදුර සිතියම්ගත කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | ඉටුකර නැත. |
| iii. | සුළි සුළං උවදුර සිතියම්ගත කිරීම | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 481,400 | ඉටුකර නැත. |
| iv. | වෙරළබඩ උවදුර සිතියම්ගත කිරීම | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 635,220 | ඉටුකර නැත. |
| v. | නියඟ උවදුර සිතියම්ගත කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 4,177,854 | වර්ෂය තුලදී සම්පූර්ණ කර තිබුණි. |

ඇ. පෙර සූදානම් සැලසුම් කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදාවන්ට මුහුණදීමේ සැලසුම් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහාය වීමට සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මධ්‍යස්ථානය වෙත රු.මිලියන 3 ක් පෙර සූදානම් සැලසුම් සැකසීමට සහ පුහුණු වැඩමුළු පැවැත්වීමට භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ රු.3,170,354 ක මුදලක් අත්තිකාරම් ලෙස වියදම් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය තුලදී මුද්‍රණය කල යුතු ජාතික ප්‍රතිපත්ති පොත් පිටපත් සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණු අතර ඒ සඳහා රු.100,000 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී ජාතික ප්‍රතිපත්ති පොත් කිසිවක් මුද්‍රණය කර නොතිබුණි.

ii. මුලතිව් කිලිනොච්චි සහ වවුනියා දිස්ත්‍රික්ක තුනෙහි දිස්ත්‍රික් මූලික සැලසුම් වැඩමුළු පැවැත්වීමට රු.100,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මූලික වැඩමුළුවක් පවත්වා ඒ සඳහා රු.30,350 ක් වැය කර තිබුණි. මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක 02 හි වැඩමුළු පවත්වා නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික්ක 16 ක පෙර සූදානම් සැලසුම් නිමකර තිබුණ අතර දිස්ත්‍රික්ක 09 ක අවසාන සැලසුම් සකස් කල යුතුව තිබුණි.

ඇ. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

මෙම මෙහෙයුම් මධ්‍යස්ථානය 2006 ස්ථාපිත කර තිබූ අතර සතියේ දින 07 තුල පැය 24 පුරා ක්‍රියාත්මකව පවතී. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් සිදුවිය හැකි ස්වාභාවික ව්‍යසන පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු අදාල තාක්ෂණ ආයතන වෙතින් ලබාගෙන එම තොරතුරු ඇගයීමට ලක්කර ඒවා අදාල පාර්ශව වෙත ලබාදී එම ව්‍යසන තත්ත්වය පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් කරනු ලබයි. මෙම හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා ආපදා කළමනාකරණ සන්නිවේදන හා ප්‍රතිචාර ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ ණය ආධාර යටතේ පහත සඳහන් උපකරණ ලැබී තිබුණි.

| | උපකරණ | වටිනාකම<br>රු. |
|---|---|---|
| i. | සුනාමි සංඥා කුළුණු | 263,698,519 |
| ii. | හදිසි ප්‍රතිචාර මෙහෙයුම් මැදිරිය | 96,022,782 |
| iii. | පරිගණක මෙහෙයුම් මැදිරිය | |

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය යටතේ ඇති හදිසි ප්‍රතිචාර දැක්වීමේ මැදිරිය (Call Management Centre) සැකසීමේ කටයුතු නිමකර තිබූ නමුත් ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම විගණන දිනය තෙක්ම සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කාර්යාල පැවැත්වීම

රට තුල පැවතිය හැකි හදිසි ව්‍යසනයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික්ක 25 ක් තුල ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කාර්යාල පවත්වාගෙන ගොස් තිබුණි.

දිස්ත්‍රික් මධ්‍යස්ථාන විසින් ඉදිරිපත් කළයුතු මාසික කාර්යසාධන විධිමත්ව ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයද පසු විපරම් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ සිට බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණු අතර, ඒ සඳහා රු.1,407,600 ක මුදලක් එම ආයතනයේ තැන්පත් කර තිබුණි. කෙසේවුවද, 2011 ජනවාරි මාසයේ සිට වෙනත් ගොඩනැගිල්ලකට මධ්‍යස්ථානය මාරුකර තිබුණු අතර, විගණන දිනය වූ සැප්තැම්බර් 30 දින දක්වාත් එම තැන්පත් මුදල ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වතුර බවුසර 02 ක් මිලට ගැනීම

---------------------------------

ව්‍යසන ප්‍රතිචාර නභා සිටුවීම සඳහා 2011 දෙසැම්බර් 31 දිනට රු.28,507,482 ක් වටිනා වත්කම් මිලට ගත් බව ගිණුම්වලින් දැක්වුවද එහි සඳහන් රු.9,820,000 ක් වටිනා වතුර බවුසර 02 ක එම වර්ෂය තුළදී මිලදී ගෙන නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට 2011 මැයි 20 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. පහත සඳහන් තනතුරු සඳහා විගණන දිනය තෙක්ම නිලධාරීන් බඳවා නොගැනීම නිසා එම තනතුරු පුරප්පාඩුව පැවතිණි.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
| --- | --- |
| අධ්‍යක්ෂ (මෙහෙයුම්) | 01 |
| අධ්‍යක්ෂ (පර්යේෂණ සහ හානි අවම කිරීම) | 01 |
| අධ්‍යක්ෂ (මානව සම්පත් හා මුදල්) | 01 |
| පුද්ගලික සහකාර | 01 |
| සන්නිවේදන තාක්ෂණ ශිල්පී | 03 |
| ගුවන් විදුලි පණිවුඩ ක්‍රියාකරු | 01 |
| නිශ්චල හා වීඩියෝ ඡායාරූපශිල්පී | 01 |

## 4.4 වාහන උපයෝජනය

---------------------

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ දිස්ත්‍රික් කාර්යාල 27 ක රාජකාරි කටයුතු සඳහා ඩබල් කැබ් රථ 27 ක් සහ වෑන් රථ 02 ක් ආපදා කළමනාකරණ සන්නිවේදන හා ප්‍රතිචාර ධාරිතා වර්ධන ව්‍යාපෘතිය ( ICET ) යටතේ 2009 සහ 2010 වර්ෂ වලදී ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේදී වාහන 29 ක මුළු වටිනාකම රු.238,528,107 ක් වූ අතර මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් ලේඛණයට එම වාහන ඇතුලත් කර ඇතත්, මෙම වාහන වල අයිතිය මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. ඉහත ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ණය ආධාර වශයෙන් රු.මිලියන 19.5 ක් වටිනාකමැති ටොයෝටා ලෑන්ඩ් ක්‍රෑෂර් ජිප් රථය 2010 වර්ෂය තුළදී මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු නමුත් විගණන දිනය වූ 2012 ජුනි 15 දක්වාම මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. කෙසේවුවද මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් යටතට එම වාහනය ඇතුලත් කරගෙන තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක් තුල තොග නැතිවීම් වෙනුවෙන් වූ පාඩුව වෙනුවෙන් රු.206,011 ක වෙන්කිරීමක් සිදුකර තිබුණු නමුත්, එම පාඩුවට වගකිව යුතු පර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත්ව ගිණුම් පොත්වලින් කපා හැරීමට මධ්‍යස්ථානය කටයුතු කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පෙර සූදානම් සැලසුම් සකස් කිරීම
(ආ) කෙරීගෙන යන වැඩ
(ඇ) වාහන උපයෝජනය
(ඇ) ආපදා අවමකිරීමේ ව්‍යාපෘතිය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

විගණකාධිපති,
විගනකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

**<u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්ථාව</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2012 ඔක්තෝම්බර් 17 දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාල කරුණු දැක්වීම පහත පරිදි වේ.

## 1.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ එහි කාර්යයන්

(අ) ජාතික ව්‍යවසන කළමනාකරණ සැලැස්ම මේවන විට කෙටුම්පත් කර ඇත. මෙහි සියලු කටයුතු මෙම වසර අවසන් වීමට පෙර අවසන් කිරීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දනුම් දෙමි.
ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම සැකසීම මේවන විට UNDP සහාය ඇතිව අවසන් අධියර තෙක් සකසා ඇත. මෙය ආපදා සඳහා සම්බන්ධීකරණය සිදුකරණ රාජ්‍ය ආයතන 23 ක සහභාගීත්වයෙන් සිදුකරනු ලබන බැවින් මේ සඳහා ප්‍රමාණවත් කාලයක් ගතවන අතර මෙය කඩිනමින් සිදුකරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇතිබව කාරුණිකව දනුම් දෙමි.

(ආ) ව්‍යවසන කළමනාකරණ සැලැස්මට අනුව හදිසි අවස්තාවලදී වගකීම් භාරගෙන ක්‍රියාකිරීම සඳහා වූ සම්මත ක්‍රියාකාරී සැලසුම් (Standard Operating Procedures) සකසා ඇත. එබැවින් හදිසි ආපදා අවස්ථාවක් ඇතිවූ විටදී කවුරු කුමන ආකාරයකින් කෙසේ කටයුතු කලයුතුද යන්න පැහැදිලිව එහි සඳහන් කොට ඇත. එමගින් ඕනෑම හදිසි අවස්ථාවකදී මෙහෙයුම් වගකීමකින් යුතුව ක්‍රියා කිරීමේ හැකියාව සහ සම්බන්ධීකරණය කිරීමේ හැකියාව මනාව ඇතිබව කාරුණිකව දනුම් දෙමි.

(ඇ) මේ වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හඳුනාගත් ආයතන සඳහා එම ආයතන වල ජාතික මට්ටමේ ආයතන සමග සම්බන්ධ වෙමින් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම සිදු කරයි. මේ වන විට රෝහල්, පාසල්, ප්‍රධාන හෝටල්, ආගමික ස්ථාන යන ආයතන සඳහා හදිසි මෙහෙයුම් සැලසුම් සකස්කිරීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දනුම් දෙමි.

(ඈ) අනෙකුත් ආයතනවල ව්‍යවසන කළමනාකරණ සැලසුම් සිදුකරගෙන යාම සඳහා මේ වනවිට පුහුණු, දැනුවත්කිරීම්, සාකච්ඡා, වැඩමුලු හා අනෙකුත් උපදේශන කටයුතු සිදුකරමින් පැවතියද මේ වන විට මූල්‍ය සහාය ලබාදීමට නොහැකි වී ඇති අතර ඉදිරි කාලයේදී මේ සඳහා මූල්‍ය සහාය ලබාදීමට හා නියාමන කටයුතු කිරීමට කටයුතු කරනු ඇත. මීට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වූ ව්‍යවසන කළමනාකරණ සැලසුම් සකස් කරමින් හා මූල්‍ය සහාය ලබාදෙමින් සිටින බව කාරුණිකව දනුම් දෙමි.

(ඉ) ව්‍යවසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හදිසි මෙහෙයුම් කමිටුවක් පත් කරමින් ඒ සඳහා වූ නියෝජිතයන් සමග සාකච්ඡා සිදුකරමින් ව්‍යවසන කළමනාකරණය සඳහා වූ සම්බන්ධීකරණය ඉතාමත් සාර්ථකව සිදුකරන අතර ඊට සමගාමීව

NDMCC කමිටුවක් සෑම මාසයකදීම පවත්වා අවශ්‍ය උපදෙස් හා සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් සිටින බව කාරුණිකව දනුම් දෙමි.
තවද දිස්ත්‍රික් මට්ටමේ දිස්ත්‍රික් ව්‍යවසන කළමනාකරණ කමිටු දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඒ හරහාද ඉහත කී කටයුතු දිස්ත්‍රික් මට්ටමින් සිදුකරමින් සිටිනබවද කාරුණිකව දනුම් දෙමි.

(ඊ) මේ වනවිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් ව්‍යවසන කළමනාකරණයට අදාලව දිනපතා දත්ත යොමුකිරීම සිදුකරන අතර දනට වසර 30 කට වැඩි කාලයකට අදාල දත්ත ප්‍රමාණයක් රැස්කර තිබෙන අතර මෙම දත්ත Disinventa නම් වූ දත්ත ගබඩාවක ඇතුලත් කර ඇත. මෙම දත්ත අන්තර් ජාලය ඔස්සේ මහජනතාවට ආයතනික දත්ත ගබඩාව (Web Site) ඔස්සේ අවශ්‍ය ඕනෑම ආකාරයට ලබා ගැනීමට අවස්තාව සලසා ඇති බව කාරුණිකව දනුම් දෙමි.

(උ) වාර්ෂික වාර්තා, සංයුක්ත සැලසුම, ක්‍රියාකාරී සැලසුම ඇතුලු අදාල සියලු වාර්තා නිසි කලට නිසි පරිදි අන්තර් කළමනාකරණ මණ්ඩල සැසිය (IMC) වෙත හා අදාල අනෙකුත් පාර්ෂව වෙත වාර්තා කරඇති බවත් ඉදිරියේදීත් එසේ සිදුකරන බවටත් කාරුණිකව දැනුම් දෙමි.

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ)
i. එකඟවෙමි.
2008 සහ 2009 යන වසර දෙක සදහා ක්ෂයවීම් ගණනය නොකර ක්‍රමක්ෂය කිරීම පමණක් එම වසර දෙක සදහා සිදුකර ඇත.මෙය 2012 වසරේදී නිවැරදි කිරීමට කටයුතුකර ඇත.

ii. එකඟවෙමි.
2008 සහ 2009 යන වසර දෙක සදහා ක්ෂයවීම් ගණනය කර තිබෙන අතර අදාල ණය ආයෝජන සමග ක්‍රමක්ෂය කිරීම එම වසර දෙක සදහා සිදුකර නොමැත.මෙය 2012 වසරේදී නිවැරදි කිරීමට කටයුතුකර ඇත.

(ආ) එකඟවෙමි.
අදාල ගිණුම්කරන ප්‍රමිතයන්ට අනුකූලව කටයුතුකිරීමට ඇති හැකියාව සොයාබලා ඒ සදහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකිරීමට එකගවෙමි.

(ඇ) එකඟවෙමි.
අදාල නිවැරදි කිරීම් සියල්ල 2012 වසරේදී සිදුකර ඇත.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අදාල තොරතුරු ලබාදීමේ හැකියාව පිළිබදව සොයාබලා ඉදිරියේදී කටයුතු කිරීමට එකඟවෙමි.

**2.2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරන තීරණවලට අනුකූල නොවීම**

(අ) මුදල් රෙගුලාසි

i. මු.රෙ. 110

මු.රෙ.110 අනුව අලාභය පිළිබඳ වෙනම ලේඛනයක් 2011 වර්ෂය තුළ පවත්වාගෙන ගොස් නොමැති අතර එය 2012 වර්ෂයේ සිට පවත්වාගෙන යෑමට පරිපාල නිලධාරී එස්. එන්.හේවගේ මහතාට පවරා ඇත.

ii. මු.රෙ. 371 (2)

එකඟවෙමි.

අදාල මුදල් රෙගුලාසි පිළිබඳ ආයතනයේ නිළධාරීන්ගේ අවධානය යොමුකිරීමට කටයුතු කරන අතර ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

ii මු.රෙ. 371 (5)

එකඟවෙමි.

අදාල මුදල් රෙගුලාසි පිළිබඳ ආයතනයේ නිළධාරීන් දැනුවත්කිරීමට කටයුතු කරන අතර ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

iv. මු.රෙ. 395 (ආ) සහ (ඇ)

2012 වසරේ සිට අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි.

v. මු.රෙ. 396

2012.03.12 ඔබගේ සමාංක එන්/බී/ඩීඑම්සී/වී13/2011 තොරතුරු කැඳවීම් ලිපියට අදාලව අප විසින් 2012.03.15 දාතමින් යුතුව යොමුකරන ලද ලිපිය මගින් මේ පිළිබඳව කරුණු දක්වා ඇත.

vi මු.රෙ. 1646

2011 වර්ෂය තුළදී මෙම අඩුපාඩුව පැවතියද සියළුම වාහනවල දෛනික ධාවන සටහන් පොත් 2012 වර්ෂයේ සිට නියමිත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

vii මු.රෙ. 1647 (ආ)

එකඟවෙමි.

අදාල මුදල් රෙගුලාසි පිළිබඳ ආයතනයේ නිළධාරීන් දැනුවත්කිරීමට කටයුතු කරන අතර ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

(ආ)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු සියළුම වාහනවල ඉන්ධන තුලන පරීක්ෂණය පවත්වන ලෙස 2012.10.23 දින දැනුම් දී ඇති අතර ඒ අනුව එම පරීක්ෂණ 2012 ඔක්තෝබර් මාසයේදී සිදු කිරීමට කටයුතු කර ඇත.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

එකඟවෙමි.
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ලෙස පෙන්නුම් කරනු ලබන රු.39,450,614. ඇතුලත රු:32,282,959. ක පෙර වසරවලට අදාල ප්‍රාග්ධන පැවරුම් ක්‍රමක්ෂය තිබේ. වෙනත් ආදායම් වල මෙම මුදල ඇතුලත් වේ.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

අ. ආපදා අවම කිරීමේ ව්‍යාපෘති

අම්පාර, පුත්තලම, මඩකලපුව හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය 2009 වර්ෂයේ ආරම්භ කරන ලද අතර එම ව්‍යාපෘතිය සඳහා පසුගිය වසරේදී (2010) ලබාදී තිබූ එම වසරේ වැය නොකළ මුදල් මිලියන 2.0 පමණ 2011 වසරේ වියදම් ලෙස පෙන්වා ඇත. එම ව්‍යාපෘති අවිච්ඡේද ව්‍යාපෘතියක් වූ බැවින් මෙලෙස දක්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

අ) නිවැරදිය. මෙම මුදල් මධ්‍යස්ථානය වෙත ලබා ගෙන එම මුදල් ආපදා අවම කිරීම සඳහා යෝජිතව තිබූ ප්‍රතිපාදන හිඟය මත ක්‍රියාත්මක කළ නොහැකි වූ ව්‍යාපෘතින් සඳහා යොදවා එම ව්‍යාපෘතින් නිම කොට ඇත.

ආ) නිවැරදිය. පීක්වැල්ල නායයෑම අවම කිරීමේ ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට එකඟ වීම නිසා දික්වැල්ල වැසි ජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල් යොදවා ඇත.

ඇ) මෙහිදී දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම හේතු කොට ගෙන එම ව්‍යාපෘති ප්‍රතිපාදන 2012 වර්ෂය සඳහා වෙන්කරගෙන ක්‍රියාත්මක කිරීමට එකඟ වූ අතර එතෙක් එම ප්‍රදේශය හදිසි ගංවතුර තත්ත්වයෙන් යටවීම වළක්වා ගැනීම සඳහා එම ව්‍යාපෘතියේ මූලික කොටස ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අවසරය මත ක්‍රියාත්මක කළ අතර මුළු ව්‍යාපෘතිය සඳහා ඒ වනවිට අනුමැතිය ලැබී නොතිබීම නිසා එම කොටස වෙනම ව්‍යාපෘතියක් ලෙස දක්වා 2011 වසරේ අවසන් බවට වාර්තා කර ඇත.

ආ. අවදානම් තත්ත්වයන් පිළිබඳ ව්‍යුහයන් සැකසීමේ ව්‍යාපෘතිය

අවදානම් තත්ත්වයන් පිළිබඳ ව්‍යුහයන් සැකසීමේ ව්‍යාපෘතියේ නිරීක්ෂණයන් නිවැරදිය.

ඇ. පෙරසූදානම් සැලසුම් කිරීම

i.ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මුද්‍රණය කිරීම සඳහා 2011 වාර්ෂික වැඩ සැලැස්මට අනුව මුදල් වෙන් කර තිබුණද එය නැවත පසුගිය වසර අගදී අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධනය කිරීමට උපදෙස් දී තිබූ නිසා ජාතික ප්‍රතිපත්තිය මුද්‍රණය කිරීමේ කටයුතු 2011 වසර තුලදී සිදු නොකරන ලදී.

ii. මුලතිව් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක අතරින් කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා රාජ්‍ය නොවන සංවිධානයක් වන Oxfam සංවිධානය මගින් සිදු කරන ව්‍යාපෘතියක් මගින් එම දිස්ත්‍රික්කයේ ආපදා කලමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් වෙන් කර තිබිණි. එබැවින් එසේ වෙන් කර ඇති මුදල් වලින් කිලිනොච්චි දිස්ත්‍රික් ආපදා කලමනාකරණ මූලික වැඩමුළුව පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගන්නා ලෙස අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව අදාල වැඩමුළුව සඳහා ආපදා කළමනාකරණ වැය ශීර්ෂය යටතේ මුදල් ලබා දීමක් සිදු නොකරන ලද නමුත් වෙනත් ප්‍රතිපාදන යටතේ එම වැඩමුළුව පවත්වන ලදී. මුලතිව් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක වරයෙකු පත් කර නොතිබූ බැවින් වැඩමුළුව පැවැත්වීමට අවශ්‍ය සංවිධාන කටයුතු සිදු කිරීමේ ඇති අපහසුතාවය හේතුවෙන් එම වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය.

iii. මේ වන විට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් දිස්ත්‍රික්ක 16ක සම්පූර්ණ කර ඇත. මීට අමතරව මොණරාගල දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ සැලසුම රාජ්‍ය නොවන සංවිධානයක ආධාර ඇතිව පිටපත් කිහිපයක් මුද්‍රණය කර ඇති අතර තවත් පිටපත් ප්‍රමාණයක් මුද්‍රණය කිරීම හා එම මුද්‍රිත පිටපත් අවශ්‍ය ආයතනවලට බෙදා හැරීමටත් ඇත. එම කටයුතු සියල්ල කඩිනමින් සිදුකිරීමට කටයුතු යොදා ඇතිබව කාරුණිකව දැනුම් දෙමි.
මඩකළපුව දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ සැලසුම 2012 වසරේදී සංශෝධනයට ලක්කොට පිළියෙල කර ඇති අතර එම සැලැස්ම JAICA ආධාර යටතේ මුද්‍රණය කරීමට ඇත. එම කටයුතු සියල්ල කඩිනමින් සිදුකිරීමට කටයුතු යොදා ඇතිබව කාරුණිකව දැනුම් දෙමි.
යාපනය , ත්‍රිකුණාමලය, අම්පාර යන දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ සැලසුම්වල අවසන් කෙටුම්පත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකර ඇති අතර නිවැරදි කිරීමෙන් අනතුරුව මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරනු ඇත.
කිළිනොච්චි, මන්නාරම,වවුනියා,මුලතිවු යන දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ සැලසුම් සකස් කරමින් පවතින අතර මේ වන විට එම කටයුතුවල 75% ක ප්‍රගතියක් වාර්තා වී ඇතිබව කාරුණිකව දැනුම් දෙමි.

iv. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේදී දිස්ත්‍රික්කයට අදාල විශාල තොරතුරු ප්‍රමාණයක් සෙවීම හා එක්රැස් කිරීම සිදුකරන අතර එම තොරතුරු ලබාගැනීම විද්‍යානුකූල ක්‍රමවේදයකට කළයුතුවන බැවින් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් වැයවේ. මීට අමතරව දැනට සකස්කරන ලද සැලසුම් එම සැලසුම්වල වගකීම් දරණ ආයතන වලට ලබාදී ඇති අතර එම ආයතන එම සැලැස්මට අනුව තම ආයතනයේ වගකීම් හා වගවීම් පෙළගස්වමින් ආයතනයට අදාලව SOP නිර්මාණය කර ඇති අතර දැනට මෙම සැලැස්ම සක්‍රීය සැලැස්මක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි.

ඇ. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

එකඟවෙමි.

හදිසි සන්නිවේදන හුවමාරු දැන්වීමෙ මැදිරිය මේ දක්වා ක්‍රියාත්මක නොවීමට පහත සඳහන් කරුණු හේතු විය.

2011 අප්‍රේල් 02 වන දින විද්‍යා මාවතේ පිහිටි නව මධ්‍යස්ථානය විවෘත කරනවාත් සමගින් හදිසි ඇමතුම් මැදිරියද නැවත ප්‍රතිව්‍යුහ ගත කොට ස්ථාපිත කරනු ලැබීය. එහිදී හදිසි ඇමතුම් ප්‍රතිචාර මැදිරියට ඒ වන විට අනුමත වී සිටි 09 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලය පැය 24×7 මැදිරිය ක්‍රියාත්මක කිරීම සිදු කල නොහැකි බැවින් ඒ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා 2012.06.15 දින DMC/02/03/09(1) ලිපිය මගින් ඉල්ලා ඇති අතර ඒ සඳහා 21 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් සඳහා 2012.08.28 දින DMC/E4/55/4/243 ලිපිය මගින් අනුමැතිය දී ඇත. තවද අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා මේ වන විට සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත. හදිසි මෙහෙයුම් ප්‍රතිචාර මැදිරිය 25 දෙනෙකුට එකවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් මේ වන විටත් මූලික සැලසුමට අනුව සකසා ඇත. මේ වන විට හදිසි මෙහෙයුම් ප්‍රතිචාර මැදිරියේ දත්ත යාවත්කාලීන කිරීම ඉන්දියානු සමාගමක් විසින් සිදු කරනු ලබමින් සිටී. එලෙසම ඒ සඳහා ශ්‍රී ලංකාවේ සියලු දුරකථන නාමාවලි හා සිතියම් දත්තයන් ඇතුලත් කිරීමට ඇති හෙයින් එයටද වැඩි කාලයක් ගතවන බව ඔවුන් පවසයි. මේ සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් අවශ්‍ය පුහුණුව ලබා දී ඉතා ඉක්මනින් ක්‍රියාත්මක තත්වයට පත්කිරීමට නියමිතය.

ඉ. <u>ආපදා කළමනාකරණ සන්නිවේදන හා ප්‍රතිචාර ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (ICET ව්‍යාපෘතිය)</u>

2012.07.05 දින පැවති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණයක්මත 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය නැවත සංශෝධනය කිරීමට සිදු විය. ඒ අනුව 2012.08.20 දින ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයේ මෙම විමසුමේ සඳහන් වෙනස වන රු.33,356,103 වටිනාකම නිවැරදි කර ඇත.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අ)

i. දිවයිනේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 17 ක සිවිල් නිලධාරීන්, සහකාර අධ්‍යක්ෂවරුන් ලෙස සේවයෙහි යොදවා ඇති අතර කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට , පුත්තලම හා රත්නපුර යන දිස්ත්‍රික්කවල (දිස්ත්‍රික්ක 07 ක) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිලධාරීන් සහකාර අධ්‍යක්ෂවරුන් ලෙස පත්කර ඇත.මීට අමතරව මහනුවර දිස්ත්‍රික් ඒකකයේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) තනතුර එම ඒකකයේ සිටි සහකාර අධ්‍යක්ෂවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ නඩුවක් හේතුවෙන් පුරප්පාඩුව පවත්වාගෙන යන ලදී. කෙසේ වුවද මේ වන විට මේ පුරප්පාඩුව සම්පූර්ණ කර ඇත.

ii. මේ වනවිට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල සහකාර අධ්‍යක්ෂවරුන් වෙත ලිඛිතව හා මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී වාචිකවද කාර්යසාධන වාර්ථා සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2012 ඔක්තෝම්බර් මාසය වන විට 95% ක පමණ දිස්ත්‍රික්ක වලින් නිසිකලට කාර්යසාධන වාර්ථා ලැබී ඇති බව කාරුණිකව දනුම් දෙමි.

ආ)

2012 වසරේ ඔක්තොම්බර් මස 02 දින අප විසින් ලිපියක් මගින් අධ්‍යක්ෂ ජනරාල් BMICH වෙත අදාල තැන්පතු මුදල නිදහස් කරදෙන ලෙස ඉල්ලා දැනුම් දෙන ලදී.ඒ අනුව 2011 ජනවාරි සහ 2011 පෙබරවාරි මාසයේ කොටසක් සඳහා කාර්යාල පරිශ්‍රය ලබාගැනීම වෙනුවෙන් අප විසින් ගෙවිය යුතු ගාස්තුව වන රු. 1,281,807.07 ක මුදල අඩුකර ඉතිරි මුදල වන රු. 125,792.93 ක් ලබා දීමට කටයුතුකරන බව දන්වන ලදී. නමුත් BMICH වෙත ගෙවිය යුතු මුදල ප්‍රමාද දෝෂයකින් ගිණුම් ගතවී නොමැති අතර තැන්පත් මුදල වන රු.1,407,600.00 පමණක් ගිණුම් ගතකර ඇත. මෙය 2012 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දනුම් දෙමි.

(ඇ)

අදාල වතුර බවුසර් දෙක 2012 වසරේදී අදාල ආයතනය (DIMO) මගින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ලබා දී තිබූ නමුත් නියමිත ප්‍රමිතියෙන් තොරවීම නිසා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව නියමිත ප්‍රමිතියෙන් යුතු බවුසර් දෙකක් නැවත 2012 ඔක්තොම්බර් මස 08 වන දින අප ආයතනය වෙත ලබා දී ඇත.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

මේ යටතේ ඇබෑර්තුව පවතින බවට දන්වා ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අඛණ්ඩව අවස්ථා කිහිපයකදී ප්‍රසිද්ධ පුවත්පත් මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. මෙම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවුවද අදාළ තනතුරුවලට අවශ්‍ය වන මූලික සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සිටීම සහ මූලක සුදුසුකම් තිබූ අයදුම්කරුවන් වැඩි වැටුප් ඉල්ලුම්කර තිබීම සහ පවතින වැටුපට සහ වරප්‍රසාදවලට සේවයෙහි යෙදීමට අකමැත්ත ප්‍රකාශ කිරීම හේතුවෙන් මෙතෙක් අදාළ ඇබෑර්තු පිරවීමට නොහැකි වී ඇත.

## 4.4 වාහන උපයෝජනය

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නමින් ලියාපදිංචි කරන ලදුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි සඳහා ලබා දී ඇති මෙම වාහන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පවරා දෙන ලෙසට අමාත්‍ය ලේකම් වෙත අංක DMC/02/03/26 දරණ 2012.04.02 දිනැති ලිපිය සමඟ වාහන පැවරුමට අදාළ MTA 6 සහ MTA 8 ආකෘති පත්‍ර ද සම්පූර්ණ කර යොමුකරන ලදී.ඒ අනුව ඊට අදාළව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය විසින් එවා ඇති අංක MDM/AD/08 දරණ 2012.04.09 දිනැති ලිපියේ පිටපතක් දැන ගැනීම සඳහා ඇමුණුම 01 වශයෙන් මෙයට යාකර ඇත.

ii. විදේශ ණය ආධාර මගින් අප ආයතනයට ලැබී ඇති මෙම වාහනය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ගිනුම්කරණ ප්‍රමිත (SLAS – 24) අනුව කටයුතු කර ඇත. තවද මෙම වාහනය අධ්‍යක්ෂ ජෙනරාල් තුමාගේ අනුමැතියෙන් යුතුව 2010 .11.14 දින එවකට ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙත ලබා දී ඇත.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

එකඟවෙමි.

අදාල අලාභහානිය වෙනුවෙන් වගකිවයුතු නිළධාරියාගෙන් එම මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදුකර ඇත.ඒ අනුව දැනට මෙම නඩු විභාගය අත්තනගල්ල දිස්ත්‍රික් අධිකරණයේ විභාගවෙමින් පවතී.

## 05. පද්ධති හා පාලනයන්

(අ) (ආ) (ඇ) (ඈ) යටතේ යොමුකර ඇති කරුණු කෙරෙහි ඉදිරියේදී වඩා අවධානයෙන් යුතුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

මේජර් ජනරාල් ගාමිණී හෙට්ටිආරච්චි (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්